සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW** **2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්** **03 S I**

**(නව නිර්දේශය)**

2018.12.21 / 08.30 - 09.30

# (03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය

පැ එකයි

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ජාතිය, කුලය, ධනය වැනි කරුණු සලකමින් තමන් අනුන් හා මැන බලන මානයෙහි ප්‍රභේද තුනකි. ඉන් 'සෙය්‍යමාන' ලෙස දක්වන්නේ,
   (1) තමා අනුන් හා සමාන යැයි සිතීම ය.
   (2) තමා අනුන්ට වඩා උසස් යැයි සිතීම ය.
   (3) තමා අනුන්ට වඩා විශේෂ අයකු යැයි සිතීම ය.
   (4) තමා අනුන්ට වඩා පහත් යැයි සිතීම ය.

2. බුදුරජාණන් වහන්සේ අෂ්ටාංග සමුපේත බ්‍රහ්ම ස්වරයකින් යුතු වන සේක. එම අංග අතර 'විස්සට්ඨතා' යන්නෙන් විස්තර කරන්නේ,
   (1) අදහස වහා අවබෝධ වීම ය.
   (2) පිරිස කෙළවර සිටින අයට පවා හොඳින් ඇසීම ය.
   (3) ශබ්දය පහසුවෙන් මුවින් පිට වීම ය.
   (4) අතර බිඳීම් නැති බව ය.

3. බුදුරජාණන් වහන්සේ තුළ පැවති අෂ්ටවිද්‍යාඥානය පිළිබඳ සඳහන් වන සූත්‍ර ධර්මයක් වන්නේ,
   (1) බ්‍රහ්මජාල සූත්‍රයයි. (2) ආසිවිසෝපම සූත්‍රයයි.
   (3) අග්ගඤ්ඤ සූත්‍රයයි. (4) සාමඤ්ඤඵල සූත්‍රයයි.

4. බුදුරජාණන් වහන්සේ වෙතින් පඤ්හව්‍යාකරණ උපසම්පදාවෙන් උපසම්පදාව ලැබුයේ,
   (1) සෝපාක සාමණේරයන් වහන්සේ ය. (2) සුනීත සාමණේරයන් වහන්සේ ය.
   (3) රාහුල සාමණේරයන් වහන්සේ ය. (4) කුමාරකාශ්‍යප සාමණේරයන් වහන්සේ ය.

5. සම්බුද්ධ ශාසනයේ මහා ප්‍රඥාවන්ත මහරහතන් වහන්සේ අතර අග්‍රස්ථානයට පත්වූයේ,
   (1) මුගලන් මහරහතන් වහන්සේ ය. (2) සැරියුත් මහරහතන් වහන්සේ ය.
   (3) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ය. (4) ආනන්ද මහරහතන් වහන්සේ ය.

6. "සල්ලාලයන් ලක්ෂයක් පැමිණියත් මම මෙසේ ම ය. ලෝමයක් හෝ නො සොල්වමි. නො සැලෙමි. මාරය, තුබ තනිව මට කුමක් කරන්න ද?" යනුවෙන් මාර දිව්‍යපුත්‍රයාට පැවසූයේ,
   (1) ඛේමා තෙරණියයි. (2) උප්පලවණ්ණා තෙරණියයි.
   (3) ධම්මදින්නා තෙරණියයි. (4) භද්දකච්චානා තෙරණියයි.

[ 2 වැනි පිටුව බලන්න.

7. වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයන් වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ අතරට අයත් නොවන්නේ,

(1) මුනිගුණාලංකාරයයි. (2) සාරාර්ථ සංග්‍රහයයි.

(3) සද්ධර්මාලංකාරයයි. (4) අභිසම්බෝධි අලංකාරයයි.

8. බුදුරජාණන් වහන්සේ අදින්නාදාන පාරාජිකාපත්තිය පනවා වදාළේ කවුරුන්ගේ විනය විරෝධී ක්‍රියාවක් හේතුවෙන් ද?

(1) සුදින්න තෙරුන්ගේ (2) උදායි තෙරුන්ගේ

(3) ඡබ්බග්ගිය භික්ෂූන්ගේ (4) ධනිය තෙරුන්ගේ

9. බුද්ධ දේශනාව වර්ග කිරීමේ දී බුදුරදුන් විසින් ම ධර්මය නවාංගසත්ථුසාසනයට බෙදා දක්වන ලදී. මෙහි එන 'වෙය්‍යාකරණ' යන අංගයෙන් දක්වා ඇත්තේ,

(1) අභිධර්ම පිටකය හා ගාථා රහිත සූත්‍ර ය.

(2) ගාථා සහිත සූත්‍ර ය.

(3) ප්‍රශ්නෝත්තර ක්‍රමයෙන් දේශනා කළ සූත්‍ර ය.

(4) ආශ්චර්යවත් කරුණු සඳහන් සූත්‍ර ය.

10. සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් සතර අගති අනුපිළිවෙළට දැක්වෙන වරණය කුමක් ද?

(1) භය, මෝහය, ඡන්දය, ද්වේෂය

(2) මෝහය, ඡන්දය, ද්වේෂය, භය

(3) ඡන්දය, ද්වේෂය, භය, මෝහය

(4) ද්වේෂය, භය, මෝහය, ඡන්දය

11. සද්ධර්මයේ ආරක්ෂාව හා චිරපැවැත්ම සඳහා මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමට ඒ ඒ ධර්ම කොටස් භික්ෂු පරම්පරාවලට පවරන ලදී. ඒ අතර සංයුක්ත නිකාය පවරන ලද්දේ,

(1) මහාකාශ්‍යප තෙරුන් ඇසුරු ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ය.

(2) ආනන්ද තෙරුන් ඇසුරු ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ය.

(3) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ය.

(4) අනුරුද්ධ තෙරුන් ඇසුරු ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ය.

12. 'සීලවන්ත කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන ප්‍රඥාවන්තයා දිලිසෙන ගින්නක් මෙන් බබළයි.' මෙහි සඳහන් කල්‍යාණ මිත්‍රයන් ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.

(1) අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභාණී, අපායසහාය

(2) උපකාරක, සමානසුඛදුක්ඛ, අඤ්ඤදත්ථුහර, අපායසහාය

(3) අඤ්ඤදත්ථුහර, වචීපරම, අත්ථක්ඛායී, අනුකම්පක

(4) උපකාරක, සමානසුඛදුක්ඛ, අත්ථක්ඛායී, අනුකම්පක

13. විපාක දෙන කාල අනුව සතරාකාර කර්මය දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.

(1) උතුනියාම, බීජනියාම, කම්මනියාම, ධම්මනියාම

(2) දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය, අහෝසි

(3) ජනක, උපත්ථම්භක, උපපීළක, උපඝාතක

(4) ගරුක, ආසන්න, ආචිණ්ණ, කටත්තා

14. බුදුරජාණන් වහන්සේගේ රූප විලාසයෙහි දෙතිස් මහාපුරුෂ ලක්ෂණ අතර 'මුදුතලුනහත්ථපාදො' යන්නෙන් අදහස් කෙරෙන්නේ,

(1) කොමළොස් තරුණ අතුල් පතුල් ඇති බව ය.

(2) පොළොවෙහි මනාව පිහිටි පා ඇති බව ය.

(3) යටිපතුලෙහි චක්‍ර ලක්ෂණ ඇති බව ය.

(4) දැල් කවුළු වැනි අත් පා ඇති බව ය.

[ 3 වන පිටුව බලන්න.

15. 'ආර්යයන් වහන්සේට කරන පිදුම අන් සියලු දන් පරදන්නේ ය' යන අදහස දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පද පේළිය තෝරන්න.
   (1) අත්තාහවේ ජිතං සෙය්‍යෝ.......   (2) නෙව දෙවෝ න ගන්ධබ්බෝ........
   (3) මාසෙ මාසෙ සහස්සෙන.........   (4) යො ච වස්සසතං ජීවෙ.........

16. 'දුක්ඛාහි සාරම්භකථා' යන ගාථා පාදයෙහි දැක්වෙන 'සාරම්භකථා' යන්නෙන් කියැවෙන්නේ,
   (1) එකට එක කියා ගැනීම ය.   (2) එකිනෙකාට බැනගැනීම ය.
   (3) එකිනෙකාට සෝලාම් කීම ය.   (4) එකිනෙකාට පහර දීම ය.

17. නිවන් දකිනු කැමති අය විසින් හඳුනාගත යුතු සංස්කාර සහ ජීවයෙහි ස්වභාවය හා සම්බන්ධ සංඛත ධර්ම ලෙස හඳුන්වන්නේ,
   (1) හේතු ප්‍රත්‍යයෙන් තොරව හටගත් ධර්මයෝ ය.
   (2) හේතු ප්‍රත්‍යයන්ගේ එකතුවෙන් හටගත් ධර්මයෝ ය.
   (3) හේතු ප්‍රත්‍ය බෙදීමෙන් හටගත් ධර්මයෝ ය.
   (4) හේතු ප්‍රත්‍ය නැති කිරීමෙන් හටගත් ධර්මයෝ ය.

18. සතර සතිපට්ඨානය සම්පූර්ණ කරන යෝගාවචරයා තුළ පැවතිය යුතු වඩාත් ම යෝග්‍ය ලක්ෂණ තුන වන්නේ,
   (1) සීල, සමාධි, පඤ්ඤා ය.   (2) සුඛ, දුක්ඛ, උපේක්ඛා ය.
   (3) ආතාපී, සම්පජානෝ, සතිමා ය.   (4) සරාග, සදෝස, සමෝහ ය.

19. දෙයාකාර කර්ම විපාකයෙන් එකක් වන 'ප්‍රතිසන්ධි විපාක' යන්නෙන් අදහස් කෙරෙන්නේ,
   (1) උපන් පසු ජීවිතය පවත්වා ගැනීමට උපකාර වන කර්මයයි.
   (2) විපාක දෙමින් සැපය වැඩි කරන කර්මයයි.
   (3) කර්ම විපාක විඳීමට අවස්ථාවක් නො ලැබෙන කර්මයයි.
   (4) උපතක් ලබා දීමට සමත් කර්මයයි.

20. විපාක දෙන පිළිවෙළ අනුව සතරාකාර වූ කර්මයෙහි 'උපපීලක කර්මය' ලෙස හඳුන්වන්නේ,
   (1) කර්ම විපාක වැඩි කිරීමයි.   (2) කර්ම විපාක නැති කිරීමයි.
   (3) කර්මයට අනුව උපත ලබා දීමයි.   (4) කර්ම විපාක අඩු කිරීමයි.

21. අංග අටකින් යුක්ත ආර්ය මාර්ගයෙහි අනෙකුත් අංගවලට පෙරටුව ගමන් කරන්නේ,
   (1) සම්මා සමාධියයි.   (2) සම්මා සතියයි.
   (3) සම්මා දිට්ඨියයි.   (4) සම්මා ආජීවයයි.

22. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩමවා දෙවන පැනින් රජු ඇතුළු පිරිසට පළමුව දේශනා කළ චුල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් කියැවෙන්නේ,
   (1) දෙව්ලොව හා ප්‍රේත ලෝකය පිළිබඳ ඉගැන්වීම ය.
   (2) තෙරුවන, රහත්බව හා චතුරාර්ය සත්‍ය වැනි ඉගැන්වීම ය.
   (3) දියුණුවන්නන් හා පිරිහෙන්නන් පිළිබඳ ඉගැන්වීම ය.
   (4) සුව සේ විසීමට අවශ්‍ය සදාචාරයේ වැදගත්කම පිළිබඳ ඉගැන්වීම ය.

23. සිව්වැනි ධර්ම සංගීතියෙන් පසුව සැකසෙන මහායාන ධර්මයේ සූත්‍ර දහයට අයත් නොවන සූත්‍රයක් වන්නේ,
   (1) ලංකාවතාර සූත්‍රයයි.   (2) ලලිතවිස්තර සූත්‍රයයි.
   (3) සමාධිරාජ සූත්‍රයයි.   (4) නිම්බෙධිත සූත්‍රයයි.

[ 4 වැනි පිටුව බලන්න.

24. 'ආරපරෙ ආරපරෙ - චක්කවත්ති-සිරිං ලභෙ' යන කඨිනානිසංස දැක්වෙන ගාථා අර්ථයෙහි අදහස වන්නේ,
(1) 'කඨින දානය පූජා කිරීමෙන් සක්විති රජසම්පත් ලැබීමට හේතු වේ' යන්න ය.
(2) 'ඉඳිකටු පනරක් පාසා සක්විති රජ සම්පත් ලැබීමට හේතු වේ' යන්න ය.
(3) 'මල් පහන් කොඩි පූජා කිරීමෙන් සක්විති රජ සම්පත් ලැබේ' යන්න ය.
(4) 'කඨින චීවර පූජාව පරිවාර සම්පත් ලැබීමට හේතු වේ' යන්න ය.

25. සප්ත අපරිහානිය ධර්ම ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ දීඝනිකායේ,
(1) චක්කවත්ති සීහනාද සූත්‍රයයි.
(2) මහා පරිනිබ්බාන සූත්‍රයයි.
(3) සාමඤ්ඤඵල සූත්‍රයයි.
(4) බ්‍රහ්මජාල සූත්‍රයයි.

26. දිළිඳුකම ඇති සමාජයක වෙසෙන පුද්ගලයා දිළිඳුකම නිසා ම විවිධාකාර සමාජාපචාර රාශියක හිමිකරුවෙකු වෙයි. ඉන් සිදුවන්නේ පුද්ගලයා පමණක් නොව සමස්ත සමාජය ම අගාධයට යැමයි. මෙය හේතුඵලවාදීව විස්තර කර ඇත්තේ,
(1) මහාසීහනාද සූත්‍රයේ ය.
(2) පත්තකම්ම සූත්‍රයේ ය.
(3) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
(4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.

27. කාලාම සූත්‍රයේ සඳහන් යමක් පිළිගැනීමට එකම පදනම නොවිය යුතු කරුණු දහය අතුරින් 'මා භබ්බරූපතාය' යන්නෙහි අර්ථය දැක්වෙන වරණය තෝරන්න.
(1) න්‍යාය ධර්මයට ගැළපේ යැයි නොපිළිගන්න.
(2) පෙනෙන ආකාරයට නිවැරදි යැයි නොපිළිගන්න.
(3) මෙය තර්කානුකූල යැයි කියා නොපිළිගන්න.
(4) මෙය මෙසේ විය හැකි යැයි කියා නොපිළිගන්න.

28. දීඝනිකායේ සිගාලක සූත්‍රයෙහි සඳහන් සදිසා ආවරණයට අදාළ නිවැරදි සම්බන්ධතාව දැක්වෙන වරණය තෝරන්න.
(1) දකුණු දිශාව - අඹු දරු සම්බන්ධය
(2) බටහිර දිශාව - ගුරු සිසු සම්බන්ධය
(3) උතුරු දිශාව - ස්වාමි සේවක සම්බන්ධය
(4) නැගෙනහිර දිශාව - මව්පිය දූදරු සම්බන්ධය

29. අභිධර්මයේ රූප පරමාර්ථය තුළ අටවිසි රූප සමුද්දේශ අතර ලක්ඛණ රූප අනුපිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
(1) සන්තති, උපචය, අනිච්චතා, ජරතා
(2) උපචය, සන්තති, ජරතා, අනිච්චතා
(3) ජරතා, අනිච්චතා, සන්තති, උපචය
(4) අනිච්චතා, ජරතා, උපචය, සන්තති

30. "කුන්කල්හිම පැවති - සදරුන් සියල් ලොව ඇති" යන බුදුගුණඅලංකාර කවියෙන් ප්‍රකාශ වන්නේ බුදුරදුන්ගේ,
(1) අරහං බුදුගුණයයි.
(2) සම්මා සම්බුද්ධ බුදුගුණයයි.
(3) විජ්ජාචරණ බුදුගුණයයි.
(4) සුගත බුදුගුණයයි.

31. උපෝසථ කර්ම සිදුකිරීමට, පොහොය සීමාවට රැස්වූ භික්ෂූන් වහන්සේලා පළමුවෙන් සිදුකරන 'පුබ්බකිච්ච' අතරට අයත් නොවන්නේ,
(1) සංඝයාගේ කැමැත්ත ගැනීම ය.
(2) ආසන පැනවීම ය.
(3) සෘතුව ප්‍රකාශ කිරීම ය.
(4) භික්ෂුණීන්ට අවවාද ලබා දීම ය.

32. මෙලොව කුලපුත්‍රයෙකු කෙලෙස් නිවීමට හේතු වන, මැනවින් දුක් කෙළවර කිරීම පිණිස පවතින සංස්කාරයන්ගේ ඇතිවීම හා නැතිවීම පිළිබඳව උතුම් දැකීමෙන් යුක්ත වෙයි ද එය,
(1) සීල සම්පදාවයි.
(2) චාග සම්පදාවයි.
(3) පඤ්ඤා සම්පදාවයි.
(4) සද්ධා සම්පදාවයි.

[ 5 වැනි පිටුව බලන්න.

33. අභිධර්මයේ චෛතසික කාණ්ඩයට අයත් මනසිකාර චෛතසිකය අයත් වන්නේ,

(1) අකුසල චෛතසිකවලට ය.
(2) සෝභන සාධාරණ චෛතසිකවලට ය.
(3) සබ්බචිත්ත සාධාරණ චෛතසිකවලට ය.
(4) විරති චෛතසිකවලට ය.

34. සුදුසුකම් සපිරි සාමණේරයන් වහන්සේ නමක් උපසම්පදා භූමියට පත්කරනු ලබන්නේ සීමා මාලකයක විසිතමකට අධික උපසම්පදා භික්ෂූන් වහන්සේ හමුවේ සිදු කරන විනය කර්මයකිනි. එය හැඳින්වෙන්නේ,

(1) අට්ඨවාචික උපසම්පදාව නමිනි.
(2) පඤ්හව්‍යාකරණ උපසම්පදාව නමිනි.
(3) ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව නමිනි.
(4) ගරුධම්මපටිග්ගහණ උපසම්පදාව නමිනි.

35. සියලු දේට පොදු අනිත්‍යතාව, දුක්ඛතාව, ලොව අප කිසිවෙකුටත් වෙනස් කළ නොහැකි ය. එම ධර්මතා අතර ඉර පෑයීම, සඳ පෑයීම, රෑ දවල් වීම ආදිය අයත් වන්නේ,

(1) චිත්ත නියාමයටයි.
(2) ධම්ම නියාමයටයි.
(3) කම්ම නියාමයටයි.
(4) උතු නියාමයටයි.

36. යම් මිනිසෙක් නිතර නිදනසුලු වෙයි ද පිරිස් මැද ගැවසෙනසුලු වෙයි ද උත්සාහයෙන් තොර වෙයි ද අලස වෙයි ද කිපෙන්නෙකැයි ප්‍රකට වෙයි ද එය පිරිහෙන්නාගේ දොරටුවකි. ඉහත අදහස ප්‍රකාශිත පරාභව සූත්‍ර ගාථාවේ මුල් අර්ධය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පහූත විත්තො පුරිසො - සහිරඤ්ඤො සභොජනො
(2) නිද්දාසීලී සභාසීලී - අනුට්ඨාතාව යො නරො
(3) අසන්තස්ස පියාහොන්ති - සන්තෙ න කුරුතෙ පියං
(4) ඉත්ථි ධුත්තො සුරා ධුත්තො - අක්ඛ ධුත්තො ච යො නරො

37. බුද්ධරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යාඥාණ අතුරින් තමා පෙර සසර ගත කළ කඳ පිළිවෙළ හෙවත් ජීවිත පරම්පරාව දැකිය හැකි ඥාණය වන්නේ,

(1) දිබ්බචක්ඛු ඤාණයයි.
(2) පුබ්බෙනිවාසානුස්සති ඤාණයයි.
(3) විපස්සනා ඤාණයයි.
(4) ආසවක්ඛය ඤාණයයි.

38. 'උග්ඝටිතඤ්ඤ' යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ මින් කුමක් ද?

(1) කවර ක්‍රමයකින් හෝ කරුණු අවබෝධ නොකර ගන්නා තැනැත්තා
(2) ඉතා අමාරුවෙන් කරුණු අවබෝධ කර ගන්නා තැනැත්තා
(3) පුරුදු පුහුණු කිරීමෙන් කරුණු අවබෝධ කර ගන්නා තැනැත්තා
(4) ඇසුණු සැනින් කරුණු අවබෝධ කර ගන්නා තැනැත්තා

39. ඈත පිටිසර පෙදෙසක ජලය කොළඹට ගෙනවුත් මහා ජනතාවකට දෙවා ඔවුන්ගේ පිපාසා සංසිඳුවන බාහිර පවිත්‍රතාව ඇති කිරීමට මූලික ස්ථානය ලෙස මාලිගාකන්ද පිරිවෙණ තෝරා ගත්තේ,

(1) දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමා ය.
(2) සර් විලියම් හැන්රි ග්‍රැගරි ආණ්ඩුකාරතුමා ය.
(3) දොන් පිලිප්පු සිල්වා ඇපා අප්පුහාමිතුමා ය.
(4) කාසිනාථ බමුණු පඬිතුමා ය.

40. පුහුදුන් බව ඉක්මවා නිවන් පිලිවෙතට අවතීර්ණ වන පුද්ගලයා තුළ වැඩෙන ඉන්ද්‍රිය පහ වන්නේ,

(1) චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය ය.
(2) සති, ධම්මවිචය, විරිය, පීති, සමාධි ය.
(3) සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා ය.
(4) රූප, සද්ද, ගන්ධ, රස, ඵස්ස ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW**

**2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්** **03 S II**

(නව නිර්දේශය)

පැය තුනයි

**2018.12.21 /12.30 - 15.40**

**(03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය**

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

* I කොටසේ ප්‍රශ්නය ද II හා III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) බුදුගුණ අලංකාරයෙහි 'විද්දා තැණ අට ද - පසළොස් චරණ ගුණය ද' යන පද්‍ය පාද දෙකින් ප්‍රකාශ කෙරෙන බුදුගුණය කුමක් ද?

(ii) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, භාව හා වත්ථු යන දසක සතම පහළවන සංසේදජ හා ඕපපාතික සත්ත්වයන් හඳුන්වන්න.

(iii) දුක්ඛාර්ය සත්‍යයෙහි ඇතුළත් දුක්ඛ දුක්ඛතා හා විපරිණාම දුක්ඛතා අතර පවත්නා වෙනස පැහැදිලි කරන්න.

(iv) ආපත්තිභය සූත්‍රයේ සඳහන් සංඝාදිසේස ආපත්ති පිළිබඳව භික්ෂුවකට හෝ භික්ෂුණියකට ඇතිවිය යුතු දෙයාකාර අපේක්ෂා කවරේ ද?

(v) විනයධර භික්ෂුණීන් අතුරින් අගතනතුර ලැබූ මහරහත් තෙරණින් වහන්සේ නම් කොට, සිවපිළිසිඹියාපත් මහරහත් බව ලැබීමට ඇය වැඩූ භාවනා කර්මස්ථානය පෙන්වා දෙන්න.

(vi) සතර සතිපට්ඨාන භාවනාව වැඩීම නිසා පුද්ගලයා තුළ ගොඩනැගෙන දැක්ම කවරේ ද?

(vii) ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගීමට රාජ්‍ය පාලකයා ක්‍රියා කළ යුතු බවට කූටදන්ත සූත්‍රය ඉදිරිපත් කරන නිර්දේශ අතුරින් දෙකක් දක්වන්න.

(viii) මජ්ඣිම ප්‍රමාණයේ සූත්‍ර වර්ග තුනකට බෙදා සංග්‍රහ කරනු ලැබූ ප්‍රධාන නිකාය ග්‍රන්ථය හා එහි වර්ග තුන නම් කරන්න.

(ix) ශාසනය තුළ විනය ශික්ෂා පැනවීමේ අවශ්‍යතාව ප්‍රකට කළ ආසවට්ඨානීය ධර්ම අතුරින් දෙකක් පෙන්වා දෙන්න.

(x) සෝභන සාධාරණ සද්ධා චෛතසිකයෙහි දෙයාකාරය පෙන්වා දෙන්න.

## II කොටස

**2.** (i) බුදුරජාණන් වහන්සේගේ උත්තර මනුෂ්‍ය ගුණාංග අතුරින් ඉවසීමේ ගුණය ප්‍රකට කළ අවස්ථා දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉහත (i) හි ඔබ විසින් සඳහන් කරන ලද එක් අවස්ථාවකට අදාළ කෙටි විස්තරයක් සපයන්න. *(ලකුණු 03 යි)*

(iii) ජාතිය, ආගම, කුලය, ධනය හා බලය මත බෙදී උස්පහත්කම් ගොඩනගා ගන්නා අද්‍යතන සමාජයට, සමසිතින් ක්‍රියා කළ බුදුරදුන්ගේ මහාකරුණා ගුණයෙන් ලබා දෙන ආදර්ශය පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

[2 වැනි පිටුව බලන්න.

3. (i) බුදුසසුනේ දකුණත් සවු වූ සැරියුත් මහරහතන් වහන්සේ අගසවු තනතුරට අමතරව ලැබූ වෙනත් තනතුරු දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) බුදුරජාණන් වහන්සේ චක්කානුවත්තන සූත්‍රයේ දී ඇගයීමට ලක්කරන සැරියුත් මහරහතන් වහන්සේගේ කෞශල්‍යය කවරාකාර දැයි කෙටියෙන් පහදන්න. *(ලකුණු 03 යි)*

(iii) ඉතා ගැඹුරු ධර්ම කරුණු සරලව සන්නිවේදනය කළ සැරියුත් මහරහතන් වහන්සේගේ දේශනා කෞශල්‍යය වර්තමාන ධර්මදේශකයන් වහන්සේලාට සපයන ආදර්ශය පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

4. (i) සංඝාදිසේසාපත්තියකට පත් භික්ෂූන් වහන්සේගේ පාරිශුද්ධිය සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) දුට්ඨුල්ලවාචා සංඝාදිසේසාපත්තිය ලියා, එහි අර්ථය දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) සංඝාදිසේස යන්නෙහි අර්ථය පැහැදිලි කොට, සංඝාදිසේස හා පාරාජිකා අතර වෙනස දක්වන්න. *(ලකුණු 05 යි)*

## III කොටස

5. (i) 'සබ්බෙ තසන්ති දණ්ඩස්ස' යන ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) ඉහත ගාථාවෙහි එන අත්තූපනායික ධර්මපර්‍යාය විවරණය කොට, ඉන් සමාජය වෙත ලබා දෙන පණිවුඩය සාකච්ඡා කරන්න. *(ලකුණු 05 යි)*

6. (i) 'යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතුං තථාගතො ආහ' යන ගාථාර්ධයෙහි අර්ථය ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) පටිච්චසමුප්පාද න්‍යාය සරල සූත්‍රයක් ඇසුරින් පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(iii) පුද්ගල සන්තානගත දුක පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අනුව විවරණය කරන්න. *(ලකුණු 05 යි)*

7. (i) අන්‍යසමාන චෛතසික රාශියේ කොටස් දෙක බෙදා දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) චෛතසික ධර්මවල සම්ප්‍රයෝග ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(iii) අකුසල චෛතසික හඳුන්වා, අකුසල් චෛතසිකවලින් යුක්ත සිතක ස්වභාවය පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

* * *

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018
## (නව නිර්දේශය)
## ලකුණු දීමේ පටිපාටිය

# (03) ත්‍රිපිටක ධර්මය - I / II

## I පත්‍රය

1 සිට 40 තෙක් නිවරදි එක් පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 40 යි.

## II පත්‍රය

### I කොටස

1. නිවැරදි පිළිතුරු සඳහා ලකුණු (02 × 10) ලකුණු 20 යි

### II කොටස (තෝරාගත් ප්‍රශ්න 02 ක් සඳහා)

**2.**
- I. නිවැරදි පිළිතුරට ලකුණු 02යි.
- II. නිවැරදි පිළිතුරට ලකුණු 03යි.
- III. නිවැරදි පිළිතුරට ලකුණු 05යි.

**3.**
- I. නිවැරදි පිළිතුරට ලකුණු 02යි.
- II. නිවැරදි පිළිතුරට ලකුණු 03යි.
- III. නිවැරදි පිළිතුරට ලකුණු 05යි.

**4.**
- I. නිවැරදි පිළිතුරට ලකුණු 02යි.
- II. නිවැරදි පිළිතුරට ලකුණු 03යි.
- III. නිවැරදි පිළිතුරට ලකුණු 05යි.

### III කොටස (තෝරාගත් ප්‍රශ්න 02 ක් සඳහා)

**5.**
- I. නිවැරදි පිළිතුරට ලකුණු 02යි.
- II. නිවැරදි පිළිතුරට ලකුණු 03යි.
- III. නිවැරදි පිළිතුරට ලකුණු 05යි.

**6.**
- I. නිවැරදි පිළිතුරට ලකුණු 02යි.
- II. නිවැරදි පිළිතුරට ලකුණු 03යි.
- III. නිවැරදි පිළිතුරට ලකුණු 05යි.

**7.**
- I. නිවැරදි පිළිතුරට ලකුණු 02යි.
- II. නිවැරදි පිළිතුරට ලකුණු 03යි.
- III. නිවැරදි පිළිතුරට ලකුණු 05යි.

| | | |
|---|---|---|
| I පත්‍රයට ලකුණු | 1×40 | - 40යි. |
| II පත්‍රයට I කොටසට ලකුණු | 2×10 | - 20යි. |
| II කොටස ලකුණු | 2×10 | - 20යි. |
| III කොටස ලකුණු | 2×10 | - 20යි. |

# I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරට අදාල අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරට අදාල අංකය |
|---|---|---|---|
| 1 | 2 | 21 | 3 |
| 2 | 3 | 22 | 2 |
| 3 | 4 | 23 | 4 |
| 4 | 1 | 24 | 2 |
| 5 | 2 | 25 | 2 |
| 6 | 2 | 26 | 3 |
| 7 | 3 | 27 | 4 |
| 8 | 4 | 28 | 4 |
| 9 | 1 | 29 | 2 |
| 10 | 3 | 30 | 2 |
| 11 | 1 | 31 | 2 |
| 12 | 4 | 32 | 3 |
| 13 | 2 | 33 | 3 |
| 14 | 1 | 34 | 4 |
| 15 | 3 | 35 | 2 |
| 16 | 1 | 36 | 2 |
| 17 | 3 | 37 | 2 |
| 18 | 3 | 38 | 4 |
| 19 | 4 | 39 | 2 |
| 20 | 4 | 40 | 3 |

## II පත්‍රය
### I කොටස

**1.**

I විජ්ජාචරණ බුදු ගුණය.

II ගහකොළ, පස්, කසල වැනි තැන්වල උපදින සත්ත්වයෝ ය. කර්මානුරූපව ඉබේ පහළවන දේව ආදී සියුම් ශරීර ඇති සත්ත්වයෝ ය.

III ජාති, ජරා, ව්‍යාධි, මරණ වලට ගොදුරු වෙමින්, සත්ත්වයා එදිනෙදා විඳින දුක දුක්ඛ දුක්ඛතා නම් වේ. විපරිණාම දුක්ඛ යනු වෙනස්වීම නිසා ඇතිවන දුකයි. නිරෝගී අයෙකු රෝගීවීම, තරුණයෙකු මහළුවීම ආදී විපර්යාස විපරිණාම දුක්ඛ නම් වේ.

IV 1) මෙතෙක් නොපත්, සංඝාදිසේසාපත්තියකට නොපැමිණෙන්නෙමි.

2) පත් වූ සංඝාදිසේසාපත්තියෙක් වේ නම් ධර්ම විනයානුකූලව පිළියම් කරන්නෙමි යන අපේක්ෂාව යි.

V පටාචාරා රහත් මෙහෙණින් වහන්සේ
මරණානුස්සති භාවනාව

VI යමක් අනිත්‍ය ද එය දුක් සහගතයි. යමක් දුක් සහගත ද එය අනාත්ම යි. යමක් අනාත්ම ද එය මම නොවෙමි. මාගේ නොවේ. මාගේ ආත්මය ද නොවේ. යනුයි.

VII 1) මූලධනය (ප්‍රාග්ධනය) වෙළෙඳපොල ආදිය ලබාදෙමින් වෙළඳාම ශක්තිමත් කිරීම.

2) බිත්තර වී, ගොවිපල, පොහොර ආදිය ලබා දී කෘෂිකර්මාන්තය ශක්තිමත් කිරීම.

3) හැකියාව මත රැකියා ලබා දී ඊට සරිලන වැටුප් ආදිය සැපයීමෙන් රාජ්‍ය සේවය ශක්තිමත් කිරීම යනුයි.

VIII මජ්ඣිම නිකාය, මූලපණ්ණාසක, මජ්ඣිම පණ්ණාසක හා උපරි පණ්ණාසක යනුයි.

| | | |
|---|---|---|
| IX රත්තඤ්ඤු මහත්තතා | . | පැවිදි වී බොහෝ කල්ගත වීමෙන් භික්ෂූන් බහුලවීම |
| වෙපුල්ල මහත්තතා | . | සංඝයා පිරිස අතින් විශාලවීම |
| ලාභග්ග මහත්තතා | . | ලාභ ප්‍රයෝජන ලැබීම අතින් බහුලවීම |
| බාහුසච්ච මහත්තතා | . | බහුශ්‍රැතභාවයෙන් වැඩිවීම |

X 1) සම්පසාදන සද්ධා . චිත්ත චෛතසිකයන් පැහැදිලිවීම සඳහා වූ ශ්‍රද්ධාව
2) සම්පක්ඛසාධන සද්ධා . කුසල චෛතසිකයන්ට පෙරටුව ගමන් කරන ශ්‍රද්ධාව

(ලකුණු 02 × 10 = 20 යි)

## II කොටස

**2.**

I දේවදත්ත තෙර, අංගුලිමාල, සොරු, නාලාගිරි ඇතු ආදීන්ගෙන් ලද පීඩාවන් ඉවසීම මෙයින් දෙකකි. (ලකුණු 02 යි)

II ඉහත පිළිතුරෙන් එක් කරුණකට අදාළව කෙටි විස්තරයක් දක්වා තිබිය යුතුය.

(ලකුණු 03 යි)

III සත්පුරුෂයන්ගේ හදවත අනුන්ගේ දුක්, වද බන්ධන, අසමානකම්, අසරණකම් ආදිය දැක සැලීමට, කම්පාවට පත් වේ. එය උසස් මිනිස් ගුණයකි. එය කරුණාව නම් වේ. මානව දයාව, අනුකම්පාව යැයි ද මෙයට කියනු ලැබේ. බුදුරදුන්ගේ මහා කරුණාව සාමාන්‍ය සත්ත්වයාගේ කරුණාවට වඩා අසීමිත වූවකි. සියලු සත්ත්වයා කෙරෙහි සම සිතින්, සම මෙතින් ක්‍රියා කරන්නකි. සතුරාට ද මිතුරාට ද නෑයාට ද නොනෑයාට ද ආදී වශයෙන් බෙදීමක් නැත. සියල්ලන්ට ම සමාන මෛත්‍රියෙන් කටයුතු කරයි. වත්මන් මිනිස් සමාජයේ ද මානවයා සතුව පැවතිය යුත්තේ ද එම උසස් මානව ගුණය යි. එවිට අසමානකම්, අසාධාරණකම්, අයුක්ති සහගත කටයුතු, මානව අයිතීන් කඩවීම සිදු නොවෙයි. එය සමාජයට මහත් ආශිර්වාදයකි.
මේ ඇසුරින් පිළිතුර සකස් වී තිබිය යුතුය (ලකුණු 05 යි)

**3.**

I ධම්මසේනාපති තනතුර . මහා ප්‍රාඥයන් අතර අග තනතුර (ලකුණු 02 යි)

II මහණෙනි, මේ සසුනේ අර්ථය දන්නා, ධර්මය දන්නා, සිව්පස පමණ දන්නා, කාල පරිහරණය දන්නා, පිරිස් ගැන දන්නා සැරියුත් තෙරුන් වහන්සේ තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද අනුත්තර වූ ධර්මචක්‍රය මනාකොට නැවත පවත්වයි. එම ධර්මචක්‍රය වෙනත් ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලොවෙහි වෙනයම් කිසිම කෙනෙකුට හෝ කිසිසේත් ම පැවැත්විය නොහැකිය යනුයි.
මේ ඇසුරින් පිළිතුර සකස්විය යුතුය. (ලකුණු 03 යි)

III අර්ථය දන්නා . අත්ථඤ්ඤූ
ධර්මය දන්නා . ධම්මඤ්ඤූ
කාල පරිහරණය දන්නා . කාලඤ්ඤූ
පිරිස් ගැන දන්නා . පරිසඤ්ඤූ

යන පෞරුෂ ගුණාංග වර්තමාන දේශකයන් වහන්සේලාට ආදර්ශවත් වන අයුරු දක්වා තිබිය යුතුය.

(ලකුණු 05 යි)

4.

I 1) පිරිවෙස් විසීම
2) මානත් පුරා අබ්භාන කර්මය කිරීම (ලකුණු 02 යි)

II යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන
මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය යථා
තං යුවා යුවතිං මෙථුනුපසංහිතාහි, සංඝාදිසෙසො

තේරුම :
යම් භික්ෂුන්වහන්සේ නමක් රාගයට බැස පෙරළීගිය සිත් ඇත්තේ, කිසියම් ස්ත්‍රියකට මෛථුන්දම හා සම්බන්ධ ව තරුණයෙක්, තරුණියකට කථා කරන ආකාරයෙන් අසභ්‍ය වචනයෙන් කථා කෙරේ නම් සංඝාදිසේසාපත්තිය වෙයි යනුයි (ලකුණු 03 යි)

III සංඝො ආදිම්හි චෙව සෙසෙච ඉච්ඡිතබ්බො අස්සාති සංඝාදිසෙසො යනු නිර්වචනය යි.

- පිරිවෙස් සමාදන් වීම් සංඛ්‍යාත ආදියෙහි මෙන්ම මානත් අබ්භාන සංඛ්‍යාත සෙසු පිළිවෙත්වල ද සඟවෙසෙස් ඇවතකට පැමිණියාහු විසින් සංඝයාගේ සහභාගීත්වය කැමති වියයුතු හෙයින් සංඝාදිසේස නම් වේ.

- පාරාජිකාපත්තියකට පත්වීම ඡේද්‍යගාමිනී ඇවතක් බැවින් භික්‍ෂුභාවය සිඳී යයි. නැතහොත් භික්‍ෂුත්වය අහෝසි වේ.

- සංඝාදිසේසාපත්තියකට පත්වීම . උට්ඨානගාමිනී ඇවතක් බැවින්, පිරිවෙස් විසීම්, මානත් පිරීම හා අබ්භාන කර්මය කිරීමෙන් නැවත ප්‍රකෘති භික්‍ෂුවක් ලෙස නැගී සිටිය හැකිය. එබැවින් පිළියම් යෙදිය හැකි ආපත්ති සංඝාදිසේසාපත්ති වේ.

- පාමරාජිකාපත්තියෙන් භික්‍ෂුත්වය අහෝසි වීමත් සංඝාදිසේසාපත්තියට පිළියම් යෙදීමෙන් නැවත නැගී සිටිය හැකිවීමත් වෙනසයි. (ලකුණු 05 යි)

III අර්ථය දන්නා . අත්ථඤ්ඤූ
ධර්මය දන්නා . ධම්මඤ්ඤූ
කාල පරිහරණය දන්නා . කාලඤ්ඤූ
පිරිස් ගැන දන්නා . පරිසඤ්ඤූ

යන පෞරුෂ ගුණාංග වර්තමාන දේශකයන් වහන්සේලාට ආදර්ශවත් වන අයුරු දක්වා තිබිය යුතුය.

(ලකුණු 05 යි)

**4.**

I 1) පිරිවෙස් විසීම
2) මානත් පුරා අබ්භාන කර්මය කිරීම (ලකුණු 02 යි)

II යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන
මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය යථා
තං යුවා යුවතිං මෙථුනුපසංහිතාහි, සංඝාදිසෙසො

තේරුම :
යම් භික්ෂුන්වහන්සේ නමක් රාගයට බැස පෙරළීගිය සිත් ඇත්තේ, කිසියම් ස්ත්‍රියකට මෛථුන්දම හා සම්බන්ධ ව තරුණයෙක්, තරුණියකට කථා කරන ආකාරයෙන් අසභ්‍ය වචනයෙන් කථා කෙරේ නම් සංඝාදිසේසාපත්තිය වෙයි යනුයි (ලකුණු 03 යි)

III සංඝො ආදිම්හි චෙව සෙසෙච ඉච්ඡිතබ්බො අස්සාති සංඝාදිසෙසො යනු නිර්වචනය යි.

- පිරිවෙස් සමාදන් වීම් සංඛ්‍යාත ආදියෙහි මෙන්ම මානත් අබ්භාන සංඛ්‍යාත සෙසු පිළිවෙත්වල ද සඟවෙසෙස් ඇවතකට පැමිණියානු විසින් සංඝයාගේ සහභාගීත්වය කැමති වියයුතු හෙයින් සංඝාදිසේස නම් වේ.

- පාරාජිකාපත්තියකට පත්වීම ඡේද්‍යගාමිනී ඇවතක් බැවින් භික්ෂුභාවය සිඳී යයි. නැතහොත් භික්ෂුත්වය අහෝසි වේ.

- සංඝාදිසේසාපත්තියකට පත්වීම . උට්ඨානගාමිනී ඇවතක් බැවින්, පිරිවෙස් විසීම, මානත් පිරීම හා අබ්භාන කර්මය කිරීමෙන් නැවත ප්‍රකෘති භික්ෂුවක් ලෙස නැඟී සිටිය හැකිය. එබැවින් පිළියම් යෙදිය හැකි ආපත්ති සංඝාදිසේසාපත්ති වේ.

- පාරාජිකාපත්තියෙන් භික්ෂුත්වය අහෝසි වීමත් සංඝාදිසේසාපත්තියට පිළියම් යෙදීමෙන් නැවත නැගී සිටිය හැකිවීමත් වෙනසයි. (ලකුණු 05 යි)

## III කොටස

5.

I සබ්බෙ තසන්ති දණ්ඩස්ස
සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයෙ
හෝ
සබ්බෙ තසන්ති දණ්ඩස්ස
සබ්බෙසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය නඝාතයෙ යන ගාථා දෙකින් එකකි. (ලකුණු 02 යි)

II

තේරුම :

සියලු දෙනා දඬුවමට හෝ පහර දීමට තැති ගනිති. සියලු දෙනා මරණයට බිය වෙති. තමා උපමා කොට අනුන්ට පහර දීමෙන් වැළකිය යුතුය. නැසීමෙන් ද වැළකිය යුතුය

හෝ

සියලු දෙනා දඬුවමට, පහර දීමට තැති ගනිති. සියල්ලන්ට ජීවිතය ප්‍රිය ය. මමත් මගේ ජීවිතයට ප්‍රිය නොවේදැයි තමා ම උපමා කොට පහර නොදිය යුතුය, නොනැසිය යුතුය යනුයි. (ලකුණු 03 යි)

III ''අත්තානං උපමං කත්වා . නහනෙය්‍ය න ඝාතයෙ'' යනු තමා උපමා කොට පහර නොදිය යුතුය. නොනැසිය යුතුය. යනු බුදුසමයේ අත්තුපනායික ධර්ම පරියාය යි. මේ ඇසුරින් පිළිතුර ගොඩනගා තිබිය යුතුය. (ලකුණු 05 යි)

6.

I යම් හේතුවකින් උපදින යම් ධර්මයක් වේද ඒ හේතුව තථාගතයන් වහන්සේ දේශනා කළහ. යනුයි (ලකුණු 02 යි)

II

| | | | |
|---|---|---|---|
| අස්මිං සති ඉදං හොති | . | මෙය ඇති කල්හි මෙය වේ. |
| ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති | . | මෙය හට ගැනීමෙන් මෙය හටගනී |
| අස්මිං අසති ඉදං න හොති | . | මෙය නැති කල්හි මෙය ඇති නොවේ |
| ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති | . | මෙය නැති වීමෙන් මෙය නැති වේ |

(ලකුණු 05 යි)

| | | |
|---|---|---|
| III | අවිද්‍යාව හේතුවෙන් සංස්කාර වේ | -අවිජ්ජා පච්චයා සංඛාරා |
| | සංස්කාර හේතුවෙන් විඥ්ඥාණය වේ | - සංඛාර පච්චයා විඤ්ඤාණ |
| | විඥ්ඥාණය හේතුවෙන් නාමරූප වේ | -විඤ්ඤාණ පච්චයා නාමරූපං |
| | නාමරූප හේතුවෙන් ෂඩ් ආයතන වේ | - නාමරූප පච්චයා සළායතනං |
| | සළායතන හේතුවෙන් ස්පර්ශය වේ | - සළායතන පච්චයා ඵස්සෝ |
| | ස්පර්ශය හේතුවෙන් වේදනාව වේ | - ඵස්ස පච්චයා වේදනා |
| | වේදනාව හේතුවෙන් තණ්හාව වේ | - වේදනා පච්චයා තණ්හා |
| | තණ්හාව හේතුවෙන් උපාදාන වේ | -තණ්හා පච්චයා උපාදානං |
| | උපාදාන හේතුවෙන් භවය වේ | - උපාදාන පච්චයා භවෝ |
| | භවය හේතුවෙන් ජාතිය වේ | - භව පච්චයා ජාති |
| | ජාතිය හේතුවෙන් ජරා ව්‍යාධි මරණ ශෝක පරිදේව දුක් දොම්නස් හටගනී. | - ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසා සම්භවන්ති. |

මේ ඇසුරින් පිළිතුර සකස්විය යුතුය (ලකුණු 05 යි)

7.

I 1) සබ්බචිත්ත සාධාරණ චෛතසික 07 යි

2) පකිණ්ණක චෛතසික 06 යි (ලකුණු 02 යි)

II

- සිත සමගම ඉපදීම (ඒකුප්පාද)
- සිත සමගම නැතිව යෑම (ඒකනිරෝධ)
- සිත ගත් අරමුණම ගැනීම (ඒකාලම්බන)
- සිත ඒ ඒ අවස්ථාවේ ඇසුරු කරන චක්ඛු සෝතාදි ප්‍රසාද වස්තුවම ඇසුරු කොට පැවතීම (ඒකවත්ථුකා)

(ලකුණු 05 යි)

III ලෝභ, දෝස, මෝහ ආදී තුදුස් චෛතසික අකුසල චෛතසික යැයි කියනු ලැබේ. එම අකුසල චෛතසික සිතෙහි යෙදීමෙන් පුද්ගලයා අකුසල ක්‍රියා සිදු කරයි. අකුසල පක්ෂයෙහි යෙදෙන සිතිවිලි බැවින් ඒවා අකුසල චෛතසික යැයි කියනු ලැබේ. ඒවා නම්,

| | | | | |
|---|---|---|---|---|
| මෝහ . | අහිරික . | අනොත්තප්ප . | උද්ධච්ච . | ලෝභ |
| දිට්ඨි . | මාන . | දෝස . | ඉස්සා . | මච්ඡරිය |
| කුක්කුච්ච . | ථීන . | මිද්ධ . | විචිකිච්ඡා යනුයි | |

මෙම අකුසල චෛතසික යෙදුණු සිත පුද්ගලයා අකුසල ක්‍රියාවට පොළඹවයි, යොදවයි. මේ ඇසුරින් පිළිතුර ගොඩනගා තිබිය යුතුය. (ලකුණු 05 යි)

*********

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW** **2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්** **03 S I**

(නව නිර්දේශය)

**2019.12.20 /08.30 - 09.30**

## (03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය

පැය එකයි

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.

* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "ඔබ වහන්සේගේ දහම් විස්තරය භික්ෂූන් වහන්සේලාට මහාව වැටහිණි. එසේ වුවත් දීර්ඝ දහම් විස්තරය අසා දොරකඩ සිටි මගේ පිට රිදෙන්නේ යැයි" බුදුරජාණන් වහන්සේ වදාළේ,
   (1) මහාකාශ්‍යප තෙරුන්ගේ ධර්මදේශනාවක් ඇසීමෙනි.
   (2) නන්දක තෙරුන්ගේ ධර්මදේශනාවක් ඇසීමෙනි.
   (3) අනුරුද්ධ තෙරුන්ගේ ධර්මදේශනාවක් ඇසීමෙනි.
   (4) නන්ද තෙරුන්ගේ ධර්මදේශනාවක් ඇසීමෙනි.

2. බුදුරජාණන් වහන්සේගේ රූප විලාසයෙහි දෙතිස් මහාපුරුෂ ලක්ෂණ අතර "සුඛුමච්ඡවි හොති" යන්නෙන් අදහස් වන්නේ,
   (1) රන්බඳු පැහැ ඇති බව ය. (2) මනාව නැමුන පිට මැද ඇති බව ය.
   (3) දූවිලි නොරඳන සියුම් සම ඇති බව ය. (4) ඉඳුනිල් පැහැ කෙස් ඇති බව ය.

3. අසමසම බුදුරජාණන් වහන්සේගේ අෂ්ටවිද්‍යා ඥාන අතරින් "මනෝමය ඉද්ධි ඥාණය" තුළින් ප්‍රකට වන්නේ,
   (1) නාමරූප ධර්ම අනිත්‍යාදී වශයෙන් දැකීමේ හැකියාවයි.
   (2) අනුන්ගේ සිත් හා සිතිවිලි දැනගැනීමේ හැකියාවයි.
   (3) බොහෝ රූප මවා පෙන්වීමේ හැකියාවයි.
   (4) තමන් හා සමාන වෙනත් කයක් නිර්මාණය කිරීමේ හැකියාවයි.

4. "දරුව, සියලු සතුන් කෙරෙහි දඬු ඔහා තබා මම සිටියේ වෙමි. ප්‍රාණවධයෙන් නො වැළකුණු ඔබ තව ම නො නැවතුනෙහි" යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාරන ලද්දේ,
   (1) රජ්ජුමාලා මෙහෙකාරියට ය. (2) සුනීත කැබොල් පුතුට ය.
   (3) පේසකාර දියණියට ය. (4) අංගුලිමාලට ය.

5. සැරියුත් තෙරුන් වහන්සේ රහත්වලයට පත්වූයේ දීඝනඛ පිරිවැජියාට සූකරඛත ලෙනේ දී බුදුරදුන් දේශනා කළ කිනම් සූත්‍රයක් ඇසීමෙන් ද?
   (1) සච්චවිභංග සූත්‍රය ඇසීමෙනි. (2) වේදනා පරිග්ගහ සූත්‍රය ඇසීමෙනි.
   (3) චක්කානුවත්තන සූත්‍රය ඇසීමෙනි. (4) ආපත්තිභය සූත්‍රය ඇසීමෙනි.

6. ගෞතම සම්බුද්ධ ශාසනයේ අග්‍රශ්‍රාවිකාවක වූ උප්පලවණ්ණා තෙරණිය ලැබූ අගතනතුර වූයේ,
   (1) විනයධර භික්ෂුණීන් අතර අගතනතුරයි. (2) සෘද්ධිමත් භික්ෂුණීන් අතර අගතනතුරයි.
   (3) ධර්මකථික භික්ෂුණීන් අතර අගතනතුරයි. (4) විරාරාරම්භ භික්ෂුණීන් අතර අගතනතුරයි.

7. අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් හෙළටුවා භාවිත කරමින් ත්‍රිපිටකය සඳහා පාලි අටුවා සම්පාදනය කළහ. ඉන් මජ්ඣිමනිකාය සඳහා ලියන ලද අටුවාව වන්නේ,
   (1) මනෝරථපූරණියයි. (2) පරමත්ථජෝතිකාවයි.
   (3) සුමංගලවිලාසිනියයි. (4) පපංචසූදනියයි.

8. වත් සමාදානය, මානත් පිරීම, අබ්භාන කර්මය යන විනය පිළිවෙත් මාලාව අනුගමනය කිරීමෙන් පමණක් පාරිශුද්ධත්වයට පත් විය හැකි ශික්ෂා ප්‍රඥප්තියක් වන්නේ,

(1) සංඝාදිසේසාපත්තියයි. (2) පාරාජිකාපත්තියයි.
(3) පාචිත්තිය ආපත්තියයි. (4) පාටිදේසනීය ආපත්තියයි.

9. මූලික බුද්ධ දේශනාව නවාංගසත්ථුසාසනයකට බෙදා දක්වා ඇත. මෙහි එන "අබ්භූතධම්ම" යන අංගයෙන් දක්වා ඇත්තේ,

(1) සියලුම ගාථා සහිත සූත්‍රයන් ය. (2) බෝසත් චරිතය පිළිබඳ කථාවන් ය.
(3) ආශ්චර්යවත් කරුණු ඇතුළත් සූත්‍රයන් ය. (4) සතුට පළ කරමින් දේශනා කළ ගාථාවන් ය.

10. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් අවේලාවේ වීථි සංචාරයේ ආදීනව අතර එන "සංකියො ච හොති පාපකෙසු ඨානෙසු" යන්නෙහි අර්ථවත් වන්නේ,

(1) තමාගේ ම රැකවරණය නැතිවෙයි. (2) ඔහුගේ ධනයේ ද රැකවරණය නැතිවෙයි.
(3) බොහෝ දුක් කරදර ඔහු පසුපස එයි. (4) වැරදි අපරාධවලට සැකකරුවකු වෙයි.

11. පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ දොරටු අතර
'අසන්තස්ස පියා හොන්ති - සන්තෙ න කුරුතෙ පියං' යන ගාථාර්ධයෙහි අර්ථය වන්නේ.

(1) අසත්පුරුෂයෝ ප්‍රිය කරති - සත්පුරුෂයෝ ප්‍රිය නො කරති.
(2) අකුසලය ප්‍රියකරයි - කුසලය ප්‍රිය නොකරයි.
(3) නිතර නිදනසුලු වෙයි - පිරිස් මැද ගැවසෙනසුලු වෙයි.
(4) බොහෝ රන්රුවන් ඇතිවෙයි - තනි ව භුක්ති විඳිනු සුලු වෙයි.

12. ආපත්තිභය සූත්‍රයේ එන භික්ෂුවක හෝ භික්ෂුණියක විසින් දැනගත යුතු ආපත්ති භය සතර නිවැරදි ව දක්වා ඇති වරණය වන්නේ,

(1) පාරාජිකා, ථුල්ලච්චය, පාටිදේසනීය, දුක්කට
(2) පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය
(3) පාරාජිකා, පාටිදේසනීය, දුබ්භාසිත, පාචිත්තිය
(4) පාරාජිකා, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට

13. අභිධර්මයේ රූපපරමාර්ථ විග්‍රහයේ දී විෂයරූප හතරක් දක්වා ඇත. එම විෂයරූප නිවැරදි ව දක්වා ඇත්තේ,

(1) පඨවි, ආපෝ, තේජෝ, වායෝ (2) උපචය, සන්තති, ජරතා, අනිච්චතා
(3) රූප, ශබ්ද, ගන්ධ, රස (4) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා

14. නිවනෙහි පළමුවන පියවර වන සෝවාන් ඵලයට පත් තැනැත්තා පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) සෝවාන් ඵලයට පත් තැනැත්තා අනිවාර්යයෙන් නිවන් දකී.
(2) සෝවාන් ඵලයට පත් තැනැත්තා කිසිදා අපායගාමී නොවේ.
(3) සෝවාන් ඵලයට පත් තැනැත්තා ජන්ම හතක් ඇතුළත රහත් වෙයි.
(4) සෝවාන් ඵලයට පත් තැනැත්තාට කාමරාග නොමැත.

15. පටාචාරා තෙරණින් වහන්සේ රහත් ඵලයට පත්වූයේ පැන් කෙණ්ඩියෙන් බිමට ඇමූ ජලය ගලායාම අරමුණුකොට ගෙන ය. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ඇයට වදාළ ගාථාවේ මුල් අර්ධය වන්නේ,

(1) යො ච වස්සසතං ජීවෙ - අපස්සං උදයව්‍යයං
(2) යො ච වස්සසතං ජීවෙ - කුසීතො හීන වීරියො
(3) යො ච වස්සසතං ජීවෙ - දුප්පඤ්ඤො අසමාහිතො
(4) යො ච වස්සසතං ජීවෙ - අපස්සං අමතං පදං

16. ධම්මපදයේ පාප වග්ගයේ එන "මාප්පමඤ්ඤෙථ පාපස්ස" යන ගාථා පාදයෙන් කියවෙන්නේ,

(1) කුඩා වරදක් හෝ නොකළයුතු බවයි. (2) පාපය සුළුයැයි නොසැලකිය යුතු බවයි.
(3) පාපය බැහැර කළ යුතු බවයි. (4) සියලු පාපයෙන් වැළකිය යුතු බවයි.

17. පුහුදුන් පුද්ගලයාගේ සිත තුළ කෙලෙස් ක්‍රියාත්මක වන ආකාර තුනකි. ඉන් අනුසය අවස්ථාව ලෙස සැලකෙන්නේ,

(1) කෙලෙස් අවදිව සිතතුළ ක්‍රියාත්මක අවධියයි.
(2) කෙලෙස් නිදිගත් අවධියයි.
(3) කෙලෙස් ශාරීරිකව හා මානසිකව ක්‍රියාත්මක අවධියයි.
(4) කෙලෙස් නැති වී යන අවධියයි.

[ 3 වැනි පිටුව බලන්න.

...ානයෙහි එන සම්පජඤ්ඤ පබ්බයෙන් දැක්වෙන්නේ,
...ථ භාවනා අරමුණින් ගෙන මෙනෙහි කිරීමයි.
...ප කොට්ඨාස අරමුණු ලෙස ගෙන මෙනෙහි කිරීමයි.
...ුතුවල දී සතරාකාර නුවණින් මෙනෙහි කිරීමයි.
...නීම හෙළීම අරමුණු වශයෙන් ගෙන මෙනෙහි කිරීමයි.

...ැතිවන ආකාරය පැහැදිලි කරමින් "තණ්හාව හේතුවෙන් සෙවීම වේ. සෙවීම හේතුවෙන් ලැබීම වේ. ...ුවෙන් හොඳනරක තීරණය කිරීම වේ." යනාදී කරුණු සඳහන්වන සූත්‍රයක් වන්නේ,

...ජ්ඣිමනිකායේ සල්ලේඛ සූත්‍රයයි. (2) සංයුත්තනිකායේ අචේලකස්සප සූත්‍රයයි.
...දීඝනිකායේ මහානිදාන සූත්‍රයයි. (4) අංගුත්තරනිකායේ නිබ්බේධික සූත්‍රයයි.

...ම විපාක අඩු කිරීම හා ජනක කර්මයෙන් උපන් සැප වූ හෝ දුක් වූ හෝ ප්‍රවෘත්ති විපාක එකදිගට විඳින්නට ...නාදී බාධා කරන්නේ,

(1) ආසන්න කර්මයෙනි. (2) උපත්ථම්භක කර්මයෙනි.
(3) උපඝාතක කර්මයෙනි. (4) උපපීඩක කර්මයෙනි.

21. මිහිඳු මහරහතන් වහන්සේගේ අදහස පරිදි ලක්දිව බුදුසසුන ස්ථිර ලෙස ම මුල්බැසගන්නා ලද්දේ,
(1) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණයෙන් පසුව ය.
(2) මහමෙව්නා උයන පූජා කිරීමෙන් පසුව ය.
(3) අරිට්ඨ කුමරු පැවිදි ව විනය සංගායනා කිරීමෙන් පසුව ය.
(4) සර්වඥධාතූන් වහන්සේලා වැඩමවීමෙන් පසුව ය.

22. මහායාන බුදුදහමේ ඉගැන්වීමක් වන ත්‍රිකාය සංකල්පයේ සම්භෝගකාය ලෙස සඳහන් වන්නේ,
(1) උසස් දහමෙන් පිරිසිදු කළ සිරුරයි. (2) බුද්ධත්වයේ අනුපම සුවය ලද සූක්ෂම සිරුරයි.
(3) මිනිසුන් අතර පෙනීසිටි මිනිස් සිරුරයි. (4) සෘද්ධි බලයෙන් මවා පෙන්වන සිරුරයි.

23. ධර්ම දේශනයකදී ශ්‍රාවකයාට එම දහම සහවුරු කරවීම දේශකයන් වහන්සේගේ ප්‍රධාන අපේක්ෂාවකි. ඊට අදාළ ව සච්චවිභංග සූත්‍රයේ සඳහන් කරුණු හතෙන් පට්ඨපනා යනුවෙන් දක්වන්නේ,
(1) කරුණු විස්තරාත්මකව පැහැදිලි කිරීමයි. (2) හඳුනාගත් කරුණු සහවුරු කිරීමයි.
(3) කරුණු සංක්ෂිප්තව නාමිකව දැක්වීමයි. (4) කරුණු විවෘත කර දැක්වීමයි.

24. මහාපරිනිබ්බාන සූත්‍රයේ "පොරාණ වජ්ජිධම්ම" ලෙස සඳහන් වන්නේ,
(1) දස රාජධර්මයන් ය. (2) දසසක්විතිවත් ය.
(3) සතර සංග්‍රහවස්තූන් ය. (4) සප්ත අපරිහානීය ධර්මයන් ය.

25. ධනිය කුටිකාර භික්ෂුව ආදිකම්මිකයා වූයේ පාරාජිකාපත්ති අතුරින්,
(1) අදින්නාදාන පාරාජිකාපත්තියට ය. (2) මෛථුනධම්ම පාරාජිකාපත්තියට ය.
(3) උත්තරිමනුස්සධම්ම පාරාජිකාපත්තියට ය. (4) මනුස්සවිග්ගහ පාරාජිකාපත්තියට ය.

26. දෙමාපියන්ගේ ආරයෙන් හිමි වූ ලක්ෂණ දරුවන්ට හිමි වේ. ඇතැම්විට දරුවන් මවට පියාට සමාන වෙති. මෙම ස්වභාවය ඇතිවන්නේ,
(1) ධම්ම නියාමයට අනුව ය. (2) කම්ම නියාමයට අනුව ය.
(3) චිත්ත නියාමයට අනුව ය. (4) බීජ නියාමයට අනුව ය.

27. "උපනීයති ලොකො අද්ධුවො" "අතාණො ලොකො අනභිස්සරො" යන පාඨ අන්තර්ගත සූත්‍රය වන්නේ,
(1) මජ්ඣිමනිකායේ රට්ඨපාල සූත්‍රයයි. (2) අංගුත්තරනිකායේ පඨමදේව බ්‍රාහ්මණ සූත්‍රයයි.
(3) සංයුත්තනිකායේ රාජ සූත්‍රයයි. (4) අංගුත්තරනිකායේ සම්මුඛීභාව සූත්‍රයයි.

28. තමාගේ කැමැත්ත අනුව පක්ෂග්‍රාහී වී කැමති පැත්ත ගැනීමෙන් පාපකර්ම සිදුකර ගනී නම් එය,
(1) මෝහයෙන් අගතියට යෑමයි. (2) ද්වේෂයෙන් අගතියට යෑමයි.
(3) ඡන්දයෙන් අගතියට යෑමයි. (4) භයෙන් අගතියට යෑමයි.

29. අංගුත්තරනිකායේ පත්තකම්ම සූත්‍රයට අනුව අතිථිබලි යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(1) ඥාතිමිත්‍රාදීන් වෙනුවෙන් කරන සැලකිලි ය.
(2) ආගමික කටයුතු සඳහා කරන සැලකිලි ය.
(3) මියගිය ඥාතීන් වෙනුවෙන් කරන සැලකිලි ය.
(4) ආගන්තුකයින් වෙනුවෙන් කරන සැලකිලි ය.

[ 4 වැනි පිටුව බලන්න.

30. සතුරන් නසන රණශූරයකු සේ තමා තුළම වූ කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද සංසාර චක්‍රයේ ගරාදි හෙවත් පටිච්චසමුප්පාදයේ අවිද්‍යාදී ධර්ම සිඳලූ හෙයින් ද බුදුරජාණන් වහන්සේ,

(1) සම්මාසම්බුද්ධ නම් වන සේක. (2) අරහං නම් වන සේක.
(3) සුගත නම් වන සේක. (4) ලෝකවිදූ නම් වන සේක.

31. රාජ චරිතය, විනය කතිකාවත, සභාවිලාසිනී ආදී ග්‍රන්ථ රචනා කර ඇති නූතන මහා යතිවරයාණන් වහන්සේ

(1) රත්මලානේ ධම්මාලෝක නාහිමි ය. (2) හික්කඩුවේ සුමංගල නාහිමි ය.
(3) හේන්පිටගෙදර ඥාණසීහ නාහිමි ය. (4) රේරුකානේ චන්ද්‍රවිමල නාහිමි ය.

32. දරවලින් ගිනිගොඩක් හෝ පහනක් පිළියෙල කොට කවාකාර සිදුරක් ඇති තහඩුවක් වැනි යමක් ඒ සමීපයෙහි තබා එම සිදුරෙන් එන ආලෝකය අරමුණු ලෙස ගෙන සිදු කරන භාවනාව වන්නේ,

(1) ආපෝ කසිණ භාවනාවයි. (2) පඨවි කසිණ භාවනාවයි.
(3) තේජෝ කසිණ භාවනාවයි. (4) වායෝ කසිණ භාවනාවයි.

33. සුඛිත සත්ත්වයන්ගේ සැපය දැක ඊර්ෂ්‍යා නොකොට සතුටුවෙමින් ඉතා සුවපහසු ලෙස සම්පත් ඇතිව වාසය කරන පුද්ගලයන් කෙරෙහි සතුටු ඇසින් බලමින් සිදු කරන්නේ,

(1) මෙත්තා භාවනාවයි. (2) කරුණා භාවනාවයි.
(3) උපේක්ඛා භාවනාවයි. (4) මුදිතා භාවනාවයි.

34. අරමුණු සුභ වශයෙන් බලනවිට බලවත් ආශාව ඇති වේ. ඒ අනුව ඇලීම ඇතිවූ දෙය "මම ය මාගේ යැ"යි ඇබිණකොට ගැනීමේ ස්වභාවය හඳුන්වන්නේ,

(1) ව්‍යාපාදය ලෙස ය. (2) විචිකිච්ඡාව ලෙස ය.
(3) කාමච්ඡන්දය ලෙස ය. (4) ථිනමිද්ධ ලෙස ය.

35. ගුජරාටි, මස්කි, බ්‍රහ්මගිරි වැනි ශෛලලිපිවලට අනුව සංඝයා නිරන්තරයෙන් ඇසුරු කරමින් ධර්මය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගත්තේ,

(1) චන්ද්‍රගුප්ත රජතුමා ය. (2) මහා අක්බාර් රජතුමා ය.
(3) බින්දුසාර රජතුමා ය. (4) අශෝක රජතුමා ය.

36. "ගංගානම් නදියේ දකුණු තීරයේ සිට උතුරු තීරය දක්වා දන්දෙමින් යාගහෝම පවත්වමින් ගියත් සිදුවන පිනක් නැත" යන ඉගැන්වීම කළ ශාස්තෘවරයා,

(1) මක්ඛලිගෝසාලයන් ය. (2) පූර්ණ කාශ්‍යපයන් ය.
(3) අජිතකේසකම්බලයන් ය. (4) නිගණ්ඨනාතපුත්තයන් ය.

37. සද්ධර්මයේ සුරක්ෂාව හා චිරපැවැත්ම සඳහා සංයුත්තනිකාය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමට පවරන ලද්දේ,

(1) මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.
(2) ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.
(3) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසට ය.
(4) අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.

38. සම්බුද්ධ ශාසනයේ උපසම්පදා විනය කර්මය පිළිබඳව කියවෙන වැරදි ප්‍රකාශය වන්නේ,

(1) උපසම්පදාව ලැබීමට මව්පිය අවසරය තිබිය යුතු ය.
(2) උපසම්පදාව ලැබීමට පාත්‍රා සිවුරු සම්පූර්ණ වී තිබිය යුතු ය.
(3) උපසම්පදාව ලැබීමට පැවිද්දෙන් වසර විස්සක් සම්පූර්ණ විය යුතු ය.
(4) උපසම්පදාව ලැබීමට ආචාර්ය උපාධ්‍යායන් වහන්සේ සිටිය යුතු ය.

39. අභිධර්මයේ චෛතසික පරමාර්ථයේ එන අනොත්තප්ප චෛතසිකය අයත් වන්නේ,

(1) අන්‍යසමාන චෛතසිකයන්ට ය. (2) අකුසල චෛතසිකයන්ට ය.
(3) ප්‍රකීර්ණක චෛතසිකයන්ට ය. (4) සෝභන චෛතසිකයන්ට ය.

40. නිධිකණ්ඩ සූත්‍රයට අනුව අඹුදරුවන්, දැසිදසුන්, යානවාහන, ඇතුන්, අසුන් ආදී වස්තුව අයත් වන්නේ,

(1) ජංගම නිධානයට ය. (2) ථාවර නිධානයට ය.
(3) අංගසම නිධානයට ය. (4) අනුගාමික නිධානයට ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW**

## 2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්
## (නව නිර්දේශය)

**03 S II**

පැ තුනයි

**2019.12.20 / 12.30 - 15.40**

## (03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

I කොටසේ ප්‍රශ්නය ද II, III යන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) නව ලොවුතුරු දහම 'සන්දිට්ඨික' යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න.

(ii) බුදුගුණ අලංකාරයෙහි 'රහසත් පව් නොකොට කෙලෙසරැපුන් දුරුකොට' යන පද්‍ය පද දෙකින් පැවසෙන බුදුගුණය හා එහි අර්ථ ලියා දක්වන්න.

(iii) රූප උපදවන හේතු රූප සමුට්ඨාන නමින් හැඳින්වේ. එයින් දෙකක් නම් කරන්න.

(iv) දුක්ඛසමුදය ආර්ය සත්‍යය නම් වූ තණ්හාව තෙවැදෑරුම් වේ. එයින් කාමතණ්හා හා භවතණ්හා දෙක හඳුන්වන්න.

(v) සංඝාදිසේසාපත්තියකට පත් භික්ෂුවකට හෝ භික්ෂුණියකට කළ හැකි පිළියම් දෙකක් ඉදිරිපත් කරන්න.

(vi) ශ්‍රාවකයන් වහන්සේලා අතරින් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලැබූ අග්‍රතනතුර නම් කොට එම තනතුර පිරිනැමීමට හේතු දක්වන්න.

(vii) දුක පිළිබඳ පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අයත් අංග අතරින් 'අවිජ්ජා පච්චයා සංඛාරා - අවිද්‍යාව හේතුවෙන් සංස්කාර වේ' යන්නෙහි අවිජ්ජා හා සංඛාර හඳුන්වන්න.

(viii) නිධානයක ප්‍රයෝජන දක්වන බුදුරජාණන් වහන්සේ 'රාජතො වා දුරුත්තස්ස - චොරතො පීළිතස්ස වා' යන ගාථාපද දෙකින් දක්වා ඇති නිධානයකින් වළකන විපත්ති දෙක පෙන්වා දෙන්න.

(ix) 'එකං අත්ථපදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති - යමක් අසා රාගාදී කෙලෙසුන් සංසිඳේ නම් එබඳු අර්ථවත් එක් පදයක් වුවද අසන්නට ලැබීම උතුම් වේ.' මෙහි 'අත්ථපදං' යන්නෙන් අදහස් කරන දහම්පද වර්ග දෙකක් නම් කරන්න.

(x) විනය පිටකයේ අන්තර්ගතය මුලින් ම බෙදා දක්වන මූලික බෙදීම් තුනෙන් දෙකක් ලියා දක්වන්න.

*(ලකුණු 2 × 10 = 20 යි)*

### II කොටස

2. (i) බුදුරජාණන් වහන්සේගේ මහාකරුණාගුණය ප්‍රකට කළ අවස්ථා දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉහත (i) හි ඔබ විසින් සඳහන් කරන ලද එක් අවස්ථාවකට අදාළ කෙටි විස්තරයක් සපයන්න. *(ලකුණු 03 යි)*

(iii) කායිකව හා මානසිකව අසරණ බවට පත්වූ විෂම්ජන මනසක් ඇතිව ක්‍රියාකළ ඇතැමුන්ගේ මනස ප්‍රකෘති ස්වභාවයට පත්කිරීම උදෙසා බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් දෙකක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

[දෙවැනි පිටුව බලන්න.

3. (i) 19 වැනි සියවසේ අගභාගයේ ධර්ම - ශාස්ත්‍රීය හා ශාසනික පුනරුදයට දායක වූ නූතන යතිවරයන් වහන්සේලා දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි ඔබ විසින් සඳහන් කරන ලද එක් යතිවරයන් වහන්සේ නමකගේ සේවාව අගයන්න. (ලකුණු 03 යි)

(iii) ධර්ම-ශාස්ත්‍රීය පුනරුදයෙහි ලා නූතන යතිවරයන් වහන්සේලා ආරම්භ කළ පිරිවෙන් ආයතන දෙකක් ඇසුරින් ශාස්ත්‍රීය සේවාව විස්තර කරන්න. (ලකුණු 05 යි)

4. (i) සප්ත ආපත්තිස්කන්ධ අතරින් ගරුකාපත්ති ගණයට අයත් ඇවැත්කඳු දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මෛථුනධම්ම පාරාජිකාපත්තිය ලියා එහි අර්ථය ඉදිරිපත් කරන්න. (ලකුණු 03 යි)

(iii) උපසපන් භික්ෂූන් වහන්සේ නමකගේ භික්ෂුභාවය විෂයෙහි ප්‍රාතිමෝක්ෂ ශික්ෂා අතර පාරාජිකා ශික්ෂාවන්හි බලපෑම විස්තර කරන්න. (ලකුණු 05 යි)

## III කොටස

5. (i) 'න භජෙ පාපකෙ මිත්තෙ' යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)

(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. (ලකුණු 03 යි)

(iii) "පාපමිත්‍ර ආශ්‍රය නිසා වරදට යොමුවන වර්තමාන තරුණ පිරිස් වෙත කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්න." යන්නෙන් ලබාදෙන උපදේශය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

6. (i) සමථ භාවනාවට අදාළ කර්මස්ථාන ප්‍රභේද දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) දස අනුස්සති භාවනා අතුරින් දෙකක් නම් කොට ආනාපානසති භාවනාව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03 යි)

(iii) සමථ භාවනාව පුහුණු කිරීමෙන් පඤ්චනීවරණ ධර්ම යටපත් වන අයුරු දක්වා එහි ආනිසංස ලෙස පඤ්ච අභිඥා හා අෂ්ට සමාපත්ති ලබන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

7. (i) 'ඒකුප්පාද නිරෝධා ච-ඒකාලම්බන වත්ථුකා-චේතොයුත්තා ද්විපඤ්ඤාස - ධම්මා චේතසිකා මතා' මෙහි දැක්වෙන චෛතසික ලක්ෂණ හතර පෙන්වා දෙන්න. (ලකුණු 02 යි)

(ii) පනස් දෙකක් වූ චෛතසික ධර්ම රාශි වශයෙන් බෙදෙන කොටස් තුන ගෙනහැර දක්වන්න. (ලකුණු 03 යි)

(iii) සබ්බචිත්තසාධාරණ චෛතසික නම් කොට ඒවා එනමින් හැඳින්වීමට හේතු දක්වන්න. (ලකුණු 05 යි)

* * *

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 3 |
| 02. | 3 | 22. | 2 |
| 03. | 4 | 23. | 2 |
| 04. | 4 | 24. | 4 |
| 05. | 2 | 25. | 1 |
| 06. | 2 | 26. | 4 |
| 07. | 4 | 27. | 1 |
| 08. | 1 | 28. | 3 |
| 09. | 3 | 29. | 4 |
| 10. | 4 | 30. | 2 |
| 11. | 1 | 31. | 1 |
| 12. | 2 | 32. | 3 |
| 13. | 3 | 33. | 4 |
| 14. | 4 | 34. | 3 |
| 15. | 1 | 35. | 4 |
| 16. | 2 | 36. | 2 |
| 17. | 2 | 37. | 1 |
| 18. | 3 | 38. | 3 |
| 19. | 1 | 39. | 2 |
| 20. | 4 | 40. | 1 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40යි.**

**II පත්‍රය - කාලය : පැය 03යි**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය. ප්‍රශ්න හතකින් ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය

**I** කොටස - **පළමුවන** ප්‍රශ්නය අනිවාර්යය වේ. කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න **10** කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් ලකුණු **20** කි.

**II** කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **තුනකින්** සමන්විත වන අතර ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ ප්‍රශ්නවලින් බුද්ධ චරිතය, චරිත කතා, ශාසන ඉතිහාසය, විනය යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ලකුණු **20**කි.

**III** කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **තුනකින්** සමන්විත වන අතර ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ ප්‍රශ්නවලින් සූත්‍ර, භාවනා, අභිධර්මය, ධම්ම පදය හා මූලික ඉගැන්වීම් යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ.
එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ලකුණු **20** කි.

**II** පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 20 + 20 = 60

අවසාන ලකුණු ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණු | = | 100 |

## 1 ප්‍රශ්නය

**1.** **පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(i) **නව ලොව්තුරු දහම 'සන්දිට්ඨික' යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න.**

1) ආර්ය මාර්ගය සන්දිට්ඨික වන බව
2) නව ලොව්තුරා දහම ද තමාගේම ඥානයෙන් අවබෝධ කළ යුතු බැවිනි

**(ලකුණු 02යි)**

(ii) **බුදුගුණ අලංකාරයෙහි 'රහසක් පව් නොකොට කෙලෙසරයනුත් දුරුකොට' යන පදය පද දෙකින් පැවසෙන බුදුගුණය හා එහි අර්ථ ලියා දක්වන්න.**

අරහං බුදු ගුණය
රහසින්වත් පවු නොකිරීම හා කෙලෙස් සතුරන් නැසීම

**(ලකුණු 02යි)**

(iii) **රූප උපදවන හේතු රූප සමුට්ඨාන නමින් හැඳින්වේ. එයින් දෙකක් නම් කරන්න.**

i. කම්ම  ii. චිත්ත  iii. උතු  iv. ආහාර

**(ලකුණු 02යි)**

(iv) **දුක්ඛසමුදය ආර්ය සත්‍යය නම් වූ තණ්හාව කොටස් තුනකින් යුතු වේ. එයින් කාමතණ්හා හා භවතණ්හා දෙක හඳුන්වන්න.**

1) ඇස කණ නාසය දිව ශරීරය යන පංචේන්ද්‍රියන්ට විෂය වන රූප, ශබ්ද, ගන්ධ රස ස්පර්ශ යනාදිය පිළිබඳ ඇලීම කාම තණ්හාවයි.
2) භවය සදාකාලික ලෙස සිතීම භවයට ආශා කිරීම හා සදාකාලික ලෙස ජීවත් වීමට ආශා කිරීම භව තණ්හාවයි.

**(ලකුණු 02යි)**

(v) **සංඝාදිසේසාපත්තියකට පත් භික්ෂුවකට හෝ භික්ෂුණියකට කළ හැකි පිළියම් දෙකක් ඉදිරිපත් කරන්න.**

1) වස් සමාදානය
2) මානත් පිරීම
3) අබ්භාන කර්මය

**(ලකුණු 02යි)**

(vi) **ශ්‍රාවකයන් වහන්සේලා අතරින් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලැබූ අග්‍රස්ථානය නම් කොට එම තනතුර පිරිනැමීමට හේතු දක්වන්න.**

1) ධුතාංගධාරී භික්ෂූන් වහන්සේ අතර අග්‍රතනතුර ලැබීම.
2) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තෙලෙස් ධුතාංග සමාදන්ව සත් දිනක් පුහුදුන්ව සිට අටවැනි දින සිව්පිළිසිඹියා සහිතව මහරහත් බවට පත් වූහ. දිවි හිමියෙන්ම පිණ්ඩපාතයෙන් යැපීම, දිවි හිමියෙන් වනගතව විසීම ආදී දුෂ්කර පිළිවෙත් (ධුතාංග/දුෂ්කර ව්‍රත) සමාදන්වීම.

**(ලකුණු 02යි)**

(vii) **දුක පිළිබඳ පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අයත් අංග අතරින් 'අවිජ්ජා පච්චයා සංඛාරා - අවිද්‍යාව හේතුවෙන් සංස්කාර වේ' යන්නෙහි අවිජ්ජා හා සංඛාර හඳුන්වන්න.**

1) චතුරාර්ය සත්‍ය පිළිබඳ නොදැනීම අවිජ්ජා හෙවත් අවිද්‍යාව යි.
2) නිදොරින් රැස් කරන කුසල් හා අකුසල් සංඛාර හෙවත් සංස්කාරයි.

**(ලකුණු 02යි)**

(viii) නිධානයක ප්‍රයෝජන දක්වන බුදුරජාණන් වහන්සේ 'රාජතො වා දුරුත්තස්ස - චොරතො පීළිතස්ස වා' යන ගාථාපද දෙකින් දක්වා ඇති නිධානයකින් වළකන විපත්ති දෙක පෙන්වා දෙන්න.

1) රජුන්ගේ දණ්ඩනයෙන් මිදීම පිණිස.
2) සොර, සතුරු, පීඩාවකදී, ඔවුන්ගෙන් නිදහස් වීම පිණිස.

(ලකුණු 02යි)

(ix) 'ඒකං අත්ථපදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති - යමක් අසා රාගාදී කෙලෙසුන් සංසිඳේ නම් එබඳු අර්ථවත් එක් පදයක් වුවද අසන්නට ලැබීම උතුම් වේ.' මෙහි 'අත්ථපදං' යන්නෙන් අදහස් කරන දහම්පද වර්ග දෙකක් නම් කරන්න.

i. චතුරාර්ය සත්‍යය ii. පටිච්ච සමුප්පාදය
iii. සතර සතිපට්ඨානය iv. ස්කන්ධ, ධාතු, ආයතන, ආදිය.

(ලකුණු 02යි)

කර්මය, ත්‍රිලක්ෂණ, ආර්ය අෂ්ටාංගික මාර්ගය

(x) විනය පිටකයේ අන්තර්ගතය මුලින් ම බෙදා දක්වන මූලික බෙදීම් තුනෙන් දෙකක් ලියා දක්වන්න.

1) උභතො විභංග
2) ඛන්ධ
2) පරිවාර

(ලකුණු 02යි)
(මුළු ලකුණු 02×10 = 20යි)

## II කොටස

### 2වන ප්‍රශ්නය

**(i) බුදුරජාණන් වහන්සේගේ මහාකරුණා ගුණය ප්‍රකට කළ අවස්ථා දෙකක් නම් කරන්න.**

සුනීත සැඩොල් පුතු, දෙව්ලොව උපන් සැඩොල් ස්ත්‍රිය, මළකඳක බැඳ සිටි සෝපාක, හදවතිකා ඇතින්න, බණ ඇසුමට ගොස් ආහාර ලැබූ දුප්පතා, සෝවාන් වූ පේසකාර දුව, රජ්ජුමාලා මෙහෙකාරිය, තිස්ස භික්ෂුව, උදරාබාධයෙන් පෙළුණ භික්ෂුව මෙයින් අවස්ථා දෙකකි.

(ලකුණු 02යි)

**(ii) ඉහත (i) හි ඔබ විසින් සඳහන් කරන ලද එක් අවස්ථාවකට අදාළ කෙටි විස්තරයක් සපයන්න.**

I හි පිළිතුරට අනුව අවස්ථා එකක් විස්තර කොට තිබීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 03යි)

**(iii) කායිකව හා මානසිකව අසරණ බවට පත් වූ වික්ෂිප්ත මනසක් ඇතිව ක්‍රියාකළ ඇතැමුන්ගේ මනස ප්‍රකෘති ස්වභාවයට පත්කිරීම උදෙසා බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් දෙකක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න.**

- එකම පුතු මළ සොවින් තැවුණු කිසාගෝතමියට නොමළ ගෙදරකින් අබ මිටක් රැගෙන ඒමට යොමු කිරීම.
- ගුරුවරයාගේ නොමග යැවීමෙන් රුදුරු බවට පත් අංගුලිමාල දමනය කිරීම සඳහා "මහණ සිටුව" යැයි කී විට "මම සිටියෙමි. ඔබද සිටින්න" යැයි ප්‍රකාශ කිරීම.
- ජනපද කල්‍යාණිය විවාහ කර ගැනීමට සූදානමින් සිටි නන්ද කුමරු සෘද්ධියෙන් දිව්‍යලෝකයට කැඳවාගෙන ගොස් දෙවඟනන් පෙන්වීම.
- සිව් මසක් එක් ගාථාවක් පාඩම් කළත් පාඩම් කරගත නොහැකි වූ චූල්ලපන්ථක තෙරුන් කළකිරී ගෙදර යෑමට සූදානම් වූ අවස්ථාවේ 'රජො හරණං' යනුවෙන් පවසමින් කමටහන් ලබා දී රහත් බවට පත් කිරීම ආදී සිද්ධීන් අතරින් දෙකකි.

(ලකුණු 05යි)

උදාහරණ එකට ලකුණු 03
උදාහරණ දෙකටම ලකුණු 05

(මුළු ලකුණු 10යි)

## 3වන ප්‍රශ්නය

**(i) 19 වැනි සියවසේ අගභාගයේ ධර්ම - ශාස්ත්‍රීය හා ශාසනික පුනරුදයට දායක වූ නූතන යතිවරයන් වහන්සේලා දෙදෙනෙකු නම් කරන්න.**

හික්කඩුවේ සුමංගල නා හිමි, රත්මලානේ ධම්මාලෝක නා හිමි, හේන්පිටගෙදර ඥාණසීහ නා හිමි, පේරුකානේ චන්ද්‍රවිමල නා හිමි මෙයින් දෙදෙනෙකි.
(පෙළ පොතට සීමා කර ඇත)

**(ලකුණු 02යි)**

**(ii) ඉහත (i) හි ඔබ විසින් සඳහන් කරන ලද එක් යතිවරයන් වහන්සේ නමකගේ සේවාව අගයන්න.**

**I හි පිළිතුරට අදාළව පිළිතුරට සකස් ව තිබීම අපේක්ෂා කෙරේ.**

**(ලකුණු 03යි)**

**(iii) ධර්ම ශාස්ත්‍රීය පුනරුදයෙහි ලා නූතන යතිවරයන් වහන්සේලා ආරම්භ කළ පිරිවෙන් ආයතන දෙකක් ඇසුරින් ශාස්ත්‍රීය සේවාව විස්තර කරන්න.**

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි ආරම්භ කළ විද්‍යෝදය පිරිවෙන, රත්මලානේ ධම්මාලෝක නා හිමි ආරම්භ කළ විද්‍යාලංකාර පිරිවෙන, හේනපිටිගෙදර ඥාණසීහ නාහිමි ආරම්භ කළ රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන මේ අතරින් දෙකක් පදනම් කොට ශාස්ත්‍රීය සේවාව දක්වා තිබිය යුතුය.

**(ලකුණු 05යි)**

**පිරිවෙන් 1 ක් නම් ලකුණු 03**
**පිරිවෙන් 2ටම ලකුණු 05**

**(මුළු ලකුණු 10යි)**

## 4වන ප්‍රශ්නය

**(i) සප්ත ආපත්තිස්කන්ධ අතරින් ගරුකාපත්ති ගණයට අයත් ඇවැත්කඳ දෙක නම් කරන්න.**

i. පාරාජිකාපත්ති
ii. සංඝාදිසේසාපත්ති

**(ලකුණු 02යි)**

**(ii) මෙථුනධම්ම පාරාජිකාපත්තිය ලියා එහි අර්ථය ඉදිරිපත් කරන්න.**

යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීව සමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය, අන්තමසො තිරච්ඡානගතායපි පාරාජිකො හොති අසංවාසොති.

යම් භික්ෂුවක් භික්ෂූන් පිළිබඳ අධිශීල ශික්ෂාවන්ට පැමිණියේ උපසම්පදාව ප්‍රතික්ෂේප නොකොට දුර්වල බවද නොකියා යටත් පිරිසෙයින් තිරිසන් ගිය මාගමක් සමග ද මෛථුන්දම් සෙවී නම් පරිජි වූයේ වෙයි. උපසපන් භික්ෂූන් සමග සහවාසයට නුසුදුස්සෙකු වෙයි.
(පාලි පෙළට ලකුණු 01)

**(ලකුණු 03යි)**

**(iii) උපසපන් භික්ෂුවහන්සේ නමකගේ භික්ෂුත්වය විෂයෙහි ප්‍රාතිමෝක්ෂ ශික්ෂා අතර පාරාජිකා ශික්ෂාවන්හි බලපෑම විස්තර කරන්න.**

ප්‍රාතිමොක්ෂ ශික්ෂා අතර පාරාජිකාපත්ති ගරුකාපත්ති ගණයට අයත් වේ. ගරුකාපත්ති අතර පාරාජිකාපත්ති ඡේදගාමිණි ශික්ෂා වේ. සිදුිය ඇවතින් උපසම්පදාව හෙවත් භික්ෂුත්වය අහෝසි වේ. එවිට සාමණේරයෙකු ලෙස ජීවත් වීම හෝ ගිහි බවට පත් වී උපාසකයෙකු ලෙස කටයුතු කිරීමට සිදු වේ. මේ ඇසුරින් පිළිතුර සකස් වී තිබිම යුතුය.
(අර්ථයට ලකුණු 02)

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 20යි)**

**III කොටස**

**5වන ප්‍රශ්නය**

**(i) 'න භජේ පාපකෙ මිත්තෙ' යන ගාථාව සම්පූර්ණ කරන්න.**

න භජේ පාපකෙ මිත්තෙ - න භජේ පුරිසාධමෙ
භජේථ මිත්තෙ කල්‍යාණෙ - භජේථ පුරිසුත්තමෙ

**(ලකුණු 02යි)**

**(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න.**

පවිටු මිතුරන් ඇසුරු නොකරන්න. අධම හෙවත් ඉතා නරක පුද්ගලයන් ඇසුරු නොකරන්න. සත්පුරුෂ කල්‍යාණ මිතුරන් ඇසුරු කරන්න. සීලයෙන්, ගුණයෙන්, නුවණින් උතුම් පුරුෂයන් ඇසුරු කරන්න.

**(ලකුණු 03යි)**

**(iii) "පාප මිත්‍ර ආශ්‍රය නිසා වරදට යොමු වන වර්තමාන තරුණ පිරිස් වෙත කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්න" යන්නෙන් ලබාදෙන උපදේශය සාකච්ඡා කරන්න.**

පාපමිත්‍ර ආශ්‍රය නිසා පුද්ගලයා වරදට යොමු වේ. එය දුශ්චරිතයටත්, අකුසල් සිදු කිරීමටත් මගකි. සමාජය තුළ වැරදි කරන්නන් නීතියේ රැහැනට ගොදුරු වේ. පරලොව වශයෙන් සතර අපායගත වීමට හේතු වේ. එබැවින් කල්‍යාණමිත්‍ර ආශ්‍රය අගය කරයි. කල්‍යාණමිත්‍ර ආශ්‍රය නිසා පුද්ගලයා සුමගට යොමු වේ. එය සමාජ සුචරිතයට මගයි. මෙලොව වශයෙන් කීර්ති, ප්‍රශංසා ලැබීමට හේතු වේ. පරලොව වශයෙන් සුගතියෙහි උපත ලැබීමට ද හේතු වේ. මේ ඇසුරෙන් ප්‍රමාණවත් පිළිතුරක් සකස් වී තිබීම අපේක්ෂා කෙරේ.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**

**06වන ප්‍රශ්නය**

**(i) සමථ භාවනාවට අදාළ කර්මස්ථාන ප්‍රභේද දෙකක් නම් කරන්න.**

i. සබ්බත්ථ කම්මට්ඨාන
ii. පාරිහාරිය කම්මට්ඨාන

**(ලකුණු 02යි)**

**(ii) දස අනුස්සති භාවනා අතුරින් දෙකක් නම් කොට ආනාපානසති භාවනාව කෙටියෙන් හඳුන්වන්න.**

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දේවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති, කායගතානුස්සති, හා ආනාපානසති මෙයින් දෙකකි.
ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳව සිහිය පිහිටුවාගෙන සිත එකඟ කර ගැනීම ආනාපාන සති භාවනාවයි. මේ ගැන ප්‍රමාණවත් පිළිතුරක් අපේක්ෂිතයි.

නම් කිරීම ලකුණු 02
විස්තරයට ලකුණු 01

**(ලකුණු 03යි)**

**(iii) සමථ භාවනාව පුහුණු කිරීමෙන් පඤ්චනීවරණ ධර්ම යටපත් වන අයුරු දක්වා එහි ආනිසංස ලෙස පඤ්ච අභිඤ්ඤා හා අෂ්ට සමාපත්ති ලබන ආකාරය පෙන්වා දෙන්න.**

කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා යන ධර්මතා පහ නීවරණ ධර්මයි. සමථ භාවනාව වැඩීම තුළින් මේවා යටපත් වේ.

විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත ප්‍රථමජ්ඣාන සිත
විචාර පීති සුඛ එකග්ගතා සහිත ද්විතියජ්ඣාන සිත

පීති සුඛ එකග්ගතා සහිත තෘතියජ්ඣාන සිත
සුඛ එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන සිත යන රූපාවචර ධ්‍යාන හතරයි.

ආකාසානඤ්චායතන සිත, ආකිඤ්චඤ්ඤායතන සිත, විඤ්ඤාණඤ්චායතන සිත හා නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත යන අරූපාවචර ධ්‍යාන හතරයි.

ඉද්ධිවිධ ඤාණය, දිබ්බසෝත ඤාණය, පරචිත්ත විජානන ඤාණය, පුබ්බෙ නිවාසානුස්සති ඤාණය, දිබ්බචක්ඛු ඤාණය, පඤ්ච අභිඤ්ඤාවෝය.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**

07වන ප්‍රශ්නය

**(i) 'ඒකුප්පාද නිරෝධා ච-ඒකාලම්බන වත්‍ථුකා-චේතෝයුත්තා ද්වීපඤ්ඤාස - ධම්මා චෙතසිකා මතා' මෙහි දැක්වෙන් චෛතසික ලක්‍ෂණ හතර පෙන්වා දෙන්න.**

සිත සමගම ඉපදීම, සිත සමගම නැතිව යෑම.
සිතගත් අරමුණම ගැනීම, සිත සිටි තැනම සිටීම.

**(ලකුණු 02යි)**

**(ii) පනස් දෙකක් වූ චෛතසික ධර්ම රාශි වශයෙන් බෙදෙන කොටස් තුන ගෙනහැර දක්වන්න.**

i. අන්‍යසමාන රාශිය.
ii. අකුසල රාශිය (අශෝභන)
iii. සෝභන රාශිය (කුසල)

**(ලකුණු 03යි)**

**(iii) සබ්බචිත්තසාධාරණ චෛතසික නම් කොට ඒවා එනමින් හැඳින්වීමට හේතු දක්වන්න.**

ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර අනු නවයක් වූ සියලු සිත්වල මෙම චෛතසික සියල්ල යෙදේ. කුසල, අකුසල භේදයක් නැතිව සියලු සිත්වල එකසේ යෙදෙන බැවින් මේ සිතිවිලි හත සබ්බචිත්ත සාධාරණ නම් වේ.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2564 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020 (2021)** **03 S I**

**(03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය**

පැ. එකයි

සැලකිය යුතුයි :
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. බුදුරජාණන් වහන්සේ හිමිදිරියේ ම තමන් වහන්සේගෙන් පිහිට ලැබීමට අද කවරෙකු සුදුසු වන්නේ දැයි සමාපත්තියට සමවැදී විමසා බලන සේක. එසේ විමසා බලන්නේ තමන් වහන්සේගේ
   (1) මහා ප්‍රඥාවෙනි. (2) මහා කරුණාවෙනි.
   (3) අකම්පිත මහා ගුණයෙනි. (4) සැදී ගුණයෙනි.

2. බුදුරජාණන් වහන්සේ විය හැකි දේ සහ නොවිය හැකි දේ නිවැරදිව දන්නා සේක. එම හේතු අහේතු ඇති සැටියෙන් දන්නා බව
   (1) නානාධාතු පටිවේධ ඥානයයි. (2) නානාධිමුත්තික ඥානයයි.
   (3) සබ්බත්ථගාමිණී පටිපදා ඥානයයි. (4) ඨානාඨාන ඥානයයි.

3. බුදුරජාණන් වහන්සේට පමණක් සාධාරණ වූ ෂඩ් අසාධාරණ ඥාන අතර "ආසයානුසය ඥානය" ලෙස හඳුන්වන්නේ,
   (1) සියලු ධර්ම සමූහය නිරවශේෂ කොට දන්නා නුවණයි.
   (2) සංඛත, අසංඛත ධර්මයන් ආවරණ නොමැතිව දන්නා නුවණයි.
   (3) යහපත් අයහපත් අදහස් හා කෙලෙස් අනුසය දන්නා නුවණයි.
   (4) ඉන්ද්‍රියයන්ගේ පිසුණු බව, යහපත් හා අයහපත් බව දන්නා නුවණයි.

4. සිය මවට දේශනා කළ ධර්මය අසා සත්හැවිරිදි වියේ දී ම උතුම් රහත් ඵලයට පත් වූයේ,
   (1) සෝපාක කුමාරයා ය. (2) සුනීත කුමාරයා ය.
   (3) යස කුමාරයා ය. (4) රාහුල කුමාරයා ය.

5. සතරපද ගාථාවක් පාඩම් කර ගත නොහැකි වූ ඔබ සසුනේ කිස මුදුන් පමුණුවා ගන්නේ කෙසේ දැයි කියා සහෝදර භික්ෂුව විසින් විහාරයෙන් නෙරපූයේ
   (1) උදායි තෙරුන් ය. (2) මහාපන්ථක තෙරුන් ය.
   (3) චූලපන්ථක තෙරුන් ය. (4) ආනන්ද තෙරුන් ය.

6. අග්‍රශ්‍රාවක මුගලන් මහරහතන් වහන්සේ විසින් සිදු කරන ලද සුවිශේෂ කාර්යයන් අතරට අයත් නොවන්නේ,
   (1) නොමගට ගිය දේවදත්ත හිමිගේ පාක්ෂික භික්ෂූන් සුමගට ගැනීමයි.
   (2) නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීමයි.
   (3) දෙව්ලොව හා නිරයෙහි සැරිසරමින් එහි තතු මහජනයාට පැහැදිලි කිරීමයි.
   (4) ඉතා ගැඹුරු දහම් කරුණු සරලව මහජනයාට දේශනා කිරීමයි.

7. ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර සම්බුද්ධ ශාසනයේ අග්‍රස්ථානයට පත් මහාශ්‍රාවිකාවන් වහන්සේ,
   (1) උප්පලවණ්ණා තෙරණියයි. (2) ඛේමා තෙරණියයි.
   (3) භද්දකච්චානා තෙරණියයි. (4) පටාචාරා තෙරණියයි.

[ 2 වැනි පිටුව බලන්න.

8. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ට මෙරට උපසම්පදාව නැවත ඇති කිරීමේ මෙහෙවර සම්පූර්ණ කිරීමෙහිලා රාජ්‍ය අනුග්‍රහය ලබා දුන්නේ,
    (1) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ය. (2) ශ්‍රී විජය රාජසිංහ රජතුමා ය.
    (3) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය. (4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය.

9. "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො" යන ගාථාව විවරණය කරමින් අටුවාචාර්ය බුද්ධඝෝෂ මාහිමියන් විසින් රචිත ධර්ම ග්‍රන්ථය වන්නේ,
    (1) විමුත්තිමග්ගයයි. (2) විසුද්ධිමග්ගයයි. (3) කංඛාවිතරණියයි. (4) සුමංගලවිලාසිනියයි.

10. උපසම්පදා භික්ෂූන් පිළිබඳ විනය ශික්ෂාවන්හි පාරාජිකා ශික්ෂා අතර එන මෛථුනධම්ම පාරාජිකාපත්තියේ "සික්ඛං අපච්චක්ඛාය" ලෙස දක්වා ඇත්තේ,
    (1) ශික්ෂාව නොපිළිගැනීමයි. (2) ශික්ෂාව වෙනස් නොකිරීමයි.
    (3) ශික්ෂාව ප්‍රතික්ෂේප නොකිරීමයි. (4) ශික්ෂාව අත නොහැරීමයි.

11. භික්ෂු ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන්හි එන තෙලෙස් සංඝාදිසේස ආපත්ති, ගරුකාපත්ති ලෙස සැලකේ. ඒවා එසේ හැඳින්වෙන්නේ,
    (1) දේසනා පාරිසුද්ධියෙන් පිරිසිදු වියහැකි බැවිනි.
    (2) වත්සමාදානය ආදී පිළිවෙත් මාලාවකින් පිරිසිදු විය හැකි බැවිනි.
    (3) උපසම්පදාව සම්පූර්ණයෙන් නැති වී යන බැවිනි.
    (4) නැවත පිරිසිදු බවට පත්විය නොහැකි බැවිනි.

12. පැවිද්ද, උපසම්පදාව, පොහොය කිරීම, වස් විසීම, පවාරණය ආදී කරුණු පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ පැනවීම් ඇතුළත් වන්නේ,
    (1) මහාවග්ගපාළියේ ය. (2) චුල්ලවග්ගපාළියේ ය.
    (3) පාරාජිකපාළියේ ය. (4) පරිවාරපාළියේ ය.

13. දීඝනිකායේ සිගාලක සූත්‍රයේ ඇතුළත් ලාමක ධර්ම ගණනින්,
    (1) සතළොසකි. (2) සොළසකි. (3) තුදුසකි. (4) දොළසකි.

14. කටයුතු අඩාල වීමෙන් ධනය විනාශවීම් ආදියෙන් ජීවන ගමන ප්‍රමාද කරන සූදු ක්‍රීඩාවෙහි ආදීනව සිගාලක සූත්‍රයේ දක්වා ඇත. එහි "ජිතො විත්තමනුසොචති" යනුවෙන් දක්වන්නේ,
    (1) දිනුකල්හි පැරදුණු අයගේ වෛරය ඇති වන බවයි.
    (2) පැරදුණු කල්හි ධනය පිළිබඳ ශෝකය ඇති වන බවයි.
    (3) හිතමිතුරන් අතර පිරිහුණු කෙනෙකු වන බවයි.
    (4) තමා බලා සිටියදීම ධනය විනාශ වන බවයි.

15. 'නිද්දාසීලී', 'සභාසීලී', 'අනුට්ඨාතා', 'අලසො' යන පදයන්හි අර්ථ අනුපිළිවෙළට නිවැරදිව පෙළගස්වා ඇති වරණය තෝරන්න.
    (1) නිතර කතා කරන සුලු බව, උත්සාහයක් නැතිකම, අලස බව, නිතර නිදන සුලු බව
    (2) නිතර නිදන සුලු බව, උත්සාහයක් නැතිකම, අලස බව, නිතර කතා කරන සුලු බව
    (3) අලස බව, උත්සාහයක් නැතිකම, නිතර නිදන සුලු බව, නිතර කතා කරන සුලු බව
    (4) නිතර නිදන සුලු බව, නිතර කතා කරන සුලු බව, උත්සාහයක් නැතිකම, අලස බව

16. යමක් පිළිගැනීමට එකම පදනම නොවිය යුතු කරුණු දහයක් කාලාම සූත්‍රයේ දැක්වේ. එහි "මා භබ්බරූපතාය" යනුවෙන් දැක්වෙන්නේ
    (1) දහම් පොතපතට ගැළපේ යැයි නොපිළිගත යුතු බවයි.
    (2) මෙය මෙසේ විය හැකිය කියා නොපිළිගත යුතු බවයි.
    (3) න්‍යාය ධර්මයට ගැළපේ යැයි නොපිළිගත යුතු බවයි.
    (4) පිළිගත් දෘෂ්ටියට ගැළපේ යැයි නොපිළිගත යුතු බවයි.

17. අභිධර්මයේ-'රූප' විභාගයේ දී අටවිසිරූප පොදුවේ ලක්ෂණ අටකින් සමන්විත බව දක්වා තිබේ. ඒ 'අහේතුක' ලෙස දක්වා ඇත්තේ,
    (1) ලෝභමූල හා අලෝභමූලයන්හි යෙදීමක් නැති බැවිනි.
    (2) කම්ම, චිත්ත, උතු, ආහාර ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා බැවිනි.
    (3) චිත්ත චෛතසික මෙන් අරමුණු ගැනීමක් නැති බැවිනි.
    (4) රූප අරමුණුකොට ක්ලේශ හටගන්නා බැවිනි.

[ 3 වැනි පිටුව බලන්න.

18. අභිධර්මයේ රූප විභාගයේ දී 'ලක්ඛණ රූප' නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) කම්ම, චිත්ත, උතු, ආහාර
(2) පඨවි, ආපෝ, තේජෝ, වායෝ
(3) උපචය, සන්තති, ජරතා, අනිච්චතා
(4) රූප, සද්ද, ගන්ධ, රස

19. සියලු කෙලෙසුන් නසා මහරහත් බවට පත්වූ උතුමන් වහන්සේගේ රහත්බව හැඳින්වීමේ දී 'ඛීණං පුරාණං' යනුවෙන් දක්වන්නේ,

(1) නැවත ඉපදීමේ ඇල්මක් නැති බවයි.
(2) නැවත කර්ම රැස් කිරීමක් නැති බවයි.
(3) ඉපදීමේ කෙලෙස් බීජ නැති කළ බවයි.
(4) නැවත ඉපදීමට හේතු වන පැරණි කර්ම අවසන් කළ බවයි.

20. බුදුරජාණන් වහන්සේ ආයුවඩ්ඪන කුමාරයා දීර්ඝායුෂ ලැබීම අරමුණු කොට දේශනා කළ ගාථාවෙහි මුල් ගාථා අර්ධය වන්නේ,

(1) යො ච වස්සසතං ජීවෙ - දුස්සීලො අසමාහිතො
(2) අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධාපචායිනො
(3) මාසෙ මාසෙ සහස්සෙන - යො යජේථ සතං සමං
(4) යො ච වස්සසතං ජන්තු - අග්ගිං පරිචරෙ වනෙ

21. බුදුරජාණන් වහන්සේ බහුපුත්තිකා තෙරණින් වහන්සේ අරමුණුකොට දේශනා කළ "යො ච වස්සසතං ජීවෙ - අපස්සං ධම්මමුත්තමං" යන ගාථාවේ ධම්මමුත්තමං යන්නෙන් අදහස් කරන්නේ,

(1) නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයයි.
(2) නවාංගශාස්තෘ ශාසනයයි.
(3) සූත්‍ර පිටකයට අයත් ධර්මයයි.
(4) ධර්මරත්නයේ උතුම් ගුණ හයයි.

22. ධම්මපදයේ පාප වග්ගයේ හමුවන "අභිත්ථරෙථ කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ" යන ගාථාව දේශනා කොට වදාළේ,

(1) සෙය්‍යසක තෙරුන් වහන්සේට ය.
(2) ලාජා දෙවඟනට ය.
(3) ඒකසාටක බමුණාට ය.
(4) අනේපිඬු මහ සිටුතුමාට ය.

23. විපස්සනා හෙවත් ප්‍රඥා භාවනාවෙන් ලබාගත හැකි ලෞකික ප්‍රතිඵලයක් නොවන්නේ,

(1) ජරාවට පත්වීම ස්වාභාවික බව අවබෝධ කරගත හැකි වීමයි.
(2) භෞතික සම්පත් නිරන්තර විපරිණාමයට පත්වන බව අවබෝධ වීමයි.
(3) ජීවිතය සැමදා සිතන පතන අයුරින් නොපවතින බව අවබෝධ වීමයි.
(4) ධ්‍යාන සමාපත්ති මෙලොවදීම ලබාගත හැකි වීමයි.

24. හේතුඵල දහම ගස්වැල් සහිත ලෝකයෙහි ද, මිනිස් මනසෙහි ද එකසේ ක්‍රියාත්මක වේ. 'නියාම ධර්ම' පහක් ලෙස බුද්ධදහමේ සඳහන් වන්නේ ලෝකයේ ක්‍රියාත්මක මෙම ස්වභාවයයි. එම නියාම ධර්ම අතර ධම්ම නියාම ලෙස දක්වා ඇත්තේ,

(1) ලෝකයේ ස්වාභාවික වෙනස්කම් හේතුඵල අනුරූපව සිදුවීමයි.
(2) සිතෙහි ක්‍රියාකාරීත්වය හේතුඵල අනුරූපව සිදුවීමයි.
(3) හොඳ නරක කර්මයන්හි විපාක හේතුඵල අනුරූපව සිදුවීමයි.
(4) කාලගුණික වෙනස්කම් හේතුඵල අනුරූපව සිදුවීමයි.

25. ජනක කර්මයෙන් උපන් තැනැත්තාගේ කුසලාකුසල කර්ම විපාක ගෙනදීම සඳහා උපකාර කරන්නේ,

(1) උපපීලක කර්මයයි.
(2) උපඝාතක කර්මයයි.
(3) උපත්ථම්භක කර්මයයි.
(4) උපපජ්ජවේදනීය කර්මයයි.

26. කර්මය විපාක දෙන ආකාරය අනුව සතරාකාරයක් දැක්වේ. එහි අනුපිළිවෙළ දක්වා ඇති වරණය මින් කුමක් ද?

(1) ගරුක කර්ම, ආචිණ්ණ කර්ම, ආසන්න කර්ම, කටත්තා කර්ම
(2) ගරුක කර්ම, ආසන්න කර්ම, ආචිණ්ණ කර්ම, කටත්තා කර්ම
(3) ආචිණ්ණ කර්ම, ගරුක කර්ම, ආසන්න කර්ම, කටත්තා කර්ම
(4) ආසන්න කර්ම, ආචිණ්ණ කර්ම, ගරුක කර්ම, කටත්තා කර්ම

27. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ 'සම්මා කම්මන්ත' තුළින් පැහැදිලි වන්නේ,

(1) මිථ්‍යා සංකල්පයෙන් බැහැර වී නිවැරදි කල්පනාවෙන් යුක්ත වීමයි.
(2) වැරදි ක්‍රියාවෙන් බැහැර වී නිවැරදි කාය කර්මයෙන් යුක්ත වීමයි.
(3) වැරදි දිවි පැවැත්මෙන් බැහැර වී ධාර්මික ජීවනෝපායෙන් යුක්ත වීමයි.
(4) වැරදි දෘෂ්ටියෙන් බැහැර වී නිවැරදි දර්ශනයෙන් යුක්ත වීමයි.

[ 4 වැනි පිටුව බලන්න.

28. සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ ලක්දිවට වැඩමවීමේ ප්‍රමුඛතම අරමුණ වූයේ,
   (1) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීමයි.
   (2) ශිල්ප ශ්‍රේණි දහඅටක පිරිස රැගෙන ඒමයි.
   (3) භික්ෂුණීන් වහන්සේලා පිරිසක් දඹදිවින් වැඩමවීමයි.
   (4) භික්ෂුණී ශාසනය පිහිටුවීමට මූලිකත්වය ගැනීමයි.

29. ධාර්මික රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් වන 'දස සක්විතිවත්' පිළිබඳ සඳහන් වන්නේ,
   (1) දීඝනිකායේ සිගාලක සූත්‍රයේ ය. (2) දීඝනිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ ය.
   (3) දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය. (4) දීඝනිකායේ කූටදන්ත සූත්‍රයේ ය.

30. බුදුරජාණන් වහන්සේ දතයුතු සියලු ධර්මය වැරදීමකින් තොරව පරෝපදේශ රහිතව තමන් වහන්සේ විසින් ම අවබෝධ කොට වදාළ හෙයින්
   (1) අරහං නම් වන සේක. (2) විජ්ජාචරණ නම් වන සේක.
   (3) සුගත නම් වන සේක. (4) සම්මාසම්බුද්ධ නම් වන සේක.

31. ආර්ය සංඝරත්නයේ ගුණ ප්‍රකාශ වන පාඨයෙහි 'ඤායපටිපන්න' ලෙස දක්වා ඇත්තේ,
   (1) නිර්වාණාවබෝධය සඳහා වන ආර්ය ප්‍රතිපදාවට පිළිපන් බැවිනි.
   (2) පරලොව සුව පතා දෙන දුන්වන් පිළිගැනීමට සුදුසු වන බැවිනි.
   (3) සම්මා දිට්ඨි ආදී යහපත් ප්‍රතිපදාවන්ට පිළිපන් බැවිනි.
   (4) වැඳුම් පිදුම් ගරු සැලකිලි ලැබීමට සුදුසු වන බැවිනි.

32. ආසවට්ඨානීය ධර්ම පහළවීමත් සමග භික්ෂු ශාසනයේ විනය නීති පැනවීමේ අවශ්‍යතාව මතු විය. ආසවට්ඨානීය ධර්ම අතර "වෙපුල්ල මහත්තතා" යන්නෙන් අදහස් වන්නේ,
   (1) ලාභ ප්‍රයෝජන බහුල වීමයි. (2) බහුශ්‍රැතයන් බහුල වීමයි.
   (3) සංඝයා පිරිස වශයෙන් බහුල වීමයි. (4) පැවිදි වී කාලයක් ගත වූ භික්ෂූන් බහුල වීමයි.

33. උපසපන් භික්ෂුවක විසින් මැනවින් ආරක්ෂා කළ යුතු ශික්ෂා අතර 'අකරණීය ධර්ම' ලෙස දක්වා ඇත්තේ,
   (1) තෙළෙස් සංඝාදිසේසයන් ය. (2) සතර පාරාජිකාවන් ය.
   (3) අනියත ධර්ම දෙක ය. (4) පාචිත්තිය ධර්ම සිහ ය.

34. "කිසිවක් නිත්‍ය යැයි ප්‍රකාශ කිරීමට හැකියාවක් නැත." සංස්කාර ධර්ම අතර කියවෙන මෙම ස්වභාවය,
   (1) අනිත්‍යතාවයි. (2) දුක්ඛතාවයි. (3) අනාත්මතාවයි. (4) විපරිණාමයයි.

35. සත්ත්වයා සසරට බැඳ තැබීම සංයෝජන ධර්මයන්ගේ ස්වභාවයයි. එම සංයෝජනයන්ගෙන් මිදීමෙන් සසර දුකින් අත්මිදිය හැකි ය. සංයෝජන ධර්ම අතර සිත එක් අරමුණක තබාගත නොහැකි ස්වභාවය,
   (1) අවිජ්ජා නම් වේ. (2) කාමරාග නම් වේ. (3) උද්ධච්ච නම් වේ. (4) පටිඝ නම් වේ.

36. දෙවැනි ධර්ම සංගායනාව පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් වරණය තෝරන්න.
   (1) ධර්මාශෝක රජු, මොග්ගලිපුත්තතිස්ස තෙරුන්, කථාවත්ථුප්පකරණය
   (2) අජාසත්ත රජු, රජගහ නුවර, පංචසතිකා
   (3) කණිෂ්ක රජු, කුණ්ඩලවන විහාරය, මහා විභාෂා
   (4) කාලාශෝක රජු, දස අකැප වස්තු, යස තෙරුන්

37. දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වෙන ආකාරයට සියලු යහපත් ක්‍රියාවන්ගේ හෝ අයහපත් ක්‍රියාවන්ගේ පිනක් හෝ පවක් නැතැයි පවසමින් අක්‍රියවාදයක් ප්‍රකට කළ ශාස්තෘවරයා
   (1) මක්ඛලිගෝසාල ය. (2) පූරණකස්සප ය.
   (3) පකුධකච්චායන ය. (4) නිගණ්ඨනාතපුත්ත ය.

38. සම්බුද්ධ ශාසනයට සුවිසල් මෙහෙවරක් කළ ධර්මාශෝක මහ අධිරාජයා හිමි වූ මෞර්ය රාජවංශයේ ආරම්භක මහා නරේන්ද්‍රයා වූයේ,
   (1) චන්ද්‍රගුප්ත රජු ය. (2) සමුද්‍රගුප්ත රජු ය. (3) බින්දුසාර රජු ය. (4) ධනනන්ද රජු ය.

39. පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අයත් අංග අතර ඉන්ද්‍රිය, අරමුණු හා විඤ්ඤාණය එකට එක්වීම හඳුන්වා ඇත්තේ,
   (1) අවිජ්ජා ලෙස ය. (2) සළායතන ලෙස ය. (3) ඵස්ස ලෙස ය. (4) උපාදාන ලෙස ය.

40. අනුන්ගේ සම්පත්තිය දකින්නා වූ ද, අසන්නා වූ ද සත්පුරුෂයන්ගේ සිත්හි ඇතිවන්නා වූ සතුටුසහගත ස්වභාවය
   (1) කරුණා ගුණයයි. (2) මුදිතා ගුණයයි. (3) මෙත්තා ගුණයයි. (4) උපේක්ෂා ගුණයයි.

❋ ❋ ❋

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## 2564 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020 (2021)

**03 S II**

### (03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**I කොටසේ ප්‍රශ්නය ද II , III යන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

### I කොටස

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ශ්‍රාවක සංඝරත්නය 'සාමීචිපටිපන්නො' යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න.

(ii) පඨම සාරාණීය සූත්‍රයෙහි සඳහන් විශේෂයෙන් පැවිද්දන් විසිනුත්, අවිශේෂයෙන් සියල්ලන් විසිනුත් සිහිකළ යුතු ධර්ම අතරින් දෙකක් පෙන්වා දෙන්න.

(iii) 'උපසම්පදා' යන වචනයේ දළ අදහස ප්‍රකාශ කෙරෙන කරුණු දෙකක් ලියා දක්වන්න.

(iv) අශෝක රජතුමාගේ දේවිවරුන් අතරින් විදිසා දේවියගේ දරුවන් දෙදෙනාගේ නම් ලියන්න.

(v) බුද්ධකාලීන භාරතයේ විසූ ෂට් ශාස්තෘන් වහන්සේලා හැඳින්වීමට සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් 'සංඝීචෙව ගණී ච' යන්නෙහි අර්ථ දෙක දක්වන්න.

(vi) දුක්ඛ සංකල්පනාව ලොවට විෂය වන ආකාර තුන අතරින් දෙකක් ඉදිරිපත් කරන්න.

(vii) බුදුරජාණන් වහන්සේ සතු මානුෂික ගුණාංග, උත්තරීතර මානුෂික ගුණාංග ලෙස සැලකෙන 'අසමො අසමසමො' යන ගුණවාචක පද දෙකෙහි අදහස ලියා දක්වන්න.

(viii) "අනත්ථපදසංහිතා - නිවනට උපකාරයක් නොවන නිරර්ථක වාක්‍යවලින් යුක්ත" යන්නෙහි ඇතුළත් රාගාදී කෙලෙසුන් අවුස්සන ප්‍රබන්ධ වර්ග දෙකක් නම් කරන්න.

(ix) අටවිසි රූපකලාප අතර 'චක්ඛුප්පසාද' රූපයෙහිලා බලපාන ඇසේ ආකාර දෙක ලියන්න.

(x) "උට්ඨාන විරියාධිගතෙහි බාහාබල පරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි - ධම්මිකෙහි ධම්මලද්ධෙහි භොගෙහි" යන්නෙහි සඳහන්, උපයන ලද ධනය ධාර්මික විය යුතු බවට සාධක දෙකක් මතුකොට දක්වන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

### II කොටස

2. (i) බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකයකු ලෙස හැඳින්වීමට භාවිත වන සූත්‍ර සාහිත්‍යයේ සඳහන් යෙදුම් දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකත්වය ප්‍රකට කළ අවස්ථා තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) "බුදුරජාණන් වහන්සේ මිනිසාගේ ලෞකික ජීවිතය ශිල්පයෙන් හෝ ධනයෙන් පොහොසත් වීමටත් ගුණයෙන් ධාර්මික වීමටත් විවිධ සූත්‍ර දේශනාවලින් මග කියා දුන්හ." එබඳු සූත්‍ර දේශනා දෙකක් ඇසුරින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න. *(ලකුණු 05 යි)*

[2 වැනි පිටුව බලන්න.

3. (i) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලැබූ පැවිදි උපසම්පදාව නම් කොට, සම්බුද්ධ ශාසනයේ ශ්‍රාවකයන් වහන්සේලා අතරින් ලැබූ අගතනතුර දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) පිප්ඵලී මාණවකයා ගෘහස්ථ ජීවිතය ගත කළ ආකාරය දක්වා, වර්තමාන ගෘහස්ථ ජීවිත ගත කරන්නන් වෙත එයින් සැපයෙන ආදර්ශ පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(iii) සම්බුද්ධ ශාසනයෙහි ශ්‍රාවකයන් වහන්සේ නමක් ලෙස මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ ගුණමහත්වය ගෙනහැර දක්වා වර්තමාන භික්ෂු පරපුරට ඉන් ලබාදෙන ආදර්ශ සාකච්ඡා කරන්න. *(ලකුණු 05 යි)*

4. (i) 'පාරාජිකා' යන්නෙහි අදහස දක්වා, පාරාජිකාපත්තියකට පත් භික්ෂුවකගේ ස්වභාවය කවරකට උපමා කරන්නේ දැයි පෙන්වා දෙන්න. *(ලකුණු 02 යි)*

(ii) 'කාය සංසග්ග' සංඝාදිසේසාපත්තිය ලියා එහි අර්ථය ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) "සඤ්චරිත්ත සංඝාදිසේසාපත්තියේ" නිදානය දක්වා භික්ෂූන් වහන්සේ නමක පාපසමාචාර වීමේ ආදීනව විචාරයට ලක් කරන්න. *(ලකුණු 05 යි)*

## III කොටස

5. (i) 'සහස්සම්පි චෙ වාචා' යන ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) සැරියුත් තෙරුන් වහන්සේ අපරාධකරුවකු නිර්වාණ මාර්ගයට යැවූ තම්බදාඨික කථා පුවත ඉදිරිපත් කොට එයින් වර්තමාන සමාජයට ලබාදෙන පණිවුඩය සාකච්ඡා කරන්න. *(ලකුණු 05 යි)*

6. (i) "කම්මස්සකා මාණව සත්තා, කම්මදායාදා, කම්මයෝනි, කම්මබන්ධු, කම්මපටිසරණා, කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති." මෙහි අර්ථය ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) කර්මය යනු චේතනාපූර්වාංගම ක්‍රියාව බවට දේශිත නිබ්බෙධික සූත්‍ර පාඨයත්, එහි අර්ථයත් ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) බුදුදහම අනුව කර්මයෙහි දෙයාකාරය දක්වා, එසේ වීමෙහිලා බලපාන මනෝමූලික තත්ත්වය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

7. (i) සෝභන චෛතසික රාශියේ අප්පමඤ්ඤා චෛතසික දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) එම අප්පමඤ්ඤා චෛතසික දෙක නිර්වචන ඇසුරින් හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(iii) සෝභන සාධාරණ චෛතසික අතරින් 'හිරි' හා 'ඔත්තප්ප' චෛතසික දෙක හඳුන්වා, පුද්ගල සන්තානයෙහි පැවතිය යුතු එම චෛතසික ධර්ම දෙකෙහි නූතන සමාජ උපයෝගිතාව සාකච්ඡා කරන්න. *(ලකුණු 05 යි)*

* * *

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020 (2021)

## (03) ත්‍රිපිටක ධර්මය

- ❖ I පත්‍රයේ ප්‍රශ්න සියල්ලටමත්,
- ❖ II පත්‍රයේ I කොටසේ පළමුවන ප්‍රශ්නය ද II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

### ලකුණු බෙදීයාම

## I පත්‍රය

1. ප්‍රශ්නයේ සිට 40. ප්‍රශ්නය සඳහා ( ලකුණු 01 x 40 = 40 යි.)

- ලකුණු 40 යි

## II පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 1. ප්‍රශ්නය සඳහා ( ලකුණු 02 x 10 ) | - | ලකුණු 20 යි | - ලකුණු 20 යි |

### II කොටස

| | | | | |
|---|---|---|---|---|
| 2. ප්‍රශ්නය | | | | |
| (i) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 02 යි | |
| (ii) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 03 යි | |
| (iii) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 05 යි | - ලකුණු 10 යි |
| 3. ප්‍රශ්නය | | | | |
| (i) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 02 යි | |
| (ii) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 03 යි | |
| (iii) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 05 යි | - ලකුණු 10 යි |
| 4. ප්‍රශ්නය | | | | |
| (i) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 02 යි | |
| (ii) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 03 යි | |
| (iii) | ප්‍රශ්නය සඳහා | - | ලකුණු 05 යි | - ලකුණු 10 යි |

# III කොටස

5. ප්‍රශ්නය

(i) ප්‍රශ්නය සඳහා - ලකුණු 02 යි
(ii) ප්‍රශ්නය සඳහා - ලකුණු 03 යි
(iii) ප්‍රශ්නය සඳහා - <u>ලකුණු 05 යි</u> - ලකුණු 10 යි

6. ප්‍රශ්නය

(i) ප්‍රශ්නය සඳහා - ලකුණු 02 යි
(ii) ප්‍රශ්නය සඳහා - ලකුණු 03 යි
(iii) ප්‍රශ්නය සඳහා - <u>ලකුණු 05 යි</u> - ලකුණු 10 යි

7. ප්‍රශ්නය

(i) ප්‍රශ්නය සඳහා = ලකුණු 02 යි
(ii) ප්‍රශ්නය සඳහා - ලකුණු 03 යි
(iii) ප්‍රශ්නය සඳහා - <u>ලකුණු 05 යි</u> - ලකුණු 10 යි

**සමස්ත පිළිතුරු සඳහා = මුළු ලකුණු 100 යි.**

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020
## (නව නිර්දේශය)
## ලකුණු දීමේ පටිපාටිය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. | (2) | 21. | (1) |
| 2. | (4) | 22. | (3) |
| 3. | (3) | 23. | (4) |
| 4. | (1) | 24. | (1) |
| 5. | (3) | 25. | (3) |
| 6. | (4) | 26. | (2) |
| 7. | (2) | 27. | (2) |
| 8. | (3) | 28. | (4) |
| 9. | (2) | 29. | (3) |
| 10. | (3) | 30. | (4) |
| 11. | (2) | 31. | (1) |
| 12. | (1) | 32. | (3) |
| 13. | (3) | 33. | (2) |
| 14. | (2) | 34. | (1) |
| 15. | (4) | 35. | (3) |
| 16. | (2) | 36. | (4) |
| 17. | (1) | 37. | (2) |
| 18. | (3) | 38. | (1) |
| 19. | (4) | 39. | (3) |
| 20. | (2) | 40. | (2) |

( 01 x 40 = ලකුණු 40 යි )

## II පත්‍රය
## I කොටස

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**(i) ශ්‍රාවක සංඝරත්නය 'සාමීචිපටිපන්නො' යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න.**

- සංඝයා ඇප උපස්ථාන කර ගනිමින් සමගියෙන් සතුටින් පහසුවෙන් පැවිදි දිවිය ගෙවන බැවින් ද
- ආර්ය මාර්ගය සසර දුකින් මැහැරලීමට සමත්වන බැවින් ද
- මහසඟරුවන එම මාර්ගයට පිළිපන් බැවින් ද යනුයි.

**මෙයින් කරුණු දෙකකි.** ( ලකුණු 02 යි )

**(ii) පඨම සාරාණීය සූත්‍රයෙහි සඳහන් විශේෂයෙන් පැවිද්දන් විසිනුත්, අවිශේෂයෙන් සියල්ලන් විසිනුත් සිහිකළ යුතු ධර්ම අතරින් දෙකක් පෙන්වා දෙන්න.**

- සබ්‍රහ්මචාරීන් කෙරෙහි මෛත්‍රී සහගත කාය කර්මයෙන් යුක්ත විය යුතු බව
- මෛත්‍රී සහගත වාක් කර්මයෙන් යුක්ත වියයුතු බව
- මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් යුක්ත වියයුතු බව
- සිව්පසය සම්බන්ධයෙන් සබ්‍රහ්මචාරීන් සමග සාධාරණ භෝගී වියයුතු බව
- සබ්‍රහ්මචාරීන් හා සමාන වූ ආර්ය ශීලයෙන් යුක්ත වියයුතු බව
- සමාන සම්‍යක්දෘෂ්ටිකයන් වියයුතු බව

**මේ අතරින් දෙකකි.** ( ලකුණු 02 යි )

**(iii) 'උපසම්පදා' යන වචනයේ දළ අදහස ප්‍රකාශ කෙරෙන කරුණු දෙකක් ලියා දක්වන්න.**

- වගකීම් සහිත නියම භික්ෂුවයට එළඹවීම –
- සාමණේර බවින් ඔසවා තැබීම
- අධිශීලයට පත්වීම – [illegible] ( ලකුණු 02 යි )

[illegible]

**(iv) අශෝක රජතුමාගේ දේවිවරුන් අතරින් විදිසා දේවියගේ දරුවන් දෙදෙනාගේ නම් ලියන්න.**

මහින්ද කුමාරයා හා සංඝමිත්තා කුමරිය ( ලකුණු 02 යි )

[illegible]

**(v) බුද්ධකාලීන භාරතයේ විසූ ෂට් ශාස්තෘන් වහන්සේලා හැඳින්වීමට සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් 'සංඝීචෙව ගණී ච' යන්නෙහි අර්ථ දෙක දක්වන්න.**

- විශාල පැවිදි සමූහයක් ඇති
- පැවිදි ගණයා පෙරටු කොට විශාල පිරිසකට ආචාර්ය වූ යන්නයි ( ලකුණු 02 යි )

**(vi) දුක්ඛ සංකල්පනාව ලොවට විෂය වන ආකාර තුන අතරින් දෙකක් ඉදිරිපත් කරන්න.**

- දුක්ඛ දුක්ඛතා — සාමාන්‍ය දුක
- විපරිණාම දුක්ඛතා — වෙනස්වීම පිළිබඳ දුක
- සංඛාර දුක්ඛතා — සංස්කාර පිළිබඳ දුක

**මෙයින් දෙකකි** **( ලකුණු 02 යි )**

**(vii) බුදුරජාණන් වහන්සේ සතු මානුෂීය ගුණාංග, උත්තරීතර මානුෂීය ගුණාංග ලෙස සැලකෙන 'අසමො අසමසමො' යන ගුණවාචක පද දෙකෙහි අදහස ලියා දක්වන්න.**

- බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය මිනිසුන්ට සමකළ නොහැකි බැවින් අසමො නම් වේ.
- බුදුරජාණන් වහන්සේලා සමග පමණක් සම වන බැවින් අසමසමෝ නම් වේ.

**( ලකුණු 02 යි )**

**(viii) "අනත්ථපදසංහිතා තිවනට උපකාරයක් නොවන නිරර්ථක වාක්‍යවලින් යුක්ත" යන්නෙහි ඇතුළත් රාගාදී කෙලෙසුන් අවුස්සන ප්‍රබන්ධ වර්ග දෙකක් නම් කරන්න.**

- කාව්‍ය –
- ගීත –
- නාටක –
- කපන්දර –

**මෙයින් දෙකකි** **( ලකුණු 02 යි )**

**(ix) අටවිසි රූපකලාප අතර 'චක්ඛුප්පසාද' රූපයෙහිලා බලපාන ඇසේ ආකාර දෙක ලියන්න.**

- සසම්භාර චක්ඛු
- පසාද චක්ඛු — යනුයි.

**( ලකුණු 02 යි )**

**(x) "උට්ඨාන විරියාධිගතෙහි බාහාබල පරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මලද්ධෙහි භොගෙහි" යන්නෙහි සඳහන්, උපයන ලද ධනය ධාර්මික විය යුතු බවට සාධක දෙකක් මතුකොට දක්වන්න.**

- උට්ඨාන වීර්යයෙන් යුක්ත වීම
- දෑත දෙපයේ මහන්සියෙන් යුක්ත වීම
- දහදිය වගුරුවා හරිහම්බ කිරීම
- දැහැමි ක්‍රමවලින්, දැහැමිව ලබන ලද්දක් වීම

**මෙයින් දෙකකි** **( ලකුණු 02 යි )**

**(02 x 10 = මුළු ලකුණු 20 යි)**

II කොටස

2.

(i) බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකයකු ලෙස හැඳින්වීමට භාවිත වන සූත්‍ර සාහිත්‍යයේ සඳහන් යෙදුම් දෙකක් සඳහන් කරන්න.

- මග්ගවිදූ ~~[illegible]~~ මග්ගකෝවිද
- මග්ගඤ්ඤූ • මග්ගදස්සාවී

මෙයින් දෙකකි ( ලකුණු 02 යි )

(ii) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකත්වය ප්‍රකට කළ අවස්ථා තුනක් දක්වන්න.

- ධනයෙන් බලයෙන් පිරිපුන් රජදරුවන්ට, සිටුවරුන්ට මෙන්ම ඒකසාටක බමුණා වැනි දුබියන්ටත්,
- විවිධ මිනිස් ගුණ දහමින් හෙබි ගුණවතුන්ට මෙන්ම මිනිස් ගුණ දහමින් තොර තිරිසනුන් මෙන් ජීවත් වූ ගුණ හීනයන්ටත්,
- උපශාන්ත ගති පැවතුම් ඇත්තවුන්ට මෙන්ම අංගුලිමාල, ආලවක ආදී අශාන්ත, අදාන්තයන්ටත්,
- සිය දැන උගත්කමින්, මානයෙන් හිස උදුම්මාගත් සච්චක, බකබ්‍රහ්ම ආදීන්ටත්,
- කුලමානයෙන් උදම් වූ අග්ගික භාරද්වාජ, සුන්දරික භාරද්වාජ ආදීන්ටත්,
- කුල වාදයෙන් පීඩාවට පත් සුනීත, සෝපාක ආදීන්ටත්, [illegible handwriting]

යන මෙබඳු උදාහරණ තුනක් දක්වා තිබිය යුතුයි. ( ලකුණු 03 යි )

(iii) "බුදුරජාණන් වහන්සේ මිනිසාගේ ලෞකික ජීවිතය ශිල්පයෙන් මෙන් ම ධනයෙන් පොහොසත් වීමටත් ගුණයෙන් ධාර්මික වීමටත් විවිධ සූත්‍ර දේශනාවලින් මග කියා දුන්හ." එබඳු සූත්‍ර දේශනා දෙකක් ඇසුරින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න.

මංගල සූත්‍රය, පරාභව සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය, වෙළුද්වාර සූත්‍රය, පත්තකම්ම සූත්‍රය, අණන සූත්‍රය, වඩ්ඩි සූත්‍රය ආදී සූත්‍ර දේශනා ඇසුරෙන් මෙලොව දියුණුව, පරලොව දියුණුව හා ආධ්‍යාත්මික දියුණුව (නිර්වාණ) ට අදාළව කරුණු දක්වා තිබිය යුතුයි. [illegible handwriting]

[illegible handwriting] ( ලකුණු 05 යි )

**3.**

**(i) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලැබූ පැවිදි උපසම්පදාව නම් කොට, සම්බුද්ධ ශාසනයේ ශ්‍රාවකයන් වහන්සේලා අතරින් ලැබූ අගතනතුර දක්වන්න.**

ඕවාද පටිග්ගහණ උපසම්පදාව –

ධුතංගධාරීන් අතරින් අගතනතුර යනුයි. **( ලකුණු 02 යි )**

**(ii) පිප්ඵලී මාණවකයා ගෘහස්ථ ජීවිතය ගත කළ ආකාරය දක්වා, වර්තමාන ගෘහස්ථ ජීවිත ගත කරන්නන් වෙත එයින් සැපයෙන ආදර්ශ පෙන්වා දෙන්න.**

- මවුපිය බවදත් පිළිපැදීම, මව්පියන්ගේ සිත් නොරිදවා අවනතව ක්‍රියා කිරීම, (භද්‍රකාපිලානිය සමඟ විවාහ වීම) අවංකභාවයෙන් සිය අදහස් විවාහ වීමට පෙර සිය පෙම්වතියට ප්‍රකාශ කිරීම, ඉන්ද්‍රිය සන්තර්පනයෙහි ආසක්ත නොවීම, වස්තු තණ්හාවෙන් කටයුතු නොකිරීම, දෙමාපියන්ගේ අවැමෙන් සියලු වස්තුව කිරිදට හැරදී පැවිදි වීමට යෑම.

  **මේ ඇසුරින් පිළිතුර ලියා දැක්වීමට ලකුණු 01යි.**
  **වර්තමාන ගෘහස්ථයන්ට ලබාදෙන ආදර්ශ මතු කිරීමට ලකුණු 02යි.**

**( ලකුණු 03 යි )**

**(iii) සම්බුද්ධ ශාසනයෙහි ශ්‍රාවකයන් වහන්සේ නමක් ලෙස මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ ගුණමහත්වය ගෙනහැර දක්වා වර්තමාන භික්ෂු පරපුරට ඉන් ලබාදෙන ආදර්ශ සාකච්ඡා කරන්න.**

- උත්තම ශ්‍රාවකයෙකු ලෙස ශ්‍රාවක භාවය ප්‍රකට කරමින් තෙවැනි ශ්‍රාවකයන් වීම
- සිවුපිළිසිඹියාපත් අර්හත්වය සාක්ෂාත් කිරීම
- ධුතංගධාරීන් අතරින් අගතනතුරු ලබා ධුතංග සම්පූර්ණ කිරීම
- දිවිහිමියෙන් පිණ්ඩපාතයෙන් විසීම
- දිවිහිමියෙන් ආරණ්‍යකව විසීම
- සප්ත මහා පුරුෂ ලක්ෂණවලින් යුක්ත වූ නිසා බුදුරදුන්ට සමාන ලක්ෂණ ඇතැයි සලකා වනගතව නිහතමානීව වාසය කිරීම

**යන ගුණ මහත්වයට ලකුණු 03යි.**

- භික්ෂූන් වහන්සේ ප්‍රතිපත්තිගරුක වියයුතු බව
- සීලවන්තයෙකු වියයුතු බව
- ආධ්‍යාත්මිකව දියුණු වියයුතු බව
- ප්‍රඥාව දියුණු කොට අභිඥා - ධ්‍යාන, මාර්ග හා මාර්ගඵල ලැබිය යුතු බවට කටයුතු කිරීම
- අනභිමානීව ක්‍රියා කිරීම
- අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා ආදී ගුණවලින් යුක්ත විය යුතු බව ආදිය ආදර්ශ ලෙස සැලකිය හැකිය.

**මේ සඳහා ලකුණු 02 යි.** **(ලකුණු 03 + 02 = 05 යි)**

4.

(i) **'පාරාජිකා' යන්නෙහි අදහස දක්වා, පාරාජිකාපත්තියකට පත් භික්ෂුවකගේ ස්වභාවය කවරකට උපමා කරන්නේ දැයි පෙන්වා දෙන්න.**

- පාරාජිකා වූයේ වෙයි. පිරිහුණේ වෙයි. ශ්‍රමණභාවයට වරම් නොලබන්නේ වෙයි. පැරදුණේ වන්නේය. මෙයින් කුමන හෝ අදහසක් දැක්වීම ප්‍රමාණවත් ය.
- තාල වර්ගයේ ගසක එහි කරටිය සිඳී ගිය කල්හි නැවත නොවැඩෙන්නා සේ යන්න හෝ
  හිසසුන් පුරුෂයෙකු ජීවත් වීමට වරම් නොලබන්නා සේ යන්නයි.

( ලකුණු 02 යි )

(ii) **'කාය සංසග්ග' සංඝාදිසේසාපත්තිය ලියා එහි අර්ථය ගෙනහැර දක්වන්න.**

යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය, හත්ථගාහං වා වෙණිගාහං වා, අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අංගස්ස පරාමසනං සංඝාදිසෙසො ති ( ලකුණු 01 යි )

කිසියම් භික්ෂුවක් රාගයට බැස රාගයෙන් පෙරළුණු සිතින් මාගමක් සමඟ අත ගැනීම හෝ, කෙස්වැටිය ගැනීම හෝ අනෙක් අවයවයක් හෝ ස්පර්ශ කිරීම යන ආකාරයකින් කයින් ස්පර්ශ කිරීමකට පත් වේ නම් සංඝාදිසේසාපත්ති වෙයි. ( ලකුණු 02 යි )

( ලකුණු 02 + 01 = 03 යි )

(iii) **"සඤ්චරිත්ත සංඝාදිසේසාපත්තියේ" නිදානය දක්වා භික්ෂූන් වහන්සේ නමක පාපසමාචාර වීමේ ආදීනව විචාරයට ලක් කරන්න.**

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වාසය කරන සමය යි. උදායි තෙරුන් වහන්සේ බොහෝ ගිහි කුලයන් සමඟ කුළුපගව වාසය කරති. මේ හිතවත්කම නිසාම ඒ ඒ කුලයන්හි වසන හිමියා මළ කාන්තාවන් හෝ කුල කුමරියන් හෝ පිළිබඳව වෙනත් කුලයන්හි තරුණයන් හමුව තොරතුරු පවසති. නැතහොත් එම තරුණයන්ගේ මව්පියන් හමුවේ පවසති. එම ගුණකථන අසා පැහැදුණු ඇතැම්හු "අපි ඔවුන් නොහඳුනන්නෙමු" ඔබ වහන්සේ මේ විවාහය පිළිබඳ තොරතුරු කියා ඉටුකර දෙන්නැයි කියති. උදායි තෙරුණුවෝ එසේ කුල නිවෙස් වෙත ගොස් පණිවිඩ කියා විවාහ කරදෙති.

මෙකල එක් පුරාණ ගණකයකුගේ බිරියකට රූමත් දියණියක් වූවාය. ඇය පතා පැමිණි ආජීවක ශ්‍රාවකයෝ ගණකිය හමු වී ඔබගේ දියණිය අප පුතණුවන්ට විවාහ කර දෙන්නැයි කීහ. ඔවුන් නොහඳුනන බැවින් ගණකිය අකමැති විය. ඒ බව ආජීවක ශ්‍රාවක පිරිස උදායි තෙරුන්ට පවසා උන්වහන්සේගේ මාර්ගයෙන් විවාහය කර ගත්හ.
මේ පුවත සැලවීමෙන් මහජනයා අතර භික්ෂූන් වහන්සේ පිළිබඳව විරෝධයක් ඇති විය. එය මුල්කොට බුදුරදුන් විසින් මෙම ශික්ෂාව පනවන ලදී. ( ලකුණු 02 යි )

<u>පාපසමාචාර වීමේ ආදීනව</u>

- භික්ෂූන් වහන්සේ කුල සංග්‍රහ පිණිස කැප භූමියක හෝ අකැප භූමියක මල්පැල සිටුවීම, රෝපණය කරවීම, ඒවාට පැන් ඉසීම, මල් නෙලීම, මල්දම් ගෙතීම ආදි ක්‍රියා පාපසමාචාර ක්‍රියාලෙස සැලකේ.

- භික්ෂූන් වහන්සේ කුලයන්හි විවාහ ආවාහ වීම සඳහා තොරතුරු ගෙන යෑමත්, ඒ අනුව විවාහ සම්බන්ධතා ගොඩනැගීමත්, ඊට මැදිහත්ව පණිවුඩකරුවකු ලෙස ක්‍රියා කිරීම පාපසමාචාර වීමකි.

- මේ නිසා ගිහි ජනතාව පාපසමාචාරී භික්ෂූන් වහන්සේ හා සෙසු භික්ෂූන් වහන්සේලා සම තත්වයෙන් කල්පනා කිරීම.

- ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේ (පාප සමාචාර නොවූ) වෙත අගෞරවයෙන් සැලකීම හා කථා කිරීම.

- පාප සමාචාර භික්ෂූන් වහන්සේ ඡන්ද, ද්වේශ, භය, මෝහ යන සතර අගතියට පත්වීම.
- අගතිගාමී භික්ෂූන් වහන්සේ සිල්වත්, ගුණවත් උතුමන් වෙත අභියෝගාත්මකව නැගී සිටීම.

**මේ ආදි කරුණුවලින් පිළිතුර ගොඩනගා තිබිය යුතුයි.** ( ලකුණු 03 යි )
( ලකුණු 03 + 02 = 05 යි )

## III කොටස

5.

(i) **'සහස්සම්පි චෙ වාචා' යන ගාථාව සම්පූර්ණ කරන්න.**

සහස්සම පි චෙ වාචා - අනත්ථපද සංහිතා
ඒකං අත්ථපදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති

( ලකුණු 02 යි )

(ii) **එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න.**

නිවනට උපකාරයක් නොවන නිරර්ථක වාක්‍යවලින් යුක්ත, වැකි දහසකට වඩා යමක් අසා කෙලෙසුන් සන්සිඳේ නම් එබඳු අර්ථවත් එක් පදයක් වුවද අසන්නට ලැබීම උතුම් වේ.

( ලකුණු 03 යි )

(iii) **සැරියුත් තෙරුන් වහන්සේ අපරාධකරුවකු නිර්වාණ මාර්ගයට යැවූ තම්බදාඨික කථා පුවත ඉදිරිපත් කොට එයින් වර්තමාන සමාජයට ලබාදෙන පණිවුඩය සාකච්ඡා කරන්න.**

රජගහ නුවර පන්සියයක සොර මුලක් විය. දිනක් තඹපාට දැලි රැවුලක් ඇති තම්බදාඨික නමැත්තා සොර මුලට එක් වන්නට පැමිණ අවසර පැතීය. පුද්ගලයන් ගැන හොඳ අවබෝධයක් තිබූ සොර දෙටුවා මොහු මාපියන් වුවත් පාවාදෙන තරම් දුෂ්ටයෙකු යැයි සලකා ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. කෙසේ හෝ ඔහු සොරුන්ගේ සිත්ගෙන සොරමුලට එක්විය. මෙ අතර රජයේ රාජපුරුෂයෝ සොරුන් අල්ලා රාජ්‍යයේ අධිකරණයට ඉදිරිපත් කළහ. අධිකරණය සොරුන් සියලු දෙනාගේ හිස පොරොවෙන් ගසා දමන ලෙස නියෝග කළේය. රාජපුරුෂයෙන් සොරුන් ඝාතනය කරන්නෙක් ඔවුන් අතරින්ම සොයා ගැනීමට කල්පනා කළහ. එහෙත් කිසිවෙකුත් ඉදිරිපත් නොවීය. අන්තිමේ දී ඉදිරිපත් වන්නාට නිදහසත්, සම්මානත්, ලබාදෙන බව දැන්විය. හාරසිය අනූනව දෙනෙකු ම ඊට අකමැති වුවත් අවසානයේ තම්බදාඨික නමැත්තා එය භාර ගත්තේය. හෙතෙම සොරුන් සියලුදෙනා පොරොවෙන් ගසා මරාදමා නිදහසත්, සම්මානත්, දිනා ගත්තේය. එතැන් සිට රාජපුරුෂයන්ගේ නියමයෙන් අලුගෝසු තනතුරු දැරීය. වියපත් වූ පසු ඔහුව ධුරයෙන් නෙරපන ලදී. ඊට පසු පිළිවෙළකට හඳින්නට, පිරිසිදුව සිටින්නටත් හිසකෙස් රැවුල් කපාදමා නා ප්‍රසන්න තැනැත්තෙකු බවට පත්විය. දිනක් ගිතෙල් මිශ්‍ර කිරි කැඳක් සාදා බොන්නට සූදානම් වූ අවස්ථාවේ මොහුගේ පෙර කරන ලද පින් බලය බලවත් වී සැරියුත් තෙරුන් වහන්සේගේ දිවැස් නුවණට ගැටිණ. සැරියුත් තෙරුන් වහන්සේ ඔහුට පිහිට වීමට වැඩම කළහ. සැරියුත් තෙරුන් දැක තම්බදාඨික බලවත් සතුටට පත්ව උන් වහන්සේට අසුන් පනවා වඩා හිඳවා කැඳ පිළිගැන්විය.

කැඳ වළඳා පුණ්‍යානුමෝදනා කළත් තම්බදාඨික නමැත්තාගේ බලවත් වූ අකුසල කර්ම හේතුවෙන් අපරාධ සිහිපත් වීමෙන් ඔහුට සිත සනසා ගැනීමට නොහැකි විය. එහිදී සැරියුත් තෙරුන්ගේ අනුශාසනාව අසා සෝවාන් මාර්ගයට ආසන්න අනුලෝමික ඥානය උපදවා ගත්තේය.

( ලකුණු 03 යි )

<u>සමාජයට ලබා දෙන පණිවුඩය</u>

- පාපයෙන් වැළකී ක්‍රියා කළයුතු බවටත්,
- නැවත නැවත පින් දහම් කළයුතු බවටත්,
- එසේ කරන ලද පිනේ පුණ්‍ය ශක්තිය කවදා හෝ විපාක දෙන බැවින් පින්දහම් කළයුතු බවටත්,

සමාජයට පණිවුඩයක් ලබා දෙයි. ( ලකුණු 02 යි )

( ලකුණු 03 + 02 = 05 යි )

6.

(i) **''කම්මස්සකා මානව සත්තා, කම්මදායාදා, කම්මයෝනි, කම්මබන්ධූ, කම්මපටිසරණා, කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති.'' මෙහි අර්ථය ලියා දක්වන්න.**

මානවකය, සත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. කර්මය උරුම කොට ඇත්තාහ. කර්මයෙන් හට ගත්තාහුය. කර්මය ඥාතිකොට ඇත්තාහුය, කර්මය පිළිසරණ කොට ඇත්තාහුය, කර්මය සත්වයා උස් පහත් වශයෙන් බෙදා දක්වන්නේය. යනුයි.

( ලකුණු 02 යි )

(ii) **කර්මය යනු චේතනාපූර්වාංගම ක්‍රියාව බවට දේශිත නිබ්බේධික සූත්‍ර පාඨයත්, එහි අර්ථයත් ලියන්න.**

චේතනාහං භික්ඛවේ කම්මං වදාමි චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා.

( ලකුණු 02 යි )

මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ කර්ම කෙරෙයි.

( ලකුණු 01 යි )

( ලකුණු 02 + 01 = 03 යි )

(iii) **බුදුදහම් අනුව කර්මයෙහි දෙයාකාරය දක්වා, එසේ වීමෙහිලා බලපාන මනෝමූලික තත්ත්වය පැහැදිලි කරන්න.**

කර්මය දෙයාකාරයකි.

එනම් කුසල කර්ම හා අකුසල කර්ම යනුයි. ( ලකුණු 02 යි )

කුසල කර්ම හා අකුසල කර්ම වෙන් වෙන්ව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ද බුදුදහමේ දක්නට ලැබේ. කිසියම් කුසල කර්මයක් කිරීමේ දී චේතනාව අලෝභ, අදෝස, අමෝහ යන කුසල මූලයකින් පිවිතුරුව පැවතියේ නම් එම කායික, වාචසික හා මානසික ක්‍රියා කුසල කර්ම වේ.

චේතනාව ලෝභ, දෝස, මෝහ යන අකුසල මූලයකින් දූෂිතව පැවතියේ නම් එම ක්‍රියා කායික, වාචසික හා මානසික ක්‍රියා අකුසල ක්‍රියා වේ.

මනෝ මූලික තත්ත්වය වන්නේ අලෝභ, අදෝස, අමෝහ යන කුසල මූලික සිතිවිලි වලින් ද ලෝභ, දෝස, මෝහ යන අකුසල මූලික සිතිවිලිවලින් ද කර්ම සිදු කරයි. එය මනෝ මූලික තත්වයයි.

( ලකුණු 03 යි )

( ලකුණු 02 + 03 = 05 යි )

7.

(i) **සෝභන චෛතසික රාශියේ අප්පමඤ්ඤා චෛතසික දෙක නම් කරන්න.**

1. කරුණා
2. මුදිතා

( **ලකුණු** 02 යි )

(ii) **එම අප්පමඤ්ඤා චෛතසික දෙක නිර්වචන ඇසුරින් හඳුන්වන්න.**

**කරුණා**
පරදුක්ඛෙ සති සාධූනං හදය බෙදං ජනෙතීති කරුණා සා පරදුක්ඛාපනයන කාමතා ලක්ඛණා.

අනුන්ගේ දුකෙහි දී සත්පුරුෂයන්ගේ හදවතේ ඇතිවන අනුකම්පාව කරුණාවයි. තමා දුකින් මිදීමට කැමැත්තක් දක්වන්නා සේම අනුන්ද දුකින් මුදවාලීමේ කැමැත්ත එහි විශේෂත්වයයි.

**මුදිතා**
මොදන්ති එතායාති මුදිතා සා පරසම්පත්ති අනුමෝදන ලක්ඛණා.

තමන්ට යම් සම්පත්තියක් ලැබුණහොත් සතුටු වන්නාක් මෙන් අනුන්ට ලැබෙන සැප දැක සතුටුවීම මුදිතාවයි. අනුන්ගේ සම්පත් දැක බොහෝ දෙනා ඊර්ෂ්‍යා උපදවත්. එයට විරුද්ධ වූයේ මුදිතාවයි.

**නිර්වචන දෙකට ලකුණු** 02යි.
**එහි අර්ථ දැක්වීමට ලකුණු** 01යි.

( **ලකුණු** 02 + 01 = 03 යි )

(iii) **සෝභන සාධාරණ චෛතසික අතරින් "හිරි" හා "ඔත්තප්ප" චෛතසික දෙක හඳුන්වා, පුද්ගල සන්තානයෙහි පැවතිය යුතු එම චෛතසික ධර්ම දෙකෙහි ප්‍රායෝගික සමාජ උපයෝගිතාව සාකච්ඡා කරන්න.**

**හිරි**

හිරියති කාය දුච්චරිතාදීහි ජිගුච්ඡතීති හිරි

වරදෙහි ලැජ්ජාවන කුල කාන්තාවක මෙන් කාය දුශ්චරිතාදී පාපයන්ට ඇති ලජ්ජා සහගත බවයි. සත්පුරුෂයෝ අකුසල් කිරීමට ලජ්ජාවෙති. ජීවිතයේ සාමාන්‍යයෙන් ඇතිවන ලජ්ජා සහගත බවද හිරි නමින් ගැනෙන අතර මෙහිදී විශේෂයෙන් අකුසල් කිරීමට ඇති ලජ්ජාව ගැනේ.

**ඔත්තප්ප**

ඔත්තප්පතීති ඔත්තප්පං පාපකෙහා උත්තාසලක්ඛණං

පාපයට බියවන තැතිගන්නා ස්වභාවයයි. හිරි සහ ඔත්තප්ප දෙක ඇතිවිට පාපයෙන් වළකින හෙයින් ලොව පාලනය කරන ධර්මතා දෙකක් ලෙස සැලකේ. කරුණු හතරක් පදනම් කරගෙන බිය ඇති වේ.

අත්තවාද භය

පරානුවාද භය

දණ්ඩ භය

දුග්ගති භය

යනු ඒ හතරයි. මේ නිසා බියෙන් වැළකේ.

( ලකුණු 01 + 01= 02 යි )

වර්තමාන සමාජයේ පුද්ගලයා පාපයට ඇති ලැජ්ජාවෙන් ද පාපයට ඇති බියෙන් ද දුරස්තව ඇති බව පෙනේ. පුද්ගලයා වේගයෙන් ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිථ්‍යාචාරවල යෙදෙන බවත් බොරුව, කේලාම් කීම, පිස්වචන හා පරුෂවචනයෙන් යුක්තව සමාජය මුලාකරන, රවටන වචන භාවිතයට නැඹුරු වී ඇති බවත්, විෂම ලෝභය, අනුන් නැසීමේ චේතනාව හා මිථ්‍යාදෘෂ්ටිකව අකුසල මූලික මනෝභාවයන්ගෙන් දූෂිතව ක්‍රියා කරන බවත් පෙනේ.

එබැවින් පුද්ගලයාට දස අකුසලින් මිදීමටත්, නිරවුල් ආත්මභාවයක් පවත්වා ගැනීමටත් බොහෙවින් උපකාර වන්නේ හිරි, ඔත්තප්ප යන ලැජ්ජාව හා පාපයට ඇති බියයි. පාපයෙන් මිදීමට හා මුදවා ගැනීමට මේ ධර්මතා දෙකෙහි උපයෝගීතාව ප්‍රබල බවත් පෙන්වා දී තිබිය යුතුයි.

( ලකුණු 03 යි )

( ලකුණු 02 + 03 = 05 යි )

* * * *

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2565 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2021(2022)** | 03 | S | I |

**(03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය**

පැ. එකයි

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. බුදුරජාණන් වහන්සේ හැඳින්වීම සඳහා 'මග්ගවිදූ, මග්ගකොවිද, මග්ගඤ්ඤූ' යන පද භාවිත කරයි. එසේ භාවිත කරන්නේ,
   (1) අතිවිශාල අනුගාමික පිරිසක් සිටි බැවිනි. (2) අධිපතියකු සේ කටයුතු කළ බැවිනි.
   (3) සියල්ලන්ට මාර්ගෝපදේශකයකු වූ බැවිනි. (4) ආචාරශීලී ඇවතුම් පැවතුම් ඇති බැවිනි.

2. බුදුරජාණන් වහන්සේගේ අසමසම දසබල ඥාණ අතුරින් සත්ත්වයන් සුගති දුගති භවයන්ට පැමිණෙන්නා වූ ද රහත් බව ආදී තත්ත්වයන්ට පැමිණෙන්නා වූ ද පිළිවෙත් සියලු ආකාරයෙන් දැනගත්තේ,
   (1) නානාධාතු පටිවේධ ඥාණයෙනි. (2) සබ්බත්ථගාමිණී පටිපදා ඥාණයෙනි.
   (3) පුබ්බේ නිවාසානුස්සති ඥාණයෙනි. (4) නානාධිමුත්තික ඥාණයෙනි.

3. බුදුරජාණන් වහන්සේ මහාපුරුෂ ලක්ෂණ දෙතිසකින් යුතු වන සේක. ඉන් 'උස්සංඛ පාදො හොති' යන්නෙන් අදහස් වන්නේ,
   (1) දැල් කවුළු වැනි අත් පා ඇති බව ය. (2) ඉඳු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇති බව ය.
   (3) දූවිලි නොරඳන සියුම් සම ඇති බව ය. (4) ඉහළින් පිහිටි ගොප් ඇටය සහිත පා ඇති බව ය.

4. අංගුලිමාල ආනන්තරිය පාපකර්මයක් සිදු කර අපායගත වන බව දුටු තථාගතයන් වහන්සේ ඔහුට පිහිට පිණිස වැඩම කළහ. එසේ ආනන්තරිය පාපකර්මයක් සිදු කර ගැනීමට සූදානම් වූයේ,
   (1) මිනිසුන් දහසක් මරා ඇඟිලි දහස සම්පූර්ණ කර ගැනීමෙනි.
   (2) සිය මෑණියන් මරණයට පත් කිරීමෙනි.
   (3) බුදුරදුන්ගේ සිරුරෙහි ලේ සෙළවීමෙනි.
   (4) කොසොල් රජු ඇතුළු පිරිවර මරා දැමීමෙනි.

5. ත්‍රිවිධ රත්නයේ උතුම් රත්නභාවයට හේතු වන කරුණු අතර 'අනොමසත්ත පරිභොගං' යන්නෙන් අර්ථවත් වන්නේ,
   (1) උසස් පුද්ගලයන් විසින් පරිහරණය කිරීමයි. (2) කලාතුරකින් දක්නට ලැබීමයි.
   (3) කිසිවකට සමාන නොවීමයි. (4) ඉතා අගනා බවයි.

6. ශ්‍රී සද්ධර්මයේ උතුම් ගුණ අතර 'ඕපනයික' ගුණයෙන් කියවෙන්නේ,
   (1) තමා විසින් ම අවබෝධ කරගත යුතු බව ය.
   (2) තමාට මෙලොවදීම අත්දැකිය හැකි බව ය.
   (3) මාර්ග ඵල ධර්ම ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිර්වාණයට පමුණුවන බව ය.
   (4) එව බලව යැයි විවෘතව කිව හැකි බව ය.

7. ගෞතම සම්බුද්ධ ශාසනයේ ධම්මසේනාපති ලෙස ගරු බුහුමන් ලැබුයේ,
   (1) සැරියුත් මහරහතන් වහන්සේ ය. (2) මුගලන් මහරහතන් වහන්සේ ය.
   (3) ආනන්ද මහරහතන් වහන්සේ ය. (4) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.

[ 2 වැනි පිටුව බලන්න.

8. දිනපතා පොහොය ගෙය ඇමද පහන් දල්වා එම පහන් දැල්ල නිමිති වශයෙන් ගෙන තේජෝ කසිණය වඩා රහත් ඵලයට පත් වූයේ,
   (1) සෝමා තෙරණියයි.　　(2) කිසාගෝතමී තෙරණියයි.
   (3) උප්පලවණ්ණා තෙරණියයි.　　(4) පටාචාරා තෙරණියයි.

9. බුද්ධඝෝෂ හිමියන් විසින් අටුවාකරණයේ දී භාවිත කළ ක්‍රමශිල්ප පිළිබඳ වැරදි ප්‍රකාශයයි,
   (1) මුල් කෘතියේ බස බැහැර කිරීම.
   (2) දිගු විස්තර බැහැර කර සංක්ෂිප්ත කිරීම.
   (3) හෙළ අටුවාවන්හි පදගත පරිවර්තනයන් සිදු කිරීම.
   (4) භාෂාවේ ව්‍යාකරණ විධි නොඉක්මවීම.

10. බෞද්ධ ජන සමාජය අතර වඩාත් ප්‍රචලිත වූ ධර්ම විනිශ්චය, ශාසනාවතරණය, සුවිසි විවරණය ආදී ධර්මග්‍රන්ථ රචනා කරන ලද්දේ,
   (1) රත්මලානේ ධර්මාලෝක හිමියන් විසිනි.　　(2) හේන්පිටගෙදර ඥානසීහ හිමියන් විසිනි.
   (3) හික්කඩුවේ සුමංගල හිමියන් විසිනි.　　(4) රේරුකානේ චන්දවිමල හිමියන් විසිනි.

11. තමා තුළ නැති ගුණයන් පවසා මහජනයා පහදවා සිවුපසය ලබාගත් වග්ගුමුදා නදීතෙර වැසි භික්ෂූන්ට ගර්හා කර බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද පාරාජිකා ශික්ෂාව වන්නේ,
   (1) උත්තරිමනුස්සධම්ම පාරාජිකාපත්තියයි.　　(2) අදින්නාදාන පාරාජිකාපත්තියයි.
   (3) මෙථුනධම්ම පාරාජිකාපත්තියයි.　　(4) මනුස්සවිග්ගහ පාරාජිකාපත්තියයි.

12. සංඝාදිසේසාපත්තියෙන් පාරිශුද්ධත්වයට පත්විය හැකි ක්‍රම පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
   A - පිරිවෙස් සමාදන් වීම
   B - දේශනා පාරිශුද්ධත්වයට පත්වීම
   C - මානත් හා අබ්භානකර්ම කිරීම
   D - සංඝයාගේ සහභාගිත්වය තිබීම
   (1) A, B සහ D　　(2) A, B සහ C　　(3) A, C සහ D　　(4) B, C සහ D

13. විනය පිටකයට අයත් 'ඛන්ධක' නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
   (1) පාරාජික පාළි - මහාවග්ග පාළි　　(2) මහාවග්ග පාළි - චුල්ලවග්ග පාළි
   (3) පාරාජික පාළි - පාචිත්තිය පාළි　　(4) මහාවග්ග පාළි - පාචිත්තිය පාළි

14. 'එකනාම කිං' ආදී දස ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් බුදුරදුන් වෙතින් ලැබූ උපසම්පදාව,
   (1) අට්ඨවාචික උපසම්පදාවයි.　　(2) පඤ්හ ව්‍යාකරණ උපසම්පදාවයි.
   (3) සරණාගමන උපසම්පදාවයි.　　(4) ඕවාද පටිග්ගහණ උපසම්පදාවයි.

15. සිඟාලක සූත්‍රයේ මිත්‍ර ප්‍රතිරූපකයන් අතර අපායසහාය මිත්‍රයාගේ ස්වභාවයක් නොවන්නේ,
   (1) රහමෙර පානය සඳහා යහළුවෙක් වීමයි.
   (2) අවේලාවේ වීථි සංචාරයට යහළුවෙක් වීමයි.
   (3) සූදුව සඳහා යහළුවෙක් වීමයි.
   (4) මිතුරාගේ නරක ක්‍රියා අනුගමනය කරන යහළුවෙක් වීමයි.

16. යම් කරුණක සත්‍යාසත්‍යතාව විමසීමේ දී පදනම් කර නොගත යුතු කරුණු කාලාම සූත්‍රයේ දක්වා ඇත. එහි 'මා ආකාර පරිවිතක්කෙන' යනුවෙන් දැක්වෙන්නේ,
   (1) දහම් පොතපතට ගැළපේ යැයි නොපිළිගත යුතු ය.
   (2) පිළිගත් දෘෂ්ටියට අනුව නිවැරදි යැයි නොපිළිගත යුතු ය.
   (3) පෙනෙන ආකාරයට මෙය නිවැරදි යැයි නොපිළිගත යුතු ය.
   (4) මෙය මෙසේ විය හැකි යැයි නොපිළිගත යුතු ය.

17. පරාභව සූත්‍රයේ කියවෙන 'පහූත විත්තො පුරිසො - සහිරඤ්ඤො සභොජනො' යන ගාථාර්ධයේ අර්ථය කුමක් ද?
   (1) ස්ත්‍රී, සුරා, සූදුවට ලොල් වූයේ වෙයි.
   (2) බොහෝ රන් රුවන් ඇති ව තනිව භුක්ති විඳියි.
   (3) යොවුන් විය ඉක්ම වූ පුරුෂයෙක් තිඹිරිපල වැනි යුවතියක ගෙන එයි.
   (4) සිය අඹුවගෙන් සතුටු නොවී පර අඹුවන් කරා යයි.

18. ආපත්තිභය සූත්‍රයට අනුව සංඝාදිසේසාපත්තියකට බිය විය යුත්තේ එය,
   (1) මොහොලකින් පහර කෑමක් තරම් වන බැවිනි.
   (2) හිස ගසා දැමීමක් තරම් වන බැවිනි.
   (3) අලු පොට්ටනියකින් පහර කෑමක් තරම් වන බැවිනි.
   (4) ප්‍රසිද්ධියේ බැනුම් ඇසීමක් තරම් වන බැවිනි.

[ 3 වැනි පිටුව බලන්න.

19. මතු ලොවට තැන්පත් කර ගත යුතු සිව්මහා නිධානයන්හි ස්වභාව කියවෙන නිධිකණ්ඩ සූත්‍රයට අනුව අංගසම නිධානය නම්,
    (1) තමන් සතු රන් රුවන් කෙත් වතු ආදියයි. (2) තමන් සතු අඹුදරුවන් හා දැසිදසුන් ආදියයි.
    (3) තමන් ඉගෙනගත් ශිල්ප ශාස්ත්‍ර ආදියයි. (4) තමන් සිදුකර ගත් පින්දහම් ආදියයි.

20. ධම්මපදයේ සහස්ස වග්ගයේ එන 'අභිවාදන සීලිස්ස' ගාථාව දේශනා කොට වදාළේ,
    (1) පටාචාරා තෙරණිය මුල්කොට ගෙන ය.
    (2) සංකිච්ච තෙරුන්ගේ සිදුවීම මුල්කොට ගෙන ය.
    (3) ආයුවඩ්ඪන කුමරුගේ සිදුවීම මුල්කොට ගෙන ය.
    (4) කිසාගෝතමියගේ සිදුවීම මුල්කොට ගෙන ය.

21. මා කළ පින සුළු ය. විපාක දෙන තරම් නොවේ යැයි අවමං නොකළ යුතු ය. දිය බිඳුව බැගින් වැටී කළයක් පුරව ද පිරේ. එසෙයින් ටික ටික රැස් කරන පිනෙන් ප්‍රඥාවන්තයා පිනෙන් පිරී යන්නේ ය. යන අර්ථය කියවෙන ධම්මපද ගාථාවේ මුල් ගාථාර්ධයන් වන්නේ,
    (1) මාප්පමඤ්ඤේථ පුඤ්ඤස්ස - න මං තං ආගමිස්සති
    (2) භද්‍රොපි පස්සති පාපං - යාව භද්‍රං න පච්චති
    (3) පාණිම්හි චෙ වණෝ නාස්ස - හරෙය්‍ය පාණිනා විසං
    (4) වාණිජොව භයං මග්ගං - අප්පසත්ථො මහද්ධනො

22. "රජොවජ්ජල්ලං උක්කුටිකප්පධානං - සොධෙන්ති මච්චං අවිතිණ්ණ කංඛං" යන ගාථාර්ධයෙහි 'අවිතිණ්ණ කංඛං' යන්නෙහි අර්ථය වන්නේ,
    (1) කෝපය දුරු නොකළ යනුයි. (2) සැකය දුරු නොකළ යනුයි.
    (3) වෛරය දුරු නොකළ යනුයි. (4) ආශාව දුරු නොකළ යනුයි.

23. මිනිස් සිතෙහි ක්‍රියාත්මක වන කෙලෙස් ප්‍රහීණ වන ආකාර තුනකි. ඉන් සමුච්ඡේදප්පහාණ ලෙස සැලකෙන්නේ,
    (1) කෙලෙස් තාවකාලිකව දුරු කිරීමයි. (2) කෙලෙස් කලකට දුරු කිරීමයි.
    (3) කෙලෙස් මේ භවයට පමණක් දුරු කිරීමයි. (4) කෙලෙස් සම්පූර්ණයෙන් දුරු කිරීමයි.

24. අභිධර්මාර්ථ සංග්‍රහයේ 'රූප' ආකාර පහක් යටතේ විග්‍රහ කර ඇත. ඉන් රූප සමුට්ඨාන ලෙස සැලකෙන්නේ,
    (1) රූප පිළිබඳ සැකෙවින් විස්තර කිරීමයි. (2) දක්වන ලද රූප නැවත බෙදා දැක්වීමයි.
    (3) රූප උපදවන හේතු ප්‍රත්‍යය දැක්වීමයි. (4) රූප සමූහ වශයෙන් බැඳී සිටින ආකාරය දැක්වීමයි.

25. අභිධර්මයේ රූප විග්‍රහයට අනුව ආහාර රූපය (ඕජා) යනු කුමක් ද?
    (1) මනෝ සංචේතනාහාරය (2) විඤ්ඤාණාහාරය
    (3) ඵස්සාහාරය (4) කබලිංකාහාරය

26. පරිනිර්වාණය දෙ ආකාර ය. ඉන් සෝපධිශේෂ පරිනිර්වාණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
    A - යමෙක් ජීවත්ව සිටිය දී ම සෝපධිශේෂ පරිනිර්වාණයට පත් වේ.
    B - සෝපධිශේෂ පරිනිර්වාණය ක්ලේශ පරිනිර්වාණය ලෙස ද හඳුන්වයි.
    C - පංචස්කන්ධයෙන් සදහටම මිදීමට පත්වේ.
    D - කුසල හෝ අකුසල කර්ම රැස් නොකරයි.
    (1) A, B සහ D (2) A, B සහ C (3) A, C සහ D (4) B, C සහ D

27. දෙපනස් චෛතසික ධර්ම අතර සබ්බචිත්තසාධාරණ චෛතසික අයත් වන්නේ,
    (1) අකුසල රාශියට ය. (2) සෝභන රාශියට ය.
    (3) අන්‍යසමාන රාශියට ය. (4) කුසල රාශියට ය.

28. දෙවනපෑතිස් රජුගේ ඇරයුමෙන් අනුරාධපුරයට වැඩම වූ මිහිඳු මහරහතන් වහන්සේ රජ මැඳුරේ දී පළමුව දේශනා කරන ලද්දේ,
    (1) දේවදූත සූත්‍ර දේශනාවයි. (2) බාලපණ්ඩිත සූත්‍ර දේශනාවයි.
    (3) විමානවත්ථු පේතවත්ථු දේශනාවයි. (4) අග්ගික්ඛන්ධෝපම සූත්‍ර දේශනාවයි.

29. මහායාන බෞද්ධ සම්ප්‍රදායේ ඉගැන්වීම් පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය වන්නේ,
    A - සම්බුද්ධත්වයෙන් පමණක් නිවන අවබෝධ කරගත හැකි බව ය.
    B - භක්ති මාර්ගය හා ඥාන මාර්ගය වැදගත් බව ය.
    C - බෝධිසත්වයන් වහන්සේ මහා කරුණාවෙන් යුතු බව ය.
    D - බුදුරජාණන් වහන්සේලා මිනිසුන් අතරම උපදින බව ය.
    (1) A, B සහ C (2) A, C සහ D (3) B, C සහ D (4) A, B සහ D

30. යෝගාවචරයා විසින් ධම්මානුපස්සනා සතිපට්ඨානයෙහි ප්‍රථම විමර්ශනය සිදු කරන්නේ,
(1) නීවරණ පරිග්‍රහයෙහි. (2) ඛන්ධ පරිග්‍රහයෙහි.
(3) ආයතන පරිග්‍රහයෙහි. (4) සච්ච පරිග්‍රහයෙහි.

31. භාවනායෙහි යෝගාවචරයන් අතර දස අසුභ හා කායගතාසති කම්මට්ඨාන වඩාත් යෝග්‍ය වන්නේ,
(1) රාග චරිතය උදෙසා ය. (2) මෝහ චරිතය උදෙසා ය.
(3) සද්ධා චරිතය උදෙසා ය. (4) බුද්ධි චරිතය උදෙසා ය.

32. දුක පිළිබඳ පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අයත් අංග දොළහ අතර 'උපාදාන' ලෙස හඳුන්වන්නේ,
(1) විඳීම හේතුවෙන් ඇතිවන ඇලීමයි. (2) උපත ලැබීමට භවයක් ඇති වීමයි.
(3) දැඩිව අල්ලා ගැනීමයි. (4) ජරා මරණාදී දුකට පත්වීමයි.

33. විපාක දෙන කාල අනුව සතරාකාර කර්මයෙහි 'අපරාපරිය වේදනීය කර්මය' ලෙස හඳුන්වන්නේ,
(1) හැකි සෑහැම අවස්ථාවක විපාක දෙන කර්මයයි.
(2) ඊළඟ භවයේ දී ම විපාක දෙන කර්මයයි.
(3) මේ භවයේ දී ම විපාක දෙන කර්මයයි.
(4) විපාක දීමට අවස්ථාවක් නොයෙදෙන කර්මයයි.

34. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ 'සම්මා කම්මන්ත' මාර්ග අංගයෙන් අර්ථවත් වන්නේ,
(1) සතුන් වෙළෙඳාම, අවි ආයුධ වෙළෙඳාම ආදියෙන් වැළකීමයි.
(2) ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාරයෙන් වැළකීමයි.
(3) බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීමෙන් වැළකීමයි.
(4) කායානුපස්සනා ආදියෙහි සිත පිහිටුවා ගැනීමයි.

35. සත්ත්වයා සසරට බැඳ තබන සංයෝජන ධර්ම අතර ඕරම්භාගිය සංයෝජනයන්ට අයත් 'කාමරාග' යන්නෙන් අර්ථවත් වන්නේ,
(1) මෙලොව, පරලොව ඇතුළු සියලු දේ පිළිබඳ ඇති සැකයයි.
(2) අරූපී භවයට ඇති ඇල්මයි.
(3) සිත එක් අරමුණක තබා ගැනීමට ඇති අපහසුතාවයි.
(4) පංච ඉන්ද්‍රියයන්ගෙන් විඳින රූපාදී අරමුණු පිළිබඳ ඇතිවන ඇල්මයි.

36. සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම පිණිස පවත්වන ලද පළමුවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල අතරට අයත් නොවන්නේ,
(1) ධර්මය සහ විනය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාම පිණිස වගකීම පැවරීමයි.
(2) භික්ෂූන් වහන්සේලා නිකාය වශයෙන් බෙදී යාමයි.
(3) ධර්මය හා විනය ගුරුවරයා වශයෙන් සැලකීමට තීරණය කිරීමයි.
(4) ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය පැනවීමට තීරණය කිරීමයි.

37. ධර්ම දේශකයන් වහන්සේ සතු ගුණාංග අතර 'අනුද්දයතං පටිච්ච' යන්නෙන් අර්ථවත් වන්නේ,
(1) අනුකම්පා පෙරදැරිව දහම් දෙසිය යුතු ය.
(2) හාත්පසින් කරුණු ගෙනහැර පාමින් දහම් දෙසිය යුතු ය.
(3) තමා හුවා දක්වමින් අනුන් හෙළා දකිමින් දහම් නොදෙසිය යුතු ය.
(4) අනුපිළිවෙළ කතාවට අනුව දහම් දෙසිය යුතු ය.

38. මහා පරිනිබ්බාන සූත්‍රයේ 'පෝරාණ වජ්ජිධම්ම' ලෙස සඳහන් වන්නේ,
(1) දස සක්විතිවත් ය. (2) දස රාජ ධර්මයන් ය.
(3) සප්ත අපරිහානීය ධර්මයන් ය. (4) සතර සංග්‍රහ වස්තූන් ය.

39. උපසම්පන්න භික්ෂූන් වහන්සේලා සිව්නමකට හෝ ඊට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුකරනු ලබන උපෝසථ කර්මය වූයේ,
(1) සංඝ උපෝසථයයි. (2) ගණ උපෝසථයයි.
(3) පුග්ගල උපෝසථයයි. (4) සාමග්ගි උපෝසථයයි.

40. ෂඩ් ශාස්තෘන් වහන්සේලා අතර පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යන සප්ත පදාර්ථයන් ලෝකයේ පවතී යන ඉගැන්වීම ප්‍රකට කළේ,
(1) අජිත කේසකම්බලී ය. (2) පකුධ කච්චායන ය.
(3) සංජය බෙල්ලට්ඨිපුත්ත ය. (4) නිගණ්ඨනාථපුත්ත ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

# 2565 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2021 (2022)

## (03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

**03 | S | II**

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

I කොටසේ ප්‍රශ්නය ද, II හා III යන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) බුදුරජාණන් වහන්සේ 'අරහං' යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න.

(ii) "කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මඤ්ඤූ හොති" - මහණෙනි, මේ ශාසනයෙහි යම් භික්ෂුවක් කෙසේ නම් ධර්මය දන්නේ වෙයි ද යන්නෙහි ඇතුළත් නවාංග ශාස්තෘ ශාසනයේ අංග දෙකක් ලියන්න.

(iii) උපෝසථ කර්මයක් ආරම්භ කිරීමට පෙර භික්ෂූන් වහන්සේලා විසින් සම්පූර්ණ කළ යුතු මූලික අවශ්‍යතා දෙක නම් කරන්න.

(iv) තීර්ථකයන්ගේ මානය බිඳ හෙළීමට සෘද්ධි ප්‍රාතිහාර්ය පෑමට බුදුරදුන්ගෙන් අනුමැතිය ඉල්ලා සිටි භික්ෂුණීන් වහන්සේ නම් කොට, ඇය ලැබූ අග තනතුර ලියන්න.

(v) 'සීලබ්බතපරාමාස' යන්නෙහි ඇතුළත් වූ ව්‍රත චර්යා දෙකක් නම් කරන්න.

(vi) බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ආධ්‍යාත්මික පිහිට ලැබිය හැකි පුද්ගලයන් හඳුනාගන්නේ මහාකරුණා සමාපත්තියට සමවැදීමෙනි. එසේ උන්වහන්සේගෙන් පිහිට ලද තැනැත්තන් දෙදෙනකු සඳහන් කරන්න.

(vii) සංස්කාරයන්ගේ හෙවත් රැස් වී එකතු වී සකස් වන ධර්මයන්ගේ ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න.

(viii) "යථා දණ්ඩෙන ගොපාලො - ගාවො පාචෙති ගොචරං,
එවං ජරා ච මච්චු ච - ආයුං පාචෙන්ති පාණිනං

යම් සේ ගොපල්ලෙක් කෙවිටෙන් ගවයන් තණබිම් කරා දක්කන්නේ ද එසේ ම සත්ත්වයන්ගේ ආයුෂ ද ක්ෂය කොට දමති."

ඉහත ගාථාවේ සඳහන් සත්ත්වයන්ගේ ආයුෂය ක්ෂය කොට දමන ධර්මතා දෙක ලියන්න.

(ix) 'සෝපධිසේස' නිර්වාණය සාක්ෂාත් කරගත හැකි ආකාර දෙකක් දක්වන්න.

(x) "උත්සාහයෙන් ධනය උපයා සුරක්ෂිත වූ ධනයක් සහිතව වෙසෙන පුද්ගලයා අන්තගාමී පරිභෝජනයකට නොයා යුතු ය." ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ධන පරිභෝජනයෙහිලා ඉගැන්වෙන අන්ත දෙක නම් කරන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

[2 වැනි පිටුව බලන්න.

## II කොටස

2. (i) බුදුරජාණන් වහන්සේ උත්තරීතර මනුෂ්‍යයෙකු ලෙස හැඳින්වීමට හේතු දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) බුදුරදුන් තුළ පැවති නිහතමානී ගුණය ප්‍රකට කළ අවස්ථා තුනක් කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 03 යි)

(iii) බුදුරජාණන් වහන්සේගේ අටලෝ දහමින් කම්පා නොවීමේ තාදී ගුණය හඳුන්වා, එයින් නූතන සමාජයට ගත හැකි ආදර්ශ ප්‍රකට කරන්න. (ලකුණු 05 යි)

3. (i) රජගහ නුවර වාර්ෂිකව පවත්වනු ලැබූ ගිරග්ගසමජ්ජ නම් සැණකෙළි උත්සවය නැරඹූ සාරි හා මොග්ගලී බැමිණියන්ගේ පුත්‍රයන් දෙපළ නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) අගසව් මුගලන් මහරහතන් වහන්සේ ශාසන චිරස්ථිතිය උදෙසා සිය වගකීම් මනා අවබෝධයෙන් හා කැපවීමෙන් ඉටු කළ බවට සාධක තුනක් ගෙනහැර දක්වන්න. (ලකුණු 03 යි)

(iii) මුගලන් මහරහතන් වහන්සේගේ සෘද්ධිමත් ගුණය ප්‍රකට වන අවස්ථා දෙකක් උන්වහන්සේගේ චරිතය ඇසුරින් කෙටියෙන් පහදන්න. (ලකුණු 05 යි)

4. (i) ආභිසමාචාරික ශික්ෂා සංග්‍රහ වී ඇති විනය පිටකාගත ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මනුස්සවිග්ගහ පාරාජිකාපත්තිය ලියා, එහි අර්ථය ඉදිරිපත් කරන්න. (ලකුණු 03 යි)

(iii) මනුස්සවිග්ගහ පාරාජිකාපත්තියට සම්පූර්ණ විය යුතු අංග පහ ගෙනහැර දක්වා, එම ශික්ෂා ප්‍රඥප්තිය පැනවීමෙහිලා බලපෑ නිදානය පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

## III කොටස

5. (i) 'මාවොච ඵරුසං කඤ්චි' යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)

(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. (ලකුණු 03 යි)

(iii) පෙර කළ පාප කර්මයකින් අශෝභන විපාකයක් විඳි කුණ්ඩධාන තෙරුන්ගේ කථාව ලියා දක්වා, එයින් වර්තමාන සමාජයට ලබාදෙන පණිවුඩය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

6. (i) 'ධර්ම සංගීති' යන්න බුදුරජාණන් වහන්සේ විසින්ම අනුමත කරන ලද්දක් බවට සාධක දෙකක් ත්‍රිපිටකාගත සූත්‍ර දේශනා අතරින් ඉදිරිපත් කරන්න. (ලකුණු 02 යි)

(ii) ධර්ම සංගීතියක් යනු කුමක් දැයි දක්වා, ප්‍රථම ධර්ම සංගීතියෙහිලා බලපෑ දුරස්ථ හේතු පෙන්වා දෙන්න. (ලකුණු 03 යි)

(iii) සද්ධර්මයේ ආරක්ෂාවට හා චිරස්ථිතියට අනුගමනය කළ වැඩපිළිවෙළ දක්වා ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල සමාලෝචනය කරන්න. (ලකුණු 05 යි)

7. (i) රූප සමුද්දේශ කොටස් දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) 'රූප' යන්න හඳුන්වා, විඤ්ඤත්ති රූප දෙක කෙටියෙන් පහදන්න. (ලකුණු 03 යි)

(iii) ගර්භශෙය්‍යක සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධියත් සමග පහළවන කර්මජ රූප කලාප දක්වා අල්පායුෂ්ක හා දීර්ඝායුෂ්ක වීමට බලපාන හේතු යුක්ති සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

* * *

# මූලික පිරිවෙන් අවසාන විභාගය - 2021 (2022)

## (03) ත්‍රිපිටක ධර්මය

### ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. | (3) | 21. | (1) |
| 2. | (2) | 22. | (2) |
| 3. | (4) | 23. | (4) |
| 4. | (2) | 24. | (3) |
| 5. | (1) | 25. | (4) |
| 6. | (3) | 26. | (1) |
| 7. | (1) | 27. | (3) |
| 8. | (3) | 28. | (3) |
| 9. | (3) | 29. | (1) |
| 10. | (4) | 30. | (3) |
| 11. | (1) | 31. | (1) |
| 12. | (3) | 32. | (3) |
| 13. | (2) | 33. | (1) |
| 14. | (2) | 34. | (2) |
| 15. | (4) | 35. | (4) |
| 16. | (3) | 36. | (2) |
| 17. | (2) | 37. | (2) |
| 18. | (1) | 38. | (3) |
| 19. | (3) | 39. | (1) |
| 20. | (3) | 40. | (2) |

(ලකුණු 01×40 = 40 යි)

# 2565 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2021 (2022)

## (03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

### I කොටස

1. (i)

- කෙනෙකු පිළිකුල් සහගත දේකින්, බියකරු තැනකින් ඈත්වන්නා සේ කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින්ද
- සතුරන් නසන රණශූරයකු සේ තමා තුළ වූ කෙලෙස් සතුරන් නැසූ හෙයින්ද
- සංසාර චක්‍රයේ ගරාදී හෙවත් අවිද්‍යාදී ධර්ම සිඳලූ හෙයින් ද
- සියලූ පූජාවන් ලැබීමට සුදුසු වූ උතුම් පූජනීයයන් වහන්සේ වූ හෙයින් ද
- සිතින්, කයින් හෝ වචනයෙන් රහසින්වත් පව් නොකරන හෙයින් ද

මේ අතරින් දෙකකි

(ii) සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක ජාතක, අබ්භූතධම්ම හා වේදල්ල

මේ අතරින් දෙකකි

(iii) පුබ්බකරණ හා පුබ්බකිච්ච

(iv) උත්පලවර්ණා රහත් තෙරණිය
සෘද්ධිමත් භික්ෂුණීන් අතර අග්‍රතනතුර

(v) ගෝ ව්‍රත, කුක්කුර ව්‍රත, අජව්‍රත
මෙබඳු ව්‍රත චර්යා දෙකකි.

(vi) පූතිගත්තතිස්ස තෙරුන්, සෝපාක, මට්ටකුණ්ඩලී
ආදීන්ගෙන් දෙදෙනෙකි

(vii)

- උප්පාදො පඤ්ඤායති - හට ගැනීමක් පෙනේ
- වයො පඤ්ඤායති - නැසීමක් පෙනේ
- ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති - තිබූ දෙයක් වෙනස් වූ බවක් පෙනේ

මේ අතරින් දෙකකි

(viii) ජරා - ජරා ධර්මතාව
මච්චු - මරණ ධර්මතාව

(ix)
- සම්මා සම්බුද්ධත්වයට පත්වීමෙන්
- පසේ බුද්ධත්වයට පත්වීමෙන්
- අරහත්වයට පත්වීමෙන්

මේ අතරින් දෙකක්

(x) උදුම්බරකාදික
අජද්ධුමාරික

(ලකුණු 02 × 10 = 20 යි)

## II කොටස

2. (i)
- කාමාදී ආශ්‍රවයන් සහමුලින් ප්‍රහීණ කිරීම
- ලෝකයෙහි සාමාන්‍ය මිනිසුන් අතර ඉපදී හෙළ පියුමක් ජලයෙහි නොගැවී, නොතැවරී තිබෙන්නා සේ මිනිසුන් අතර වැඩී මිනිසුන්ගෙන් ඉස්මතු වී ලෝකය සමඟ නොගැටී, නොබැඳී ජීවත් වීම
- සීල, සමාධි, පඤ්ඤා, විමුත්ති, විමුත්තිඤාණදස්සන ආදි ගුණයන්ගෙන් ශෝභාමත් වූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය රත්නය වූ නිසා.

මේ අතරින් දෙකකි.

(ලකුණු 02 යි )

(ii)
- සම්මා සම්බුද්ධත්වය අවබෝධ කර ගැනීමෙන් පසු පස්වන සතිය අජපාල නුගරුක මුල වැඩ සිටිද්දී තමන්ගේ ගුරුවරයා ලෙස ක්‍රියා කළ හැකි අයෙකු ඇත්දැයි විමසා බලා සීලාදී ගුණ දහමින් තමන් වහන්සේට වඩා උසස් කෙනෙකු නොමැති බව සලකා උතුම් වූ සද්ධර්මය ගුරුතැන්හි තබා ගැනීම.
- දානය සඳහා විශේෂ ආරාධනා නොලද සෑම දිනකම පිණ්ඩපාතයෙහි වැඩමවමින් රාජමාළිගයටත් දුගී පැලටත් කිසිදු භේදයකින් තොරව වැඩමවා මිහිරි බොජුන් මෙන්ම කටුක නීරස භෝජන පවා සමසිතින් වැළඳීම.
- තමන් වහන්සේ සියල්ලන් අතර ශ්‍රේෂ්ඨ වුවත් සිය ශ්‍රාවක පිරිස අතර සිටි විවිධ කුසලතා ඇති අය වෙත අගතනතුරු පිරිනැමීම

- මහා කාශ්‍යප මහරහතන් වහන්සේ සමග චාරිකාවේ වැඩම කිරීමේදී අතරමගදී වැඩ සිටීමට සිනිඳු පට සිවුර නවා ආසනයක් පිළියෙල කිරීම. එහි වැඩ සිටි බුදුරදුන් මහා කාශ්‍යප තෙරුන්ගේ සිවුර සිනිඳු බව පැවසූ පසු මහා කාශ්‍යප තෙරුන් එය බුදුරදුන්ට පූජා කොට උන්වහන්සේගේ හනතුලින් කළ සිවුර ලබා ගැනීමේ සිද්ධිය.
- බුදුරදුන් පිළිබඳ ප්‍රසාදයට පත් පුක්කුසාති රජකුමා බුදුරදුන් සොයා ගෙන පැමිණීම. තමන් වහන්සේ හමුවට පැමිණීමට තරම් කාලයක් රජුට නොමැති බව සලකා උන්වහන්සේ රජුගේ පෙරමගට වැඩම කිරීම. දෙදෙනාම රාත්‍රියෙහි කුඹල්හලක නවාතැන් ගැනීම. රාත්‍රිය පුරාම රජු සමග බුදුගුණ සාකච්ඡා කිරීම. රජුට තමන් වහන්සේ බුදුරදුන් බව නොඇඟවීම මේ සිද්ධිය.
- බුදුරදුන් සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ සිටින සමයක ආයුෂ්මත් නන්දක තෙරුන් වහන්සේ උපස්ථාන ශාලාවේදී දැහැමි කථාවෙන් ශ්‍රාවකයන් වහන්සේලාට කරුණු දැක්වූ අවස්ථාව.

මේ අතරින් තුනකි.

(ලකුණු 03 යි)

(iii) අටලෝ දහම:-

අටලෝ දහම යනු ලාභ, අලාභ, අයස, යස, නින්දා, ප්‍රශංසා, සැප, දුක් යන අටයි. අටලෝ දහම හමුවේ බුදුරදුන් කම්පා නොවූහ. එසේ කම්පා නොවී කටයුතු කිරීම තාදී ගුණයයි.

(ලකුණු 03 යි)

නූතන සමාජයට ගත හැකි ආදර්ශ:

- සැපතේදී උදම් නොවීමටත්
- දුකේදී කම්පා නොවීමටත්
- ලාභයේදී සතුටුවෙමින් ද අලාභයේදී දුක්වීමෙන් ද කටයුතු නොකිරීමත්
- කීර්ති, ප්‍රශංසා ඉදිරියෙහි උද්දාම නොවීමටත්
- නින්දා, අපහාස, අපකීර්ති ඉදිරියේදී දුක් නොවී මැදහත්ව ක්‍රියා කිරීමත් උසස් පෞරුෂ ලක්ෂණයක් බවත් පෙන්වාදී තිබීම මෙහිලා අපේක්ෂිතයි.

(ලකුණු 02 යි)
(ලකුණු 03 + 02 = 05 යි)

3. (i) උපතිස්ස හා කෝලිතයි

(ලකුණු 02 යි)

(ii)

- නොමග ගිය දේවදත්ත පාක්ෂික භික්ෂූන් සුමගට ගැනීම
- මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරුකමින් මුදවාලීම
- නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීම
- මාරතජ්ජනිය සූත්‍රයෙහි සඳහන් මාරයා තම සිරුර තුළ පෙරළි කළ අවස්ථාවේ දෙව්ලොව තොරතුරු දක්වා ජනතාවට ධර්ම දේශනා කිරීම.
- බුදුරදුන් මාතෘ දිව්‍යරාජයාට අභිධර්මය දේශනා කිරීමට දෙව්ලොව වැඩම කළ අවස්ථාවේ දෙව්ලොව තොරතුරු විස්තර කොට ජනතාවට ධර්ම දේශනා කිරීම.
- මිනිස් ලොව පමණක් නොව දෙව්ලොවද නිරයේද සැරිසරමින් සතියක් තුළ පින් පව් හා ඒවායේ විපාක ජනතාවට දේශනා කිරීම

මේ අතුරින් තුනකි.

(ලකුණු 03 යි)

(iii)

- වරක් බුදුරදුන් පොහොය සීමාවේදී දුසිල් භික්ෂුවක් සිටීම නිසා පොහොය නොකොට සිටි අවස්ථාවේදී එවැනි කෙනෙකු සිටී නම් ඉවත් වන්නැයි කියාත් එම භික්ෂුව ඉවත් නොවූ බව දිවැසින් බලා මුගලන් තෙරුන් අදාළ භික්ෂුව වෙත ගොස් අතින් අල්ලා ඉවත් කිරීම.

- චාතුමා සූත්‍රයේ සඳහන් පරිදි වරක් නවක භික්ෂූන්ගේ කෑකෝ ගැසීමක් නිසා සැරියුත් මුගලන් දෙනමත් උන්වහන්සේලාගේ දහසක් පිරිවරත් දෙව්රම් වෙහෙරින් නෙරපීමෙන් පසු අනේපිඩු සිටුතුමා ආදී දායකයන් හා දෙව්බඹුන් පවා මැදිහත් වී බුදුරදුන් කමා කරවාගෙන උන්වහන්සේලා ආපසු වැඩම කරවා ගන්නා ලදී. එම අවස්ථාවේ ඔබට සිතුනේ කුමක්දැයි සැරියුත් තෙරුන්ගෙන්ද මුගලන් තෙරුන්ගෙන්ද බුදුරදහු විමසා සිටියහ. එවිට මුගලන් තෙරණුවෝ තථාගතයන් වහන්සේත් සැරියුත් තෙරුන් වහන්සේත් සංඝයා පාලනය කිරීමෙන් ඈත් වන සේක් නම් තමන් වහන්සේවත් එය කළ යුතු යැයි සිතූ බව පැවසූහ. මේ අවස්ථාව

- මුගලන් තෙරණුවෝ ස්වකීය සෘද්ධිබලය ද යොදා ගනිමින් ධර්මය දේශනා කිරීම නිසා සැදැහැවත්හු බුදුරදුන් හා භික්ෂූන් වහන්සේ විෂයෙහි මහත් වූ පුද පූජා පැවැත්වූහ. එම නිසා අන්‍ය තීර්ථකයෝ මුගලන් තෙරුන් කෙරෙහි දැඩි වෛරයකින් පසු වූහ. උන්වහන්සේ ඝාතනය කිරීමට ද අපරාධකරුවන් යෙදවූහ. පළමු හා දෙවැනි අවස්ථාවලදී සතුරන් වැටලූ කල්හි සෘද්ධි බලයෙන් එයින් ගැලවුණහ. එහෙත් තෙවැනිවර සතුරන් වැටලූ කල්හි පෙර සසර මව්පියන් මැරීමේ පාපකර්මය නොවැළැක්විය හැකි සේ විපාකය කරා එළඹ ඇති බව දැන නිසලව සිටියහ. සතුරෝ තළා

පෙළා උන්වහන්සේ මැරුණා යැයි සලකා පිටත් වූහ. සද්ධිබලයෙන් ශරීරය බලගන්වා බුදුරදුන් වෙත එළඹ උන්වහන්සේ නොයෙක් ප්‍රාතිහාර්ය පා වැඳ අවසර ගෙන කාලසිලාවට වැඩමවා එහිදී පිරිනිවන් පෑහ.

මේ අතුරින් කරුණු දෙකක් ඇසුරින් පිළිතුරු සකස් වී තිබිය යුතුයි.

(ලකුණු 05 යි)

කරුණු 02 ක් දැක්වීමට ලකුණු 02 බැගින් $02 \times 02 = 04$

කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 01

(04 + 01 = 05 යි)

4\. (i) මහාවග්ගපාළි, චුල්ලවග්ග පාළි, පරිවාර පාළි

මේ අතරින් දෙකකි.

(ලකුණු 02 යි)

(ii) යො පන භික්ඛු සඤ්චිච්ච, මනුස්ස විග්ගහං ජීවිතා වොරොපෙය්‍ය සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය, මරණවණ්ණංවා සංවණ්ණෙය්‍ය, මරණායවා සමාදපෙය්‍ය, අම්භො පුරිස, කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන මතන්තෙ ජීවිතා සෙය්‍යොති, ඉති චිත්තමනො චිත්ත සංකප්පො අනෙක පරියායෙන මරණවණ්ණංවා සංවණ්ණෙය්‍ය, මරණායවා සමාදපෙය්‍ය, අයම්පි පාරාජිකො හොති අසංවාසො.

(ලකුණු 02 යි)

අර්ථය :-

යම් කිසි භික්ෂුවක් (මොහු මරමියි) දැන දැන මනුෂ්‍ය ශරීරය ජීවිතයෙන් තොර කරයි නම් මරණය සඳහා ආයුධ හෝ පිළියෙල කොට තබයි නම්, මරණයෙහි අගය ප්‍රකාශ කරයි නම්, උත්සුක කරවයි නම්, එම්බා මිනිස, ඔබට මේ දුක්ඛර ජීවිතයෙන් කවර වැඩෙක් ද ඔබගේ ජීවත්වීමට වඩා මරණය උතුම් යැයි මරණ කැමති සිත් ඇතිව කල්පනා ඇතිව නොයෙක් අයුරින් මරණයෙහි ගුණ වනන්නේ ද මරණයෙහි හෝ උත්සුක කරන්නේ ද ඒ භික්ෂුතෙමේ පරාජ වූයේ වෙයි. (ප්‍රකෘති භික්ෂූන් සමඟ) සහවාසයට නොසුදුස්සෙක්ද වෙයි.

(ලකුණු 01 යි)
(02 + 01 = 03 යි)

(iii) සම්පූර්ණ විය යුතු අංග:

- මනුෂ්‍ය ප්‍රාණියෙකු වීම
- මනුෂ්‍ය ප්‍රාණියෙකු බව දැනීම

- මරණ චේතනාව
- මරණය සඳහා උපක්‍රම යෙදීම
- එයින් මරණය සිදු කිරීම යනුයි.

(ලකුණු 02 යි)

නිදානය:

භාග්‍යවතුන් වහන්සේ එක් කලෙක විශාලා මහනුවර ඇසුරු කොට මහාවනයෙහි කූටාගාර ශාලාවේ වැඩවාසය කළහ. කමටහන් ගැනීමට හෝ ධර්ම ශ්‍රවණයට පැමිණි භික්ෂූන් වහන්සේලාට අසන්නට ලැබුණේ ශරීරයේ පිළිකුල් බව පවසෙන අශුභ භාවනාවේ අගයයි.

අඩමසක් පමණ කාය චිත්ත විවේකය කැමති බුදුරජාණන් වහන්සේ ඒ බව භික්ෂූන්ට පවසා පිණ්ඩපාතය රැගෙන එන භික්ෂුව හැර සෙසු භික්ෂූන්ගේ පැමිණීම නවතා විවේක සුවයෙන් කල් ගෙවූහ. භික්ෂූන් වහන්සේද අශුභ භාවනාවේ යෙදෙමින් කල් ගෙවූහ. පිළිකුල් භාවනාව කරද්දී ඇතැම් භික්ෂූන් වහන්සේලාට ශරීරයෙහි නිසරු බවත් එය දරා සිටීමෙහි නිෂ්ප්‍රයෝජන බවත් වැටහී බොහෝ දෙනෙකු දිවි තොර කර ගත්හ. ඇතැම්හු අන් ලවා සිය දිවි තොර කරවා ගත්හ. තවත් සමහරෙක් මිගලණ්ඩික නමැති පෙර මුව වැද්දෙකුව සිට පැවිදි වූ කෙනෙකු ලවා දිවි තොර කර ගත්හ. අඩ මස ගෙවී යන්නට බොහෝ භික්ෂූන් වහන්සේලා මරණයට පත්ව සිටියහ. මේ අරමුණ කොට භික්ෂූන් වහන්සේලා උපස්ථාන ශාලාවට රැස් කරවා, දිවි තොර කර ගැනීමේ ආදීනව පවසා මේ ශික්ෂාව පැනවූහ.

(ලකුණු 03 යි)

(02 + 03 = 05 යි)

## III කොටස

5. (i) මාවොච ඵරුසං කඤ්චි - වුත්තා පටිවදෙය්‍යුතං
දුක්ඛාහි සාරම්භ කථා - පටිදණ්ඩා ඵුසෙය්‍යුතං

(ලකුණු 02 යි)

(ii) කිසිවෙකුට පරුෂ වචන නොකියන්න. මන්ද එසේ ඔබ පරුෂ වචන කී විට ඔවුන් ඔබටද පරුෂ වචන කියනු ඇත. එකට එක කියා ගැනීම දුකක්මය. ඔබ අනුන්ට පහර දීම් ආදිය කළොත් ඔබටද පහර කෑමට සිදු වන්නේය.

(ලකුණු 03 යි)

නිවැරදි අර්ථයට සම්පූර්ණ ලකුණු ලැබේ.

(iii) කුණ්ඩධාන තෙරුන් වහන්සේ පැවිදි උපසම්පදා වූ දින පටන් යන යන තැන පසු පසින් ගැහැණියක් ගමන් කරනු අන් අයට පෙනේ. ඒ බව උන්වහන්සේට නොපෙනේ. එයින් උන්වහන්සේ මිනිසුන්ගේ නොයෙක් උසුළු විසුළුකම්වලට ලක්වූහ.

පෙර කාශ්‍යප බුදුරදුන් දවස එක් මවකගේ දරුවන් දෙදෙනෙකු සේ සමඟියෙන් විසූ භික්ෂූන් වහන්සේලා දෙනමකගේ විශ්වාසය බිඳ හෙළන්නට එක් දේවතාවියකගේ නොපනත්කම් හේතු විය. ඒ නොපනත්කම් කළ දේවතාවිය පසුව උන්වහන්සේලාගෙන් සමාව ගත්තත් ගෞතම බුදුරදුන් දවස කුණ්ඩධාන තෙරුන් ලෙස උපත ලබා එහි විපාක වින්දේය.

මේ ඇසුරින් වර්තමාන කථාව හා අතීත කථාව දක්වා තිබිය යුතුය.

(ලකුණු 03 යි)

සමාජයට සපයන ආදර්ශය:

- කිසිවෙකුට පරුෂ වචන නොකියන්න. මන්ද පරුෂ වචන කී කල්හි ඔවුන්ද පෙරළා පරුෂ වචන කියන බැවිනි.
- කිසිවෙකුට පහර නොදෙන්න. මන්ද පෙරලා ඔවුන්ද පහර දෙන බැවිනි. එකට එක නොකරන්න. මන්ද එය දුකක්ම වන බැවිනි.
- කළ වරදට විපාක අනුන්ට නොව තමාටම හිමි වන බැවින් වැරදි කිරීමෙන් වළකින්න.

මේ ඇසුරින් ආදර්ශ දක්වා තිබිය යුතුය.

(ලකුණු 02 යි)

(03 + 02 = 05 යි)

6. (i) අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ සද්ධම්ම සම්මොස සූත්‍ර
දීඝනිකායේ පාසාදික සූත්‍රය
දීඝනිකායේ සංගීති සූත්‍රය
මේ අතරින් දෙකකි.

(ලකුණු 02 යි)

(ii) ධර්ම සංගීතියක් යනු සද්ධර්මය සජ්ඣායනා කිරීමයි. ධර්මධරයන් ධාරණය කර ගත් සද්ධර්මය සසඳා බලමින් සාකච්ඡා කිරීමෙන් සියලු දෙනාගෙන් සම්මත වූ ධර්මය සජ්ඣායනා කොට තහවුරු කිරීමෙන් සිදු කෙරේ. එය ධර්ම සංගායනාව යැයි කියනු ලැබේ.

(ලකුණු 01 යි)

දූරස්ථ හේතු:

- විසිරී පැවති ධර්මය හා විනය ඒකරාශී කිරීම හා එය ක්‍රමානුකූලව සකස් කිරීම.
- ධර්ම - විනය ශාස්තෘවරයා වශයෙන් සැලකිය යුතුය යන බුදුවදන සඵල කර ගැනීම.
- ධර්ම විනයට එරෙහිව නැගෙන අභ්‍යන්තර හා බාහිර බලවේග මැඩලීම.
- ශාසනයේ චිර පැවැත්ම සහතික කිරීම.
- අධර්මය හා අවිනය රජවීම වළක්වා ධර්මය හා විනය බැබළවීමට සැලැස්වීම.

මේ කරුණු අතුරින් දෙකක්වත් ඇතුළත් වන සේ පිළිතුර සකස් විය යුතුයි.

(ලකුණු 02 යි)
(01 + 02 = 03 යි)

(iii) සද්ධර්මය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමට භාණක පරපුරක් සකස් කිරීම. එහිදී,

- විනය පිටකය - උපාලි මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට .
- දීඝ නිකාය - ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට
- මජ්ඣිම නිකාය - සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට
- සංයුත්ත නිකාය - මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට
- අංගුත්තර නිකාය - අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට

(ලකුණු 03 යි)

ප්‍රතිඵල සමාලෝචනය:-

- තැන තැන විසිරී තිබුණ බුද්ධ දේශිත ධර්ම - විනය එක්රැස් කොට ඒ පිළිබඳව තිබූ දූර්මත ඉවත් කොට නිර්මලත්වයට පත් කිරීම.
- ධර්මය හා විනය ඒ ඒ භික්ෂු පරම්පරාවලට පවරා මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමට භාණක පරපුරට වගකීම පැවරීම.
- ධර්මය හා විනය ශාස්තෘත්වයෙහි තබා කටයුතු කිරීමට තීරණය කිරීම.
- අධර්මවාදීන් හා අවිනයවාදීන් මැඩ පැවැත්වීම.
- පනවන ලද ශික්ෂා ප්‍රඥප්ති ලිහිල් නොකිරීමටත් නොපනවන ලද ශික්ෂා ප්‍රඥප්ති නොපැනවීමටත් තීරණය කිරීම.
- ආනන්ද තෙරුන්ට එල්ල වූ චෝදනා විසඳා නිදහස් කිරීම.
- ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය පැනවීමට තීරණය කිරීම.

- අධර්මය හා අවිනය රජවීම වළක්වා ධර්මය හා විනය බැබළවීමට කටයුතු කිරීම.

මේ අතරින් කරුණු 04 ක් වත් පදනම් කරගෙන පිළිතුර ලියා තිබිය යුතුයි.

(ලකුණු 02 යි)
(03+02 = 05 යි)

7. (i)
- මහා භූත රූප 04 හා උපාදාය රූප 24 යන කොටස් දෙක
- නිෂ්පන්න රූප 18 හා අනිෂ්පන්න රූප 10 යන කොටස් දෙක හෝ දක්වා තිබිය යුතු වේ.

මෙයින් මහාභූතරූප හා උපාදායරූප හෝ නිෂ්පන්න රූප හා අනිෂ්පන්නරූප හෝ නිවැරදිව දක්වා තිබේ නම් ලකුණු 02 යි.

(ii) රුප්පතීති භවෙ රූපං - විකාර පච්චයෙ සති
රූප රූපං තථා රූපං - පරියාපන්නතො පරං

ශීත, උෂ්ණ ආදි විරුද්ධ ප්‍රත්‍ය ඇති කල්හි යම් රූපයක් විකාරයට පැමිණේ ද එය රූපා රූප නම් වේ. වෙනත් රූපද රූප රූපයට ඇතුළත් වන බැවින් ඒවා රූප නම් වේ.

(ලකුණු 01 යි)

කාය විඤ්ඤත්ති හා වචී විඤ්ඤත්ති යි.

කෙනෙක් අනුන්ට යම් අදහසක් දක්වන ආකාරය විඤ්ඤත්ති නම් වේ. ශරීරයේ අවයව ක්‍රියා කරවන චිත්ත කිරියා වායෝ ධාතුව ඒ ඒ ක්‍රියාව හැඟවීමට යෝග්‍ය වන පරිදි ඒ ඒ අතට හරවන බල විශේෂය කාය විඤ්ඤත්තියයි.

වචනයෙන් යමක් කථා කිරීමට අවශ්‍ය වූ විට වුවමනා අකුරු මෙන්ම වචන සැසඳෙන පරිදි උගුරෙන් එන වායු ධාතුව මෙහෙය වන බල විශේෂය වචී විඤ්ඤත්තියයි.

(ලකුණු 02 යි)

(01 + 02 = 03 යි)

(iii) අණ්ඩජ, ජලාබුජ යන දෙකොටස අයත් සත්වයන් මව් කුස හටගන්නා බැවින් ගබ්භසෙය්‍යක යැයි කියනු ලැබේ. සත්වයන්ට ප්‍රතිසන්ධියේදීම

කාය දසක භාව දසක හා වත්ථු දසක යන රූප කලාප පහළ වෙයි. මේවා ප්‍රතිසන්ධියත් සමඟ පහළ වන්නේ කර්මජ රූප කලාප වන බැවිනි.

කර්මජ රූප කලාප 09 කි. එනම්,

01.චක්ඛු දසකය
02.සොත දසකය
03.ඝාණ දසකය
04.ජිව්හා දසකය
05.කාය දසකය
06.ඉත්ථිභාව දසකය
07.පුම්භාව දසකය
08.වත්ථු දසකය
09.ජීවිත දසකය

(ලකුණු 02 යි)

අල්පායුෂ්ක හා දීර්ඝායුෂ්ක වීමට හේතු:

ගබ්භසෙය්‍යක සත්වයන්ගේ චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා දසක පහළ වන්නේ ප්‍රතිසන්ධියෙන් පසුව එන ප්‍රවෘත්ති කාලයන්හිය. එයින් අල්පායුෂ්ක සත්වයන් මවු කුස වෙසෙන්නේ මද කාලයකි. ඔවුන්ට චක්ඛු ආදී දසක ඉක්මණින් පහළ වන නිසාය. දීර්ඝායුෂ්ක සත්වයන් මව් කුස වැඩි කාලයක් වෙසෙන අතර ඉහතින් ඇති වූ චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා යන දසක හතර පහළ වන්නේ කල්ගත වීමෙනි. මනුෂ්‍යයන්ට චක්ඛු, සෝත ආදී දසක පහළ වන්නේ ප්‍රතිසන්ධියෙන් සති එකොළොසකට පමණ පසුව යැයි අට්ඨකථා මතය වේ. චක්ඛු ආදී දසක හතර කල්ගත වී පහළ වන බැවිනි.

(ලකුණු 03 යි)

(02 + 03 = 05 යි)

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2565 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2022(2023)**

**03 | S | I**

**(03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය**

පැ. එකයි

සැලකිය යුතුයි :

- ※ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. බුදුරජාණන් වහන්සේ සියලු ලෝකයන්හි දැනගත යුතු සියලු ධර්මයන් වැරදීමකින් තොරව පරෝපදේශ රහිතව අවබෝධ කරගත් හෙයින්,
   (1) අරහං නම් වන සේක. (2) සම්මාසම්බුද්ධ නම් වන සේක.
   (3) සුගත නම් වන සේක. (4) විජ්ජාචරණසම්පන්න නම් වන සේක.

2. බුදුරජාණන් වහන්සේ අෂ්ටාංග සමුපේත බ්‍රහ්ම ස්වරයකින් යුතුවන සේක. එහි 'නින්නාදීසා' යනුවෙන් හඳුන්වන්නේ,
   (1) මිහිරි බවයි. (2) පැහැදිලි බවයි.
   (3) අසාර බිඳීම් නැති බවයි. (4) කෙළවර සිටින අයට පවා ඇසෙන බවයි.

3. බුදුරජාණන් වහන්සේ සතු සවි අසාධාරණ ඥාන අතරින් 'ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය' ලෙස සැලකෙන්නේ,
   (1) සත්ත්වයාගේ සිත තුළ පවතින ආසය අනුසය දැනගැනීමයි.
   (2) සංඛත අසංඛත ධර්ම නිරවශේෂ කොට දැකීමයි.
   (3) කෙලෙස් අඩුවැඩි බව ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ තියුණු බව මෘදු බව දැකීමයි.
   (4) සංඛත අසංඛත ධර්ම ආවරණයකින් තොරව දැකීමයි.

4. බුදුරජාණන් වහන්සේ විසින් විමසන ලද ප්‍රශ්න දහයකට පිළිතුරු ලබාදී පඤ්හ ව්‍යාකරණ උපසම්පදාවෙන් අධිසීලය ලැබුයේ කවු ද?
   (1) සුනීත තෙරුන් ය. (2) සෝපාක තෙරුන් ය.
   (3) රාහුල තෙරුන් ය. (4) නන්ද තෙරුන් ය.

5. අස්සජි මහරහතන් වහන්සේ විසින් වදාළ 'යෙ ධම්මා හෙතුප්පභවා' යන ගාථාව අසා සෝවාන් ඵලයට පත්වූයේ කුමන පරිබ්‍රාජකයා ද?
   (1) උපතිස්ස (2) කෝලිත (3) උපාලි (4) සංජය

6. මහා ප්‍රඥාවන්ත භික්ෂුණීන් වහන්සේලා අතර අග්‍රස්ථානයට පත්වූ තෙරණිය කවු ද?
   (1) ඛේමා (2) පටාචාරා (3) උප්පලවණ්ණා (4) කිසාගෝතමී

7. අසරණසරණ වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමුයේ කුමන රජතුමා විසින් ද?
   (1) රාජාධිරාජසිංහ (2) ශ්‍රී විජය රාජසිංහ
   (3) කීර්ති ශ්‍රී රාජසිංහ (4) ශ්‍රී වික්‍රම රාජසිංහ

8. මනුස්සවිග්ගහ පාරාජිකාපත්තියෙහි සඳහන් "සත්ථහාරකංවාස්ස පරියෙසෙය්‍ය" යන්නෙන් අර්ථවත් වන්නේ,
   (1) මරණය ළඟා කරගත හැකි ක්‍රම කියාදීමයි.
   (2) උපක්‍රම යෙදීමෙන් ජීවිතය විනාශ කිරීමයි.
   (3) මරණයෙහි අගය කියා මරණයට උනන්දු කරවීමයි.
   (4) ජීවිත විනාශය සඳහා අවි ආයුධ සපයා තැබීමයි.

[ 2 වැනි පිටුව බලන්න.

9. ගරුකාපත්ති ලෙස සැලකෙන සංඝාදිසේසාපත්තීන්හි පළමුවන ශික්ෂාපදය පනවන ලද්දේ,
   (1) උදායි තෙරුන්ට ය.
   (2) ධනිය තෙරුන්ට ය.
   (3) සෙය්‍යසක තෙරුන්ට ය.
   (4) දබ්බමල්ලපුත්ත තෙරුන්ට ය.

10. සම්බුද්ධ දේශනාවේ විශේෂ වූ ලක්ෂණ නවාංගසත්ථුසාසනය නම් වේ. එහි 'වේදල්ල' නම් අංගයෙන් අර්ථවත් වන්නේ,
   (1) සියලුම ගාථා රහිත සූත්‍රයන් ය.
   (2) අභිධර්ම පිටකය හා ගාථා රහිත සූත්‍රයන් ය.
   (3) ඥාණයත් සතුටත් ලබමින් විමසන ලද ප්‍රශ්නෝත්තර සහිත දේශනාවන් ය.
   (4) බෝසත් අවධිය පිළිබඳ කියවෙන දේශනාවන් ය.

11. බුදුරජාණන් වහන්සේ භික්ෂු භික්ෂුණීන් උදෙසා පනවන ලද ශික්ෂාපද ඇතුළත් උභතෝ විභංගයට අයත් කොටස් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
   (1) පාරාජික පාළි - පාචිත්තිය පාළි
   (2) පාරාජික පාළි - පරිවාර පාළි
   (3) පාරාජික පාළි - චුල්ලවග්ග පාළි
   (4) පාරාජික පාළි - මහාවග්ග පාළි

12. සිඟාලක සූත්‍රයට අනුව අවේලාවේ මංමාවත්හි හැසිරීමේ ආදීනවයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) තමාගේම රැකවරණය නැති වීම
   (2) බලාසිටියදීම ධනය විනාශ වීම
   (3) වැරදි අපරාධයන්ට සැකකරුවකු වීම
   (4) අභූත චෝදනා එල්ල වීම

13. ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් විසින් කුලපුත්‍රයාට කරුණු සයකින් සංග්‍රහ කළ යුතු ය. එම සංග්‍රහ අතර 'කල්‍යාණේ නිවේසෙන්ති' යන්නෙන් අර්ථවත් වන්නේ,
   (1) සුගතියට යන මග කියාදීමයි.
   (2) නොඇසූ ධර්මය ඇසීමට සැලැස්වීමයි.
   (3) පාපයෙන් වැළැක්වීමයි.
   (4) යහපතෙහි යෙදවීමයි.

14. "අසත් පුරුෂයන් ප්‍රිය කරයි. සත්පුරුෂයන් ප්‍රිය නොකරයි. අසත් දහම ප්‍රිය කරයි. මෙය පිරිහීමේ දොරටුවකි." මෙම අර්ථය කියවෙන පරාභව සූත්‍ර ගාථාවේ මුල් අර්ධය නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?
   (1) නිද්දාසීලී සභාසීලී - අනුට්ඨාතා ච යො නරො
   (2) අසන්තස්ස පියා හොන්ති - සන්තෙ න කුරුතෙ පියං
   (3) සුවිජානො භවං හොති - සුවිජානො පරාභවො
   (4) පහූත විත්තො පුරිසො - සහිරඤ්ඤො සභොජනො

15. ආපත්තිභය සූත්‍රයට අනුව යම් දරුණු වරදකට පුරුෂයකුගේ හිස සිඳිනු දැක බියවන්නාසේ භික්ෂුවක හෝ භික්ෂුණියක විසින් තියුණු බියක් ඇතිකර ගත යුත්තේ කුමන ඇවැත් පිළිබඳවද?
   (1) පාරාජිකා
   (2) පාචිත්තිය
   (3) සංඝාදිසේස
   (4) පාටිදේසනීය

16. අභිධර්මයේ රූප විග්‍රහයට අනුව සත්ත්ව උත්පත්ති වර්ග හතරකි. ඉන් සංසේදජ සත්ත්ව වර්ගය ලෙස හඳුන්වන්නේ,
   (1) බිත්තරයෙන් හටගන්නා සත්ත්වයින් ය.
   (2) මව්කුසෙහි හටගන්නා සත්ත්වයින් ය.
   (3) ගහකොළ, පස්, කසළ ආදියෙහි හටගන්නා සත්ත්වයින් ය.
   (4) කර්මානුරූපව ඉබේ හටගන්නා සත්ත්වයින් ය.

17. මහාභූත රූප පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
   A - පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනු මහාභූත රූපයන් ය.
   B - තේජෝ ධාතුව සියලු ධාතූන්ට ප්‍රධාන වූවකි.
   C - උපාදාය රූප මහාභූත රූප හා දැඩිව බැඳී පවතී.
   D - අටවිසි රූප අතුරින් පළමු හතර මහාභූත නම් වේ.
   (1) A, B සහ C  (2) A, B සහ D  (3) A, C සහ D  (4) B, C සහ D

18. රහත් බව හැඳින්වීමට භාවිත කර ඇති පහත සඳහන් පද අතර එම අර්ථයට වෙනස් වූ පදය තෝරන්න.
   (1) ඛීණං පුරාණං
   (2) කෝලංකෝල
   (3) නවං නත්ථිසම්භවං
   (4) විරත්තචිත්තා

19. ධම්මපදයේ සහස්ස වග්ගයේ එන "යො ච වස්සසතං ජීවෙ - අපස්සං උදයව්‍යයං" යනාදී ගාථාව දේශනා කළේ කවුරුන් උදෙසා ද?
   (1) පටාචාරා තෙරණිය
   (2) සංකිච්ච තෙරුන්
   (3) දීඝායු කුමරු
   (4) කුණ්ඩලකේසී තෙරණිය

[ 3 වන පිටුව බලන්න.

20. යහපත් කටයුතු යුහුසුළුව කළ යුතු වේ. සිත අකුසලයෙන් වළක්වාගත යුතු ය. පසුබාමින් පින්කර ගන්නා තැනැත්තාගේ සිත පාපයෙහි ඇලේ, යන අර්ථය සහිත ධම්මපද ගාථාවේ මුල් අර්ථය අයත් වරණය තෝරන්න.
    (1) පාපං චෙ පුරිසො කයිරා - න තං කයිරා පුනප්පුනං
    (2) වාණිජොව භයං මග්ගං - අප්පසත්ථො මහද්ධනො
    (3) පාපොපි පස්සති භද්‍රං - යාව පාපං න පච්චති
    (4) අභිත්ථරෙථ කල්‍යාණෙ - පාපා චිත්තං නිවාරයෙ

21. සියල්ලෝම දඬුවමට බිය වෙති. දඬුවමට අකමැති වෙති. එබැවින් ඉන් වැළකිය යුත්තේ,
    (1) අනුන් උපමාකර ගනිමිනි.
    (2) දහම් උපමාකර ගනිමිනි.
    (3) තමන් උපමාකර ගනිමිනි.
    (4) කර්මය උපමාකර ගනිමිනි.

22. සංස්කාර ධර්මයන්ගේ ලක්ෂණ තුනකි. ඉන් "ඨිතස්ස අඤ්ඤථත්තං" ලෙස හඳුන්වන්නේ, සංස්කාරයන්ගේ
    (1) ඇති වීමයි
    (2) ස්ථිරව පැවතීමයි.
    (3) නැතිවීමයි.
    (4) වෙනස් වෙමින් පැවතීමයි.

23. පියවර හතකින් යුතුව, හුස්ම ඉහළට ගැනීම හා පහළට හෙළීම පිළිබඳ භාවනා අරමුණක් වශයෙන් මෙනෙහි කිරීම හෙවත් ආනාපාන පබ්බය අයත් වන්නේ සතර සතිපට්ඨානයේ,
    (1) වේදනානුපස්සනාවට ය.
    (2) කායානුපස්සනාවට ය.
    (3) චිත්තානුපස්සනාවට ය.
    (4) ධම්මානුපස්සනාවට ය.

24. වේදනානුපස්සනාවේ අංග අතර "නිරාමිස උපේක්ෂා වේදනා" ලෙස දක්වා ඇත්තේ,
    (1) පස්කම්ගුණ ඇසුරෙන් වන දුක්ඛ වේදනාවයි.
    (2) පස්කම්ගුණ ඇසුරෙන් වන මධ්‍යස්ථ වේදනාවයි.
    (3) කාමයන්ගෙන් වෙන්වීම සමග වන දුක්ඛ වේදනාවයි.
    (4) කාමයන්ගෙන් වෙන්වීම සමග වන මධ්‍යස්ථ වේදනාවයි.

25. පටිච්චසමුප්පාද ඉගැන්වීමට අනුව ස්පර්ශය හේතුවෙන් ඇතිවන සැප දුක් වේදනාවන්ගෙන් හටගන්නේ,
    (1) වේදනාවයි.
    (2) තණ්හාවයි.
    (3) උපාදානයයි.
    (4) සළායතනයයි.

26. සත්ත්වයාගේ උපත හෙවත් පුනර්භවයට සාධක තුනක් සම්පූර්ණ විය යුතු බව මහාතණ්හාසංඛය සූත්‍රයේ දැක්වේ. එම කරුණුවලට අයත් නොවන්නකි,
    (1) මව්පිය සංවාසය
    (2) මවගේ සෘතු වීම
    (3) කර්මයේ විපාක දීම
    (4) ගන්ධබ්බයාගේ පැමිණීම

27. සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩම වීම සම්බන්ධ නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
    A - ජයශ්‍රී මහා බෝධිය ලක්දිවට වැඩම වීම
    B - දුරුතු පොහෝදා භික්ෂුණී ශාසනය ඇරඹීම
    C - භික්ෂූන් වහන්සේ උදෙසා හත්ථාළ්හක මෙහෙණවර ඉදිවීම
    D - අනුලා බිසව ඇතුළු කුල කාන්තාවන් පැවිදිවීම
    (1) A, B සහ C (2) A, C සහ D (3) A, B සහ D (4) B, C සහ D

28. ත්‍රි ශික්ෂාවෙහි පඤ්ඤා ශික්ෂාවට අයත්වන ආර්ය අෂ්ටාංගික මාර්ගාංග නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?
    (1) සම්මාවාචා - සම්මාකම්මන්ත
    (2) සම්මාවායාම - සම්මාසති
    (3) සම්මාදිට්ඨි - සම්මාසංකප්ප
    (4) සම්මාසති - සම්මාසමාධි

29. මහායාන ඉගැන්වීමෙහි පුණ්‍යස්කන්ධයෙහිලා සැලකෙන පාරමිතාව කුමක් ද?
    (1) වීර්ය (2) ධ්‍යාන (3) ප්‍රඥා (4) ක්ෂාන්ති

30. කඨින චීවරයක් ලැබූ භික්ෂුවකට ලැබෙන පංච ආනිසංසයන්ට අයත් නොවන්නේ,
    (1) පාත්‍රය නොමැතිව චාරිකා කළ හැකි වීමයි.
    (2) කැමති පරිදි සිවුරු ලැබිය හැකි වීමයි.
    (3) තුන්සිවුර නොගෙන චාරිකා කළ හැකි වීමයි.
    (4) භික්ෂූන් නොවිමසා ගම තුළ චාරිකා කළ හැකි වීමයි.

[ 4 වැනි පිටුව බලන්න.

31. සතර සංග්‍රහ වස්තුවෙහි 'අර්ථචර්යාව' ලෙස සැලකෙන්නේ,
(1) මහජන සුබසිද්ධිය උදෙසා ධනය යෙදවීමයි.
(2) සහයෝගීව හා සහගරුකව කටයුතු කිරීමයි.
(3) රටවැසියා සමානාත්මතාවයෙන් සැලකීමයි.
(4) රටතුළ යන්තිමින් ආර්ථිකයක් ඇති කිරීමයි.

32. ආර්ථික අසහනයකට මග ඇතිවන දිළිඳුකම පුද්ගල ජීවිතයට සෘජුවම බලපා විනාශ මුඛයට ඇද දමා සමාජ ජීවිතයට ද හානි පමුණුවන ආකාරය හේතුඵලවාදීව පැහැදිලි කළ සූත්‍ර දේශනාවකි.
(1) දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රය
(2) දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රය
(3) අංගුත්තරනිකායේ අණන සූත්‍රය
(4) අංගුත්තරනිකායේ පත්තකම්ම සූත්‍රය

33. දුරබැහැර සිට ගෙනෙවිත් සිල්වතුන්ට පුදන සිවුපසය පිළිගැනීමට සුදුසුවන හෙයින් මහා සංඝරත්නය,
(1) ආහුණෙය්‍ය නම් වේ.
(2) පාහුණෙය්‍ය නම් වේ.
(3) දක්ඛිණෙය්‍ය නම් වේ.
(4) අංජලිකරණීය නම් වේ.

34. ධනංජය සිටුතුමා පතිකුලයට යන දියණියට දුන් අවවාද අතර 'දෙන අයටත් නොදෙන අයටත් දෙන්න' යන ප්‍රකාශයෙන් කියැවෙන්නේ,
(1) ණයට ලබාගත් දේ නොදෙන අයට නොදෙන්න.
(2) ණයට ලබාගත් දේ නැවත දෙන අයට දෙන්න.
(3) ඥාති මිත්‍රාදීන්ට ආපසු ලබා ගැනීමේ බලාපොරොත්තු රහිතව දෙන්න.
(4) බාහිර ප්‍රශ්න නිවසට නොගන්න.

35. විනය පිටකයට අයත් වස්සක්ඛන්ධකය අන්තර්ගතව ඇත්තේ,
(1) මහාවග්ග පාලියේ ය.
(2) චුල්ලවග්ග පාලියේ ය.
(3) පාරාජික පාලියේ ය.
(4) පරිවාර පාලියේ ය.

36. අභිධර්මයේ චෛතසික කාණ්ඩයේ ඒකග්ගතා චෛතසිකයෙන් ප්‍රකාශ වන නිවැරදි අර්ථය තෝරන්න.
(1) වර්ණ වශයෙන් හෝ රස වශයෙන් හෝ හඳුනාගැනීම
(2) සිතෙහි පවත්නා ධර්ම ජීවත් කරවීම
(3) සිත හා චෛතසික කාර්යයෙහි යෙදවීම
(4) සිත නොයෙක් අරමුණුවලට යා නොදී එක් අරමුණක තබා ගැනීම

37. පංචාභිඥාවන්හි සඳහන් වන දිබ්බචක්ඛු ඥාණය ලෙස සැලකෙන්නේ,
(1) පෙර ආත්මය සිහි කිරීමේ නුවණයි.
(2) පරසිත් දන්නා නුවණයි.
(3) විවිධ වූ ඍද්ධිබල පෑ හැකි නුවණයි.
(4) පියවි කණෙන් ඇසිය නොහැකි දේ ඇසීමේ නුවණයි.

38. කුසලාකුසල කර්ම විග්‍රහයේදී වචනයෙන් සිදුවන අකුසල් හතරකි. එම අකුසලයන්ට අයත් නොවන්නේ මින් කුමක් ද?
(1) ව්‍යාපාද
(2) මුසාවාද
(3) පිසුනාවාචා
(4) සම්ඵප්පලාපා

39. සය ශාස්තෘවරුන් අතුරින් අමරාවික්ෂේපවාදය ප්‍රකාශ කළ ශාස්තෘවරයා කවු ද?
(1) පූර්ණකාශ්‍යප
(2) සංජයබෙල්ලට්ඨිපුත්ත
(3) අජිතකේසකම්බල
(4) මක්ඛලිගෝසාල

40. පළමුවන ධර්ම සංගායනාවෙන් පසුව අංගුත්තරනිකායේ භාරකාරත්වය පවරණ ලද්දේ කාට ද?
(1) ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍ය පිරිසට ය.
(2) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසට ය.
(3) මහාකාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍ය පිරිසට ය.
(4) අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍ය පිරිසට ය.

※ ※ ※

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2565 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2022 (2023)

## (03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

**03 | S | II**

පැ. තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

I කොටසේ ප්‍රශ්නය ද, II හා III යන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) බුදුරජාණන් වහන්සේ දේශනා කළ සද්ධර්මය සන්දිට්ඨිකො යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න.

(ii) සාරාණීය ධර්ම පුරුදු පුහුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(iii) උපසපන් භික්ෂුවක විසින් දිවිහිමියෙන් නොකළ යුතු අකරණීය ධර්ම දෙකක් ලියා දක්වන්න.

(iv) මරණානුස්සතිය සිහිකරමින් භාවනා කොට බුදුරදුන්ගේ අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම දේශනාව අවසානයේ සිව්පිළිසිඹියාපත් රහත්භාවය ලැබූ භික්ෂුණින් වහන්සේ නම් කොට සම්බුද්ධ ශාසනයේ ඇය ලැබූ අගතනතුර ලියන්න.

(v) 'පාපයට බියවන, තැතිගන්නා ස්වභාවය ඕත්තප්ප නම් වේ.' එසේ බිය ඇතිවීමෙහිලා පදනම් වන කරුණු දෙකක් පෙන්වා දෙන්න.

(vi) බුදුරජාණන් වහන්සේගේ අසරණසරණ ගුණය ප්‍රකට කළ අවස්ථා දෙකක් ඉදිරිපත් කරන්න.

(vii) විනය පිටකය මුලින්ම බෙදා දක්වන ග්‍රන්ථ නොවන විනය ප්‍රභේද දෙකක් ලියන්න.

(viii) "අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධාපචායිනො
චත්තාරොධම්මා වඩ්ඪන්ති - ආයුවණ්ණො සුඛං බලං"

'නිතර වැඳිය යුත්තන් වඳින සුළු, නිතර වැඩිහිටියන් පුදන ගිහියාට හෝ පැවිද්දාට ධර්ම හතරක් වැඩේ.' මෙහි සඳහන් ධර්ම අතරින් දෙකක් දක්වන්න.

(ix) අයෝනිසෝමනසිකාරයෙන් යුක්තව පඤ්චස්කන්ධය ඇතුළු ලෝකය දකින තැනැත්තාට ඇතිවන සඤ්ඤාවිපල්ලාස අතරින් දෙකක් ගෙනහැර දක්වන්න.

(x) බුදුරදුන් විසින් කාලාමවරුන්ට දේශනා කරන ලද යමක් පිළිගැනීමට එකම පදනම නොවිය යුතු බව සඳහන් කරුණු දෙකක් පෙන්වා දෙන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

[2 වැනි පිටුව බලන්න

## II කොටස

2. (i) බුදුරජාණන් වහන්සේ උත්තරීතර සමාජ දාර්ශනිකයකු ලෙස හැඳින්වීමට හේතු දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

   (ii) 'බුදුරජාණන් වහන්සේ සියලු අසාධාරණ සමාජ බෙදීම් ප්‍රතික්ෂේප කොට සමස්ත ජනසමාජයම සිව්වනක් පිරිසකට බෙදා දැක්වූහ.' මෙයින් තුනක් ඉදිරිපත් කරන්න. *(ලකුණු 03 යි)*

   (iii) බුදුරජාණන් වහන්සේ භාරතීය කාන්තාවගේ විමුක්තිය උදෙසා සමාජ ශෝධකයකු ලෙස ක්‍රියා කළ ආකාරය කෙටියෙන් දක්වා ඉන් කාන්තාව ලද සමාජ වරප්‍රසාද පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

3. (i) ඛේමා හා උප්පලවණ්ණා භික්ෂුණීන් වහන්සේලා දෙනම සම්බුද්ධ ශාසනයෙහි ලැබූ අගතනතුරු වෙන වෙනම දක්වන්න. *(ලකුණු 02 යි)*

   (ii) ඛේමා හා උප්පලවණ්ණා භික්ෂුණීන් වහන්සේලා දෙනම මහරහතන් වහන්සේලා බවට පත්වූ අයුරු වෙන වෙනම ඉදිරිපත් කරන්න. *(ලකුණු 03 යි)*

   (iii) සම්බුද්ධ ශාසනයෙහි අග්‍රශ්‍රාවිකා තනතුරු ලද ඛේමා - උප්පලවණ්ණා භික්ෂුණීන් වහන්සේලා දෙනමගේ චරිත කථා වෙන වෙනම කෙටියෙන් ගෙනහැර දක්වන්න. *(ලකුණු 05 යි)*

4. (i) ආදිබ්‍රහ්මචරියක ශික්ෂා සංග්‍රහ වී ඇති විනය පිටකාගත ග්‍රන්ථ දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

   (ii) මෛථුනධම්ම පාරාජිකාපත්තිය ලියා එහි අර්ථය ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

   (iii) මෛථුනධම්ම පාරාජිකාපත්තියේ නිදානය දක්වා, එය අනාපත්තිවීමේ අවස්ථා පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

## III කොටස

5. (i) 'ගබ්භමෙකෙ උප්පජ්ජන්ති' යන ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

   (ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. *(ලකුණු 03 යි)*

   (iii) මණිකාරකුලූපගතිස්ස තෙරුන්ගේ කථාපුවත දක්වා, කර්මය විපාක දීමේදී පුද්ගලයාගේ තරාතිරම අදාළ වන්නේ දැයි විචාරයක යෙදෙන්න. *(ලකුණු 05 යි)*

6. (i) වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේලා ඉදිරිපත් කළ දසඅකැප වස්තුව දෙවැනි ධර්මසංගීතිය පැවැත්වීමෙහිලා බලපෑ සාධක ලෙස සඳහන් මූලාශ්‍රය දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

   (ii) නායකත්වය, දායකත්වය හා ස්ථානය සඳහන් කරමින් දෙවැනි ධර්මසංගීතිය සංවිධානය වූ අයුරු සාකච්ඡා කරන්න. *(ලකුණු 03 යි)*

   (iii) ධර්ම විනයෙහි චිරස්ථිතිය උදෙසා අනුගමනය කළ ක්‍රියාමාර්ග දක්වා දෙවැනි ධර්ම සංගීතියේ ප්‍රතිඵල ගෙනහැර දක්වන්න. *(ලකුණු 05 යි)*

7. (i) ලෞකික වශයෙන් විපස්සනා භාවනාවෙන් ලැබිය හැකි ප්‍රතිඵල දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

   (ii) පුහුදුන් පුද්ගලයකුගේ සිත තුළ කෙලෙස් ක්‍රියාත්මක වන ආකාර තුන දක්වා කෙටියෙන් පහදන්න. *(ලකුණු 03 යි)*

   (iii) 'සතිපට්ඨාන' යන්න හඳුන්වා නූතන සංකීර්ණ සමාජ රටාව තුළ පුද්ගලයාගේ චිත්ත සමාධිය උදෙසා වැඩිය හැකි භාවනා කර්මස්ථාන පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

* * *

# මූලික පිරිවෙන් අවසාන විභාගය -2022 (2023)

## (03) ත්‍රිපිටක ධර්මය I පත්‍රය

### ලකුණු දෙදී යාම

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 1 | 2 | 21 | 2 |
| 2 | 4 | 22 | 4 |
| 3 | 3 | 23 | 2 |
| 4 | 2 | 24 | 4 |
| 5 | 1 | 25 | 1 |
| 6 | 1 | 26 | 3 |
| 7 | 3 | 27 | 2 |
| 8 | 4 | 28 | 3 |
| 9 | 3 | 29 | 3 |
| 10 | 3 | 30 | 1 |
| 11 | 1 | 31 | 4 |
| 12 | 2 | 32 | 2 |
| 13 | 4 | 33 | 1 |
| 14 | 2 | 34 | 3 |
| 15 | 1 | 35 | 2 |
| 16 | 3 | 36 | 4 |
| 17 | 3 | 37 | 3 |
| 18 | 2 | 38 | 1 |
| 19 | 1 | 39 | 2 |
| 20 | 4 | 40 | 4 |

# ලකුණු දීමේ පටිපාටිය

## II කොටස

**01.**

**I.**

❖ කෙලෙසුන් සන්සිඳෙන තරමට එහි සුවය තමාටම දැනෙන බැවින් ආර්ය මාර්ගය සන්දිට්ඨික වීම.

❖ නව ලොව්තුරා දහම තමාගේම ඥානයෙන් අවබෝධ කරගත යුත්තක් බැවින් සන්දිට්ඨික වීම.

❖ තථාගත ධර්මයෙන් පෙන්වන මාර්ගය හා නිර්වාණය තමාටම මෙලොවදීම අත්දැකිය හැකි බැවින් සන්දිට්ඨික වීම.

**මේ අතරින් දෙකකි.**

**II.**

❖ පියකරුණෝ - ප්‍රිය උපදවන බව

❖ ගරුකරුණෝ - ගෞරව කරන බව

❖ සංගහාය - සංග්‍රහ කරන බව

❖ අවිවාදාය - විවාද නොකිරීම පිණිස හේතුවන බව

❖ සාමග්ගියා - සාමග්‍රිය පිණිස හේතුවන බව

❖ එකීභාවාය - එකමුතු බව පිණිස හේතුවන බව

**මෙයින් දෙකකි.**

**III.**

★ මෛථුනධම්ම පාරාජිකාව

★ අදත්තාදාන පාරාජිකාව

★ උත්තරි මනුස්සධම්ම පාරාජිකාව

★ මනුස්සවිග්ගහ පාරාජිකාව

**මෙයින් දෙකකි.**

**IV.**

★ පටාචාරා භික්ෂුණීන් වහන්සේ

★ විනයධර භික්ෂුණීන් අතර අග්‍රතනතුර

**V.**

★ අත්තානුවාද භය

★ දණ්ඩ භය

★ පරානුවාද භය

★ දුග්ගති භය

**මේ අතරින් දෙකකි.**

VI.

- හදුවනිතා ඇගින්නට පිහිට වීම
- සුනීත සැඩොල් පුතුට පිහිට වීම
- දෙව්ලොව උපන් සැඩොල් ස්ත්‍රියට පිහිට වීම
- පේසකාර දූවට පිහිට වීම
- සෝපාකට පිහිට වීම
- රජ්ජුමාලාවට පිහිට වීම
- බණ ඇසීමට ගොස් ආහාර ලැබූ දුප්පතා

**මෙයින් දෙකති.**

VII.

- උපත වීම
- බෝධිය
- පරිවාර

**මෙයින් දෙකති.**

VIII. ආයු - ආයුෂය, වණ්ණො - ශරීර වර්ණය, සුඛං - සැපය, බලං - බලය

**මෙයින් දෙකති.**

IX.

- අනිච්චෙ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාස - නිච්ච සඤ්ඤා
- දුක්ඛෙ සුඛන්ති සඤ්ඤාවිපල්ලාස - සුඛ සඤ්ඤා
- අසුභෙ සුභන්ති සඤ්ඤාවිපල්ලාස - සුභ සඤ්ඤා
- අනත්තෙ අත්තාති සඤ්ඤාවිපල්ලාස - අත්ත සඤ්ඤා

**මෙයින් දෙකති.**

X.

- මා අනුස්සවෙන - කට කතාවෙන් ඇසූ නිසා
- මා පරම්පරාය - (පරපුරෙන් ආ නිසා)
- මා ඉතිකිරාය - මෙය මෙසේ වීලු යැයි කී නිසා
- මා පිටක සම්පදානෙන - (දහම් පොතට ගැලපෙන නිසා)
- මා තක්කහේතු - තර්කයට ගැලපෙන නිසා
- මා නය හේතු - (නය ධර්මයට ගැලපෙන නිසා)
- මා ආකාරපරිවිතක්කෙන - (පෙනෙන ආකාරයට නිවැරදි යැයි සිතා ගෙන)
- මා දිට්ඨි නිජ්ඣානක්ඛන්තියා - (දෘෂ්ටියට ගැලපෙන නිසා)

- ❖ මා භබ්බරූපතාය - (මෙය වෙනස් විය හැකි යැයි සිතා හෝ)
- ❖ මා සමණො නො ගරු - (අපගේ ගුරුවරයා කියූ දේ නිසා)

**මෙයින් දෙකකි.**

**(ලකුණු 02 x 10 = 20 යි)**

**02.**

**I.**

- ❖ පන්ති භේද, කුල භේද නොතකා සමාජයේ සියල්ලන් දෙස මානව හිතවාදීව එක හා සමාන ලෙස සැලකීම.
- ❖ කෙනෙකු උසස් බවට හෝ පහත් බවට පත්වන්නේ තම චරිතය හා ක්‍රියා පිළිවෙත අනුව බව දේශනාවෙන් මෙන්ම ආදර්ශයෙන් ද පෙන්වා දීම.
- ❖ ධනවත් ස්වාමියාට මෙන් ම දුප්පත් සේවකයාටත් මානව නිදහස එක සමාන බව පෙන්වා දීම

**මේ අතරින් දෙකකි.**

**(ලකුණු 02 යි)**

**II.**

★ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා

**මෙයින් තුනකි.**

(ලකුණු 01 යි)

**III.**

- ❖ කාන්තාවක ලෙස උපත ලැබීම ශාපයක් මෙන් ම පාපයක් ලෙස සැලකූ භාරතීය සමාජයේ කොසොල් රජුට බුදුරදුන් ලබාදුන් උපදේශය.
- ❖ භාරතීය කාන්තාවගේ විමුක්තිය උදෙසා භික්ෂුණී ශාසනය ඇති කරලීම.
- ❖ ගෘහස්ථයෙහි මවක, බිරිඳක, දියණියක, යෙහෙළියක හා උපාසිකාවක ලෙස ක්‍රියා කිරීමට අවස්ථාව සලසා දීම.

**වරප්‍රසාද :**

- ❖ ඉන්දියානු බ්‍රාහ්මණ සමාජය ප්‍රතික්ෂේප කළ කාන්තාවට සමාජයේ භික්ෂුණියක, මවක, දියණියක, සොහොයුරියක, බිරිඳක හා උපාසිකාවක ලෙස ගෞරවාන්විත ස්ථානයක් ගෙන ඒමෙන් සමාජ ආකල්පය සකස් කිරීම හා ඒ ඒ ස්ථාන ලබා දීම.
- ❖ භික්ෂුණී ශාසනයේ පැවිදිද ලැබූ ආධ්‍යාත්මික සුවය වූ මහරහත් භාවය ලබාගැනීමට හැකි විය.
- ❖ දැනුමෙන්, නුවණින්, උපායශීලිත්වයෙන් පුරුෂයා හා සමානත්වයෙන් කටයුතු කිරීමේ අවස්ථාව සැලසීම.
- ❖ සීලයෙහි, ගුණයෙහි උසස් බවට පත්වීමෙන් සමාජයේ ගෞරවය සම්මානය ලබා ගැනීමට හැකිවීම. ආදියයි.

**(ලකුණු 05 යි)**

03.

I.

★ ඛේමා තෙරණිය - මහා ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර අගතනතුර හා දකුණත් අග්‍රශ්‍රාවිකා තනතුර

★ උප්පලවණ්ණා තෙරණිය - ධ්‍යානලාභී භික්ෂුණීන් අතර අගතනතුර හා වමත් අග්‍රශ්‍රාවිකා තනතුර .

(ලකුණු 02 යි)

II.

★ ඛේමා තෙරණිය - පැවිදිව අඩමසක් ඇවෑමෙන් පහනක් දැල්වීමත් නිවීමත් දැක ඒ ගැන මෙනෙහි කිරීමෙන් සිට රහත් භාවයට පත්වීම.

★ උප්පලවණ්ණා තෙරණිය - [illegible] පොහොය ගෙය ඇමදූ [illegible] පහන් දැල්ලම නිමිති ලෙස ගෙන තේජෝ කසිනය අරමුණු කොට ධ්‍යාන උපදවා එම ධ්‍යානයම පාදක කොට රහත් භාවයට පත් වීම.

(කරුණු දෙකම ලියා තිබේ නම් ලකුණු 03 යි. )

III. ඛේමා තෙරණිය : පියුමතුරා බුදුරදුන් දවස හංසවතී නුවර ඉසුරුමත් පවුලක කුල කුමරියක ලෙස ඇය උපත ලැබුවා ය. පූර්ව ප්‍රාර්ථනා පරිදි විපස්සි, කෝණාගමන, කාශ්‍යප යන බුදුවරුන් දවස ද කුලවත් පවුල් වල උපත ලැබුවා ය. අප බුදුරදුන් දවස මගධ රට බිම්බිසාර රජුගේ අගබිසව ලෙස අභිෂේක ලැබුවා ය. රූප මදයෙන් මත්ව සිටි ඇය බුදුරදුන් රූපයට අවමන් කරතියි සිතා බුදුරදුන් හමුවට නොගියා ය. පසුව උපාය මාර්ගයෙන් ඇයව විහාරයට ගෙනගිය බිම්බිසාර රජු ඇයට දහම් ඇසීමට සැලැස්සුවේ ය. පසුව ඇය පැවිදි වී මහරහත් බවට පත් වූවාය. ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර අග තනතුර ලැබූ ඛේමා තෙරණිය දකුණත් අග්‍රශ්‍රාවිකා තනතුරු ලැබුවා ය.

උප්පලවණ්ණා තෙරණිය : පදුමුත්තර බුදුරදුන් දවස හංසවතී නුවර එක් කුල ගෙයක ඇය උපන්නා ය. පූර්ව ප්‍රාර්ථනා ලෙස බණ ඇසීමට ඇල්මක් දැක්වූ ඇය ශාසනික කටයුතුවලට නැඹුරු වූවා ය. ඇය බුදුරදුන් දවස රජගහනුවර දිළිඳු පවුලක ඇය උපත ලැබුවා ය. ක්‍රමයෙන් නිසි වයසට පැමිණි ඇය විවාහ වී ස්වාමියා ද සමග පසේ බුදුවරුන්ට උපස්ථාන කළාය. පසුව ශාසනයෙහි පැවිදි වී පහනක් අරමුණු කොට ධ්‍යාන වඩා රහත් බව ලැබුවා ය. ශාසනයෙහි ධ්‍යාන ලාභීන් අතරින් අගතනතුරු ලැබූ උප්පලවණ්ණා තෙරණිය ශාසනයෙහි වමත් අග්‍රශ්‍රාවිකා තනතුරු ද ලැබුවා ය.

(මේ ඇසුරින් පිළිතුර සැකසී තිබිය යුතුයි.)

(ලකුණු 05 යි)

04.

I. පාරාජික පාළි හා පාචිත්තිය පාළි

(ලකුණු 02 යි)

II. යො පන භික්ඛු භික්ඛූනං සාජීව සමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය. අන්තමසො තිරච්ඡානගතාය 'පි පාරාජිකො හොති අසංවාසො.

තේරුම : යම් භික්ෂුවක් භික්ෂූන් පිළිබඳව අධිශීල සංඛ්‍යාත ශික්ෂාවන්ට පැමිණියේ, උපසම්පදාව ප්‍රතික්ෂේප නොකොට දුර්වලතාවද නොකියා යටත් පිරිසෙයින් තිරිසන්ගිය මාගමක් සමඟ මෛථුන්දම් සේවනය කළේ නම් පරිජි වූයේ නම් වේ. උපසපන් භික්ෂූන් සමඟ සහවාසයට නුසුදුස්සෙක් ද වෙයි.

(පාඨයට ලකුණු 02 + තේරුමට 01 = 03යි)

III. විශාලා මහනුවර කලන්දක නම් ගමේ කලන්දකපුත්‍ර සුදින්න භික්ෂුව පුරාණ භාර්යාව සමඟ මෛථුනධර්මය සේවනය කිරීම නිසා බුදුරදුන් විසින් මේ විනය ශික්ෂාව පනවන ලදි.
එම කථා පුවත ගෙනහැර දක්වා තිබිය යුතුය.

05.

I.

* ගබ්භමෙකෙ උප්පජ්ජන්ති - නිරයං පාපකම්මිනො
සග්ගං සුගතිනො යන්ති - පරිනිබ්බන්ති අනාසවා

(ලකුණු 02 යි)

II. ඇතැමෙක් මිනිස් කුස උපදිති. පවිකාරයෝ නිරයේ උපදිති. සුගතියට යන්නෝ දෙව්ලොව යති. කෙලෙසුන් නැසූ රහතන් වහන්සේලා පිරිනිවන් පාති.

(ලකුණු 03 යි)

III. සැවැත්නුවර තිස්ස නම් තෙර නමක් විසීය. උන්වහන්සේගේ කැපකරුදායක වූයේ මැණිකරු පවුලකි. අවුරුදු දොළසක් උන්වහන්සේ පිණ්ඩපාත ලැබුවේ එම නිවසෙනි. ඒ දෙමහල්ලෝ ද දෙමාපියන් මෙන් ගෙදරටම වැඩම කරවා වළඳවමින් උන්වහන්සේ රැක බලා ගත්හ. ඒ නිසාම උන්වහන්සේ මණිකාරකුලූපග තිස්ස යැයි ප්‍රසිද්ධ වූහ. දිනක් උන්වහන්සේ නිවසට වැඩමවා සිටිද්දී ගෙහිමියා මස් කපමින් සිටියේය. මේ අතර කොසොල් රජු ඔපදමා විහිදෙන ලෙස නියම කොට ඔපුව මැණිකක් එවා තිබුණේය. කොනාල ලේ තැවරුණු අතින්ම මැණික ගෙන බලා

පෙට්ටගම මත තබා දෑත් සෝදාගෙන ඒමට පසුපසට ගියේය. මේ අතර ගෙයි ඇති කරන කොස්වා ලිහිණියෙක් ලේ සුවඳට මස් කැටියකැයි සිතා මැණික ගිල දැම්මේය. මැණික්කරු පැමිණ බලන විට මැණික දක්නට නොහිබිණ. ගෙදර අයගෙන් ඇසූ නමුත් පිළිතුරු ගෙන නොසිටුණි. අන්තිමේදී මැණික්කාරයා සැකකළේ තෙරුන් වහන්සේය. තෙරුන්ගෙන් මැණික ගත්තේ දැයි ඇසූ නමුත් නැතැයි පැවසීය. එය ලිහිණියා ගිල දැමූ බව උන්වහන්සේ දුටුවත් ඒ බව නොපැවසීය. එසේ පැවසුවේ නම් ලිහිණියා මරණ බව දන්නා හෙයින් ඒ බව හෙළි නොකළේය. වධයට පමුණුවා ඇත්ත අසා ගනිමියි සිතා මැණික්කරු තෙරුන් වහන්සේට නොයෙක් වද දුන්නේය. කඹයක් ගෙන හිස වෙළා කරකවා වදදෙන විට හිසෙන් ලේ වැගුරුණි. ඒ ලේ බිමට කොස්වා ලිහිණියා පැමිණියේය. මැණික්කරුගේ පහරින් කොස්වා ලිහිණියා මැරී වැටුණේය. කොස්වා ලිහිණියා මළ බව දැනගත් තෙරුන් වහන්සේ ඒ ලිහිණියාගේ බඩපලා බලන මෙන් පැවසීය. ලිහිණියාගේ කුසපලා බැලූවිට මැණික හමුවිය. මහත් සංවේගයට පත් මැණික්කරු වෙව්ලමින් තෙරුන්ගේ පාමුල වැටී සමාව අයැද සිටියේය. උපාසකයා මෙය ඔබේ හෝ මගේ හෝ දෝෂයක් නොව සංසාර දෝෂයයි කියා ඔහුට සමාව දුන්නේය.

**(මේ අයුරින් පිළිතුර සකස් වී ඇති පිළිතුරට ලකුණු 05යි)**

**06.**

**I.** චුල්ලවග්ගපාළි, දීපවංසය, මහාවංසය, සමන්තපාසාදිකාව

(මේ අතරින් දෙකකි)

**(ලකුණු 02 යි)**

**II.** බුදුරදුන් සියැසින් දැක සිටි එක්සිය විසිවයස් වූ සබ්බකාමී මහරහතන් වහන්සේගේ නායකත්වයෙන් කාලාශෝක රජුගේ දායකත්වයෙන් විශාලා මහනුවර වාළුකාරාමයේදී ත්‍රිපිටකධාරී භික්ෂූන් වහන්සේ හත්සිය නමකගේ සහභාගිත්වයෙන් ධර්මසංගායනාව පැවැත්විය. පුරා මාස අටක කාලයක් ගතවිය. මේ සංගීතියට හත්සිය නමක් සහභාගී වූ නිසා "සත්තසතිකා" විනය සංගීති යැයි කියනු ලැබේ.

(මෙහි සංවිධාන කටයුතු දක්වා තිබිය යුතුවේ.

**(ලකුණු 03 යි)**

**III.**

- වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත් කළ දශ වස්තුව ධර්ම විනය විරෝධී ද ධර්ම විනයට එකග දැයි පරීක්ෂා කිරීම.
- එහිලා කාකණ්ඩපුත්ත යස තෙරුන් විශාලා මහනුවරට වැඩම කොට ග්‍රාම ක්ෂෙත්‍රයෙහි පරීක්ෂා කොට බැලීම.
- වජ්ජිපුත්තක භික්ෂූන් මුදල් සම්මාදමෙහි යෙදෙන බව දැක එය ධර්ම විනයට පටහැනි බව පෙන්වා දෙමින් චෝදනා නැගීම.
- සෝරෙය්‍ය නුවරවැසි රේවත තෙරුන්ද එම අදහසට එකගව කරුණු දැක්වීම.

- දශ වස්තුව ධර්ම විනය විරෝධී දැයි පරීක්ෂා කිරීමට ප්‍රාචීනක - පාවෙය්‍යක භික්ෂූන්ගෙන් යුක්තව බුදුරදුන් සියැසින් දැක සිටි අට නමකගෙන් යුක්ත කාරක සභාවක් පත්කොට පරීක්ෂා කිරීම.
- දශ වස්තුව ධර්ම විනය විරෝධී බව ප්‍රකාශ කිරීම හා ධර්ම විනයෙහි චිරස්ථිතිය උදෙසා සංගීතියක් පැවැත්වීමේ අවශ්‍යතාව පෙන්වා දීම.
- ප්‍රාචීනක භික්ෂූන් ධර්ම විනය විරෝධී බව ප්‍රකාශ කිරීම හා අලජ්ජී භික්ෂූන් නෙරපා හැරීමට ක්‍රියා කිරීම.
- දෙවන ධර්ම සංගීතිය පවත්වා ධර්ම විනය ආරක්ෂා කිරීම ආදියයි.

**ප්‍රතිඵල :**

- චුල්ලවග්ගපාළියේ 21,22 ඛන්ධක දෙක ද අංගුත්තර නිකායේ මුණ්ඩක සූත්‍රයද ඇතුළත් ධර්ම විනය කොට්ඨාස ත්‍රිපිටක පාලියට එක් කිරීම.
- දශ  වස්තුව අධර්මවාදී - අවිනයවාදී යැයි සලකා බැහැර කිරීම
- ධර්ම සංගායනාව පවත්වා බුදුසමය නිර්මලව ආරක්ෂා කිරීම
- දුර්ලබ්ධිගත් අලජ්ජී භික්ෂූන් සසුනෙන් නෙරපා දැමීම
- ථෙරවාදී සංඝ සමාජය නිර්මල කිරීම ආදියයි.

**(මේ අයුරින් පිළිතුර සකස් වී තිබේ නම් ලකුණු 05යි)**

**07.**

**I.**

- ජරාවට පත්වීම ස්වභාවික බව අවබෝධකරගත හැකිවීම
- මරණයට පත්වීම ස්වභාවික බව අවබෝධකරගත හැකිවීම
- ජීවිතය සැමදා එකලෙස නොපවතින බව තේරුම් ගැනීම
- භෞතික සම්පත් සියල්ල ද නිරන්තරව විපරිනාම ධර්මතාවට යටත්වන බව තේරුම් ගැනීම
- අවලෝදනමට මුහුණ පෑමට සිදුවන බව තේරුම් ගැනීම
- මේ තත්වයන් අවබෝධ කරගෙන දෛනික ජීවිතය කළමනාකරණය කර ගනිමින් කුසලයට යොමුවීම

(මේ අතරින් දෙකකි)

**II.**

- අනුසය - අකුසල ධර්ම සිත තුළ නිදාසිටි අවස්ථාවයි
- පරියුට්ඨාන - අකුසල් අවධි වී සිත තුළ පමණක් ක්‍රියාත්මක වන අවස්ථාවයි.
- වීතික්කම - එම අකුසල සිතිවිලි ශාරීරිකව හා වාචසිකව ක්‍රියාත්මක වීමට පටන් ගනී. කයින් හා වචනයෙන් එමනිසා අකුසල් සිදුවේ.

**(ලකුණු 03 යි)**

ii. සති + පට්ඨාන යන වචන දෙකේ එකතුවයි.

**(ලකුණු 05 යි)**

මෙහි සති යනු සිහියයි. පට්ඨාන යන ඵනාකොට පිහිටුවීමයි. සිත මනාකොට පිහිටුවීමේ ආකාර හතරකි. කය අනුව, සිත අනුව, ධර්මතා අනුව, සුවිශේෂී ලෙස බැලීමයි. ඒවා හඳුන්වන්නේ කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා හා ධම්මානුපස්සනා යනුවෙනි. මෙය සතර සතිපට්ඨානයයි.

**(මේ අනුසාරයෙන් පිළිතුර සකස් වී තිබේ නම් ලකුණු 05යි.**

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2567 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023 (2024)

03 S I

## (03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය

පැය එකයි

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිලිමත් කියවා, ඒවා ද පිළිපදින්න.

1. බුදුරජාණන් වහන්සේ උත්තරීතර මනුෂ්‍යයෙකු ලෙස සැලකෙන්නේ,
   (1) සියලු සත්ත්වයන්ට අනුකම්පාවෙන් දහම් දෙසූ බැවිනි.
   (2) සීල, සමාධි, පඤ්ඤා ආදි ශ්‍රේෂ්ඨ ගුණයන්ගෙන් යුතු වන බැවිනි.
   (3) අනුන්ගේ දුක් ගැහැට දැක පිහිටවූ බැවිනි.
   (4) සැපතේදී මෙන් ම විපතේ දී අකම්පිතව කටයුතු කළ බැවිනි.

2. බුදුරජාණන් වහන්සේ දෙතිස් මහාපුරිස ලක්ෂණයන්ගෙන් යුතු වන සේක. ඉන් 'චිතන්තරංසො' ලෙස සඳහන් වන්නේ,
   (1) උඩුකුරු වූ අගින් උඩට නැමුණු ලෝම ඇති බව ය.
   (2) මුහුණ වසාලන තරම් පුළුල් දිව ඇති බව ය.
   (3) මනාව තැනුණ පිට මැද ඇති බව ය.
   (4) පොළොවෙහි මනාව පිහිටි පා ඇති බව ය.

3. බුදුරජාණන් වහන්සේ සතු උත්තරීතර අසමසම ගුණ අතර ත්‍රිවිද්‍යා හා අෂ්ටවිද්‍යා ඥානයන්ට අයත්වන ඥානය කුමක් ද?
   (1) විපස්සනා ඥාණය
   (2) පරචිත්තවිජානන ඥාණය
   (3) මනොමය ඉද්ධි ඥාණය
   (4) දිබ්බචක්ඛු ඥාණය

4. භාගවතුන් වහන්සේ සර්ව ප්‍රකාරයෙන්ම ලෝකය දැන වදාළ සේක. එම උතුම් බුදුගුණය
   (1) සම්මාසම්බුද්ධ නම් වේ.
   (2) විජ්ජාචරණ නම් වේ.
   (3) ලෝකවිදූ නම් වේ.
   (4) බුද්ධ නම් වේ.

5. අංජලිකරණීය ගුණය යටතේ ගරුකළයුත්තන්ට ගරුකරන, පිදියයුත්තන්ට පුදන ක්‍රම හතරකි. ඉන් 'පච්චුට්ඨාන' ලෙස දැක්වෙන්නේ,
   (1) හිස මුදුනෙන් වැඳීම යි.
   (2) ආසනයෙන් නැගී සිටීම යි.
   (3) දෑත් එක්කොට සමාචාර දැක්වීම යි.
   (4) වතාවත් කිරීම යි.

6. සතරපද ගාථාවකින් එක් පදයක් හෝ වණපොත් කරගත නොහැකිව සෙසු භික්ෂූන් වහන්සේලා විසින් විහාරයෙන් නෙරපන ලද්දේ,
   (1) මහා පන්ථක හිමියන් ය.
   (2) චූල්ලපන්ථක හිමියන් ය.
   (3) සෝපාක හිමියන් ය.
   (4) තිස්ස හිමියන් ය.

7. එදිනම පැවිදි වූ සත් හැවිරිදි සාමණේරයන් වහන්සේ නමක් උවදු මට අනුශාසනා කරන්නේ නම් එය හිස මුදුනෙන් පිළිගනිමියි පැවසූ උතුම් නිහතමානී බව පළ කළ මහරහතන් වහන්සේ කවු ද?
   (1) සැරියුත් මහරහතන් වහන්සේ
   (2) මුගලන් මහරහතන් වහන්සේ
   (3) උපාලි මහරහතන් වහන්සේ
   (4) අස්සජි මහරහතන් වහන්සේ

[ 2 වන පිටුව බලන්න.

8. බුදුරජාණන් වහන්සේවෙත භික්ෂූන් වහන්සේලා පිළිබඳ පංචවරයන් ඉදිරිපත් කරන ලද්දේ,
   (1) උදායි තෙරුන් ය. (2) දේවදත්ත තෙරුන් ය.
   (3) ඡන්න තෙරුන් ය. (4) ඡබ්බග්ගිය තෙරුන් වහන්සේලා ය.

9. "ස්වාමීනි, මා මෙතෙක් දවස් රූප මදයෙන් මත්ව ඔබ වහන්සේ රූපය හෙළා දකින බව අසා ඔබ වහන්සේ හමුවට නොපැමිණියෙමි. දැන් මාහට සත්‍ය වැටහිනි." මෙසේ පවසා තෙරුවන් සරණ ගියේ,
   (1) උප්පලවණ්ණාව යි. (2) සුජාතාව යි. (3) ඛේමාව යි. (4) කිසාගෝතමිය යි.

10. "අටුවාචාර්ය බුද්ධඝෝෂ මාහිමියෝ හෙළටුවා පෙළබසට නඟාලූහ." ඉන් අංගුත්තර නිකාය සඳහා කළ අටුවාව
   (1) සුමංගලවිලාසිනිය යි. (2) සාරත්ථප්පකාසිනිය යි.
   (3) කංඛාවිතරණිය යි. (4) මනෝරථපූරණිය යි.

- 11, 12 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු ම පිළිතුර තෝරන්න.

11. ආයුෂ්මත් ධනිය හිමියෝ අනවසරයෙන් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් දැව ගැනීම පිළිබඳ ඇති වූ ගැටලුව විසඳා බුදුරජාණන් වහන්සේ …………… පාරාජිකාපත්තිය පැනවූහ.
   (1) මෛථුනධම්ම (2) අදින්නාදාන (3) උත්තරිමනුස්සධම්ම (4) මනුස්සවිග්ගහ

12. ස්ත්‍රී පුරුෂයන්ගේ ලියුම්, පණිවිඩ ඔවුනොවුන් වෙත ගෙනයාම ඔවුන්ගේ දෙමාපියන් අතර පණිවිඩ හුවමාරුව මගින් භික්ෂූන් වහන්සේට …………… සංඝාදිසේසාපත්තිය සිදු වේ.
   (1) කුල දූසක (2) සංචරිත්ත (3) අත්තකාම පාරිචරිය (4) කාය සංසග්ග

13. අනියත සික්ඛා ඇවත සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
   A – පිළිගත හැකි වදන් ඇති උපාසිකාවක විසින් චෝදනා කිරීම
   B – මෛථුනයට යෝග්‍ය ස්ථානයක සිටීම
   C – චෝදනා කළ වහාම ඇවතට පත්වීම
   D – භික්ෂුව විසින් චෝදනාව පිළිගැනීම
   (1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය. (4) B, C සහ D ය.

14. වර්තමානයේ භික්ෂූන් වහන්සේලාගේ උපසම්පදා විනය කර්මය සිදු කරනු ලබන්නේ,
   (1) ඤත්තිචතුත්ථකම්ම ක්‍රමයෙනි. (2) අට්ඨවාචික ක්‍රමයෙනි.
   (3) පඤ්හ ව්‍යාකරණ ක්‍රමයෙනි. (4) සරණාගමන ක්‍රමයෙනි.

15. සුත්තන්ත භාජනීය, අභිධම්ම භාජනීය, පඤ්හ පුච්ඡක යන තුන් ආකාරයට ඛන්ධ, ධාතු, ආයතන බෙදා දක්වා ඇත්තේ අභිධර්ම පිටකයේ,
   (1) ධාතුකථා ප්‍රකරණයේ ය. (2) ධම්මසංගණී ප්‍රකරණයේ ය.
   (3) විභංග ප්‍රකරණයේ ය. (4) කථාවත්ථු ප්‍රකරණයේ ය.

16. සිගාල සූත්‍රයේ සඳහන් අපායසහාය මිත්‍ර ප්‍රතිරූපකයාගේ ලක්ෂණ අතරට අයත් නොවන්නේ,
   (1) රහමෙර පානය සඳහා යහළුවෙකු වීම
   (2) අවේලාවේ වීථි සංචාරය සඳහා යහළුවෙකු වීම
   (3) සූදු කෙළිය සඳහා යහළුවෙකු වීම
   (4) මිතුරාගේ නරක ක්‍රියා අනුමත කිරීම

17. යමක් පිළිගැනීමට එකම පදනම නොවිය යුතු කරුණු දහයක් කාලාම සූත්‍රයේ දක්වා ඇත. එහි "මා නො ගරූ" යනුවෙන් දැක්වෙන්නේ,
   (1) මෙය මෙසේ විය හැකියැයි නොපිළිගත යුතු ය.
   (2) පරපුරෙන් ආ බැවින් නොපිළිගත යුතු ය.
   (3) න්‍යාය ධර්මයට ගැලපේයැයි නොපිළිගත යුතු ය.
   (4) ඇදුරු පමණින් නොපිළිගත යුතු ය.

18. ආපත්තිභය සූත්‍රයට අනුව පාටිදේසනීය ආපත්ති පිළිබඳ ඇතිකර ගත යුත්තේ,
   (1) ප්‍රසිද්ධියේ ගැරහුම් ලැබීමක් තරම් බියකි. (2) හිසගසා දැමීමක් තරම් බියකි.
   (3) මොහොලකින් පහරකෑමක් සමාන බියකි. (4) අලු පොදියකින් පහරකෑමක් තරම් බියකි.

[ 3 වැනි පිටුව බලන්න

19. නිධිකණ්ඩ සූත්‍රයට අනුව තමන් ඉගෙන ගත් ශිල්ප ශාස්ත්‍ර හා පුරුදු පුහුණු කළ විද්‍යා ශිල්ප වැනිදේ අයත් වන්නේ,
(1) ථාවර නිධානයට ය. (2) ජංගම නිධානයට ය.
(3) අංගසම නිධානයට ය. (4) අනුගාමික නිධානයට ය.

20. අභිධර්මයේ රූප විග්‍රහයේදී රූප සමුට්ඨාන හෙවත් රූප උපදවන හේතු හතරක් දක්වා ඇත. එම නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
(1) පඨවි, ආපෝ, තේජෝ, වායෝ (2) අහේතු, සප්පච්චය, සාසව, සංඛත
(3) කම්ම, චිත්ත, උතු, ආහාර (4) රූප, සද්ද, ගන්ධ, රස

21. චෛතසික විග්‍රහයේ එන ප්‍රකීර්ණක චෛතසික එම නමින් හඳුන්වා ඇත්තේ,
(1) කුසල අකුසල සිත්හි මිශ්‍රව යෙදෙන බැවිනි.
(2) අකුසල සිත්හි පමණක් යෙදෙන බැවිනි.
(3) කුසල සිත්හි පමණක් යෙදෙන බැවිනි.
(4) අකුසල සිත්හි අඩු වශයෙන් ද කුසල සිත්හි වැඩි වශයෙන් ද යෙදෙන බැවිනි.

22. පච්චේක බුද්ධ හෙවත් පසේබුදු බව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
A – පසේ බුදුරජාණන් වහන්සේ අනයන්ට ධර්මාවබෝධ කරවීමට සමත් නොවෙති.
B – පසේ බුදුරජාණන් වහන්සේට සර්වඥතා ඥානය හෝ වසීභාවය ඇත.
C – තමන් වහන්සේම චතුරාර්ය සත්‍යය අවබෝධ කරන සේක.
D – පසේ බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා වැඩ සිටින සමයේ පහළ නොවන සේක.

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය. (4) B, C සහ D ය.

23. ධම්මපදයේ සහස්ස වර්ගයේ එන "අත්තාහවේ ජිතං සෙය්‍යො" යන ගාථාවේ සඳහන් "නිච්චං සඤ්ඤතචාරිනො" යන්නෙහි අර්ථය වන්නේ,
(1) ආර්යයන් වහන්සේට නිතර කරන පූජාව උසස් බව යි.
(2) කෙලෙස් සිඳලූ උතුමෝ නිතර සංවරව හැසිරෙන බව යි.
(3) ධ්‍යාන භාවනා කරන්නාගේ එක් දවසක ජීවිතය උතුම් බව යි.
(4) රහතන් වහන්සේගේ සිත් තුළ නැවත කෙලෙස්ධර්ම ඉපදවිය නොහැකි බව යි.

24. දානසීලාදී යහපත් කටයුතු පුනපුනා කළ යුතු ය. සිත අකුසල සිතිවිලි හා ක්‍රියාවන්ට යොමුවීමෙන් වළකාගත යුතු ය. මෙම අර්ථය කියවෙන ධම්මපද ගාථාවේ මුල් අර්ථය දක්වා ඇත්තේ
(1) අභිත්වරෙථ කල්‍යාණෙ - පාපා චිත්තං නිවාරයෙ
(2) පාපං චෙ පුරිසො කයිරා - න තං කයිරා පුනප්පුනං
(3) පාපොපි පස්සති භද්‍රං - යාව පාපං න පච්චති
(4) මාප්පමඤ්ඤෙථ පුඤ්ඤස්ස - න මං තං ආගමිස්සති.

25. ධම්මපදයේ දණ්ඩ වර්ගයේ එන "සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී" යන පදයන්ගෙන් හඳුන්වන්නේ,
(1) සිල්වත් භික්ෂූන් වහන්සේ ය. (2) උතුම් පැවතුම් ඇති තැනැත්තා ය.
(3) කෙලෙස් නැසූ උතුමන් වහන්සේ ය. (4) ත්‍රිවේද පාරප්‍රාප්ත බමුණා ය.

26. ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ ලෙස හඳුන්වන්නේ,
(1) සමථ භාවනාවෙන් සිත සමාධිගතකර විදර්ශනාවෙන් කෙලෙස් නැසූ උතුමන් වහන්සේ ය.
(2) සිව් පිළිසිඹියාපත් රහත් බවට පත් උතුමන් වහන්සේ ය.
(3) සවිත්තුල මනසිකාරයෙන් කෙලෙස් නැසූ උතුමන් වහන්සේ ය.
(4) විදර්ශනාවෙන් පමණක් කෙලෙස් නැසූ උතුමන් වහන්සේ ය.

27. "හෙතුං පටිච්ච සම්භූතං - හෙතු භංගා නිරුජ්ඣති" යන පාඨයෙහි නිවැරදි අර්ථය සඳහන් ප්‍රකාශය තෝරන්න.
(1) හේතුවකින් හටගත් සියල්ල හේතුව නැතිවීමෙන් අවසන් වේ.
(2) අහේතුකව හටගත් සියල්ල අහේතුකව අවසන් වේ.
(3) හේතුවකින් හටගත් සියල්ල අහේතුකව අවසන් වේ.
(4) අහේතුකව හටගත් සියල්ල හේතු සහිතව අවසන් වේ.

[ 4 වැනි පිටුව බලන්න

28. බුදුදහමේ ඉගැන්වෙන කර්ම සංකල්පය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) කර්මය සාංසාරික පැවැත්මේ ප්‍රබල සාධකයකි.
   (2) සියලු ක්‍රියාවන්ට කර්මය ප්‍රධාන වේ.
   (3) සියල්ල කර්මයෙන් සිදු නොවේ.
   (4) අතීත කර්මයෙන් ලැබෙන විපාක උත්සාහයෙන් වෙනස් කළ හැකි ය.

29. දස සංයෝජන ධර්ම අතර තියෙන සිත එක් අරමුණක රඳවා තබා ගැනීමට අපහසු ස්වභාවය
   (1) රූපරාග නම් වේ. (2) අරූපරාග නම් වේ.(3) මාන නම් වේ. (4) උද්ධච්ච නම් වේ.

30. පුද්ගල චරිත වර්ගයන්ට අනුව දසඅසුභ හා කායගතාසති භාවනා වඩාත්ම යෝග්‍ය වන්නේ,
   (1) රාග චරිතයට ය. (2) ද්වේෂ චරිතයට ය. (3) සද්ධා චරිතයට ය. (4) බුද්ධි චරිතයට ය.

31. සතර සතිපට්ඨානයේ සිත පිහිටුවා ගැනීමෙන් උපදවා ගත හැක්කේ,
   (1) සම්මා සමාධිය යි. (2) සම්මා සතිය යි. (3) සම්මා දිට්ඨිය යි. (4) සම්මා සංකප්පය යි.

32. සතර සතිපට්ඨාන ධර්ම අතර චිත්තානුපස්සනා ලෙස දක්වා ඇත්තේ,
   (1) කය පිළිබඳ සිහිය පිහිටුවා මෙනෙහි කිරීම යි.
   (2) වේදනා පිළිබඳ සිහිය පිහිටුවා මෙනෙහි කිරීම යි.
   (3) සිතිවිලි පිළිබඳ සිත පිහිටුවා මෙනෙහි කිරීම යි.
   (4) සිතට දැනෙන ධර්මතා පිළිබඳ සිත පිහිටුවා මෙනෙහි කිරීම යි.

33. බුද්ධකාලීන ෂට් ශාස්තෘවරුන් අතර අමරාවික්ඛේපවාදය ගෙන හැර දැක්වූයේ,
   (1) අජිතකේසකම්බල ය. (2) පකුධකච්චායන ය.
   (3) සංජයබෙල්ලට්ඨිපුත්ත ය. (4) නිගණ්ඨනාථපුත්ත ය.

34. මහායාන බුදුසමයේ ඉගැන්වෙන දසභූමි සංකල්පයේ ප්‍රභාකරී භූමිය ලෙස සැලකෙන්නේ,
   (1) බබළන බව යි. (2) ප්‍රීතිමත් බව යි. (3) නිර්මල බව යි. (4) නිශ්චල බව යි.

35. 'ධර්ම දේශනා පැවැත්වීමේදී ශ්‍රාවකයා තුළ එම දහම් සතුටුරු කිරීමට දේශකයන් වහන්සේ සමත් විය යුතු ය.' එහිදී සච්චවිභංග සූත්‍රයට අනුව සමාදපනා ලෙස දක්වා ඇත්තේ,
   (1) කරුණු විස්තරාත්මකව පැහැදිලි කිරීම යි. (2) සතුටුරු වූ කරුණු විවෘත කර දැක්වීම යි.
   (3) විවරණය කළ දහමෙහි ඡන්දය දැක්වීම යි. (4) හඳුනාගත් දහම් කරුණු සතුටුරු කිරීම යි.

36. රාජ්‍ය පාලකයා හා අනුගාමික පිරිස් අධාර්මික වන විට ස්වභාවධර්මයට පවා බලපෑම් ඇතිකර රටවැසියාට අහිතකර අයුරින් ක්‍රියාත්මක වන බව දේශනා කර ඇත්තේ,
   (1) දීඝනිකායේ කූටදන්ත සූත්‍රයේ ය. (2) අංගුත්තර නිකායේ අධම්මික සූත්‍රයේ ය.
   (3) දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.(4) අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍රයේ ය.

37. අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍රයේ ඇතුළත් පංචබලි සංකල්පයේ දේවතා බලි ලෙස සඳහන් වන්නේ,
   (1) ආගමික කටයුතු සඳහා ධනය වෙන් කිරීම යි.
   (2) ඥාතීන් වෙනුවෙන් ධනය වෙන් කිරීම යි.
   (3) ආගන්තුකයන් වෙනුවෙන් ධනය වෙන් කිරීම යි.
   (4) රජය වෙනුවෙන් ධනය වෙන් කිරීම යි.

38. දියුණුවන්නාගේ හා පිරිහෙන්නාගේ ස්වභාවය පැහැදිලි කරමින් මිහිඳු මා හිමියන් විසින් ලක් වැසියන්ට දේශනා කළ සූත්‍රය වන්නේ,
   (1) අග්ගික්ඛන්ධෝපම සූත්‍රය යි. (2) බාල පණ්ඩිත සූත්‍රය යි.
   (3) දේවදූත සූත්‍රය යි. (4) ධම්මචක්කප්පවත්තන සූත්‍රය යි.

39. සතර බ්‍රහ්මවිහාර සම්බන්ධව වැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.
   (1) සතර බ්‍රහ්මවිහාර වැඩීමෙන් බඹලොව ඉපදිය හැකි ය.
   (2) බ්‍රහ්මලෝක වැසියන් සතර බ්‍රහ්මවිහාරයෙන් වාසය කරයි.
   (3) පුද්ගලයා පුහුණු කළයුතු උතුම් ගුණ හතරකි.
   (4) සතර බ්‍රහ්මවිහාර චෛතසිකයන්ට අයත් නොවේ.

40. රූපයන්ගේ දක්නට ලැබෙන උත්පාද ආදී ලක්ෂණ ලක්ෂණ රූප නම් වේ. එහි 'සන්තති' ලෙස දැක්වෙන්නේ,
   (1) කර්මාදී හේතු නිසා රූපයන්ගේ ප්‍රථම හටගැනීම වේ.
   (2) නැවත හටගැනීමෙන් රූප පරම්පරාව පැවතගෙන යාම වේ.
   (3) රූපයන්ගේ දිරාපත් වීම යි.
   (4) රූපයන්ගේ බිඳියාම යි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2567 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023 (2024)

## (03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

**03 | S | II**

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

I කොටසේ ප්‍රශ්නය ද, II හා III යන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක මහාසංඝරත්නය සුපටිපන්නෝ යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න.

(ii) ධම්මදායාද සූත්‍රයට අනුව භික්ෂූන් වහන්සේ ආමිසදායාද යැයි හැඳින්වීමට හේතු සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

(iii) පාරාජිකාපත්තිස්කන්ධය ගරුකාපත්ති ගණයෙහිලා සැලකීමට මුල්වන හේතු දෙක පෙන්වා දෙන්න.

(iv) සතිපට්ඨානය මෙනෙහි කරන යෝගාවචරයා තුළ පැවතිය යුතු අත්‍යවශ්‍යම ලක්ෂණ දෙකක් ලියන්න.

(v) බුදුසසුනෙහි විනයනීති පැණවීමේ අවශ්‍යතාව මතු කළ ආසවට්ඨානීය ධර්ම දෙකක් ඉදිරිපත් කරන්න.

(vi) රත්මලානේ ධම්මාලෝක නාහිමි විසින් පැවිදි-ගිහි උභය ශිෂ්‍ය ප්‍රජාව අරමුණු කොට අරඹන ලද විද්‍යාස්ථාන දෙක නම් කරන්න.

(vii) බුදුරදුන්ගේ දසබල ඥාණ අතර ඉන්ද්‍රියපරෝපරියත්ත ඥාණයට හසුවන සත්ත්වයාගේ ස්වභාව සත්ත්වයන් දෙකක් පෙන්වා දෙන්න.

(viii) "සචෙ නෙරෙසි අත්තානං - කංසො උපහතො යථා,
එස පත්තොසි නිබ්බානං - සාරම්භො තෙ න විජ්ජති"

ඉහත ගාථාවේ සඳහන් 'සාරම්භො' යන්නට අයත්වන ක්‍රියාකාරකම් දෙකක් දක්වන්න.

(ix) පුනර්භවයට ප්‍රධානවන කර්මයේ දෙයාකාර වූ කර්ම විපාක නම් කරන්න.

(x) අටවිම රූපකලාප අතරින් විඤ්ඤත්තිරූප දෙක ලියා දක්වන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

### II කොටස

2. (i) ත්‍රිවිධරත්නය, රත්න නාමයෙන් හැඳින්වීමට හේතු දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) "බුදුරජාණන් වහන්සේ සර්වප්‍රකාරයෙන්ම ලෝකය ගැන දැන වදාළ සේක." මෙහි ඇතුළත් ත්‍රිවිධාකාර ලෝකය ඉදිරිපත් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) බුදුරජාණන් වහන්සේගේ ශාස්තෘ (සත්ථා) ගුණය දක්වා එය ප්‍රකට කළ අවස්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

3. (i) ශාසනික පුනර්ජීවනයෙහි යෙදුණු 17-20 සියවස් අතර මුදුනපුන මැබළ වූ, ඔබට නිර්දේශිත යතිවරයන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉහතින් ඔබ නම් ලියූ යතිවරයන් වහන්සේලා දෙනම ශාසනික පුනර්ජීවනයෙහි අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් පහදන්න. *(ලකුණු 03 යි)*

(iii) මෑත යුගයෙහි ධර්ම-ශාස්ත්‍රීය පුනරුදයෙහි ක්‍රියාකාරී වූ නූතන යතිවරයන් වහන්සේලා දෙනමකගේ සේවාව අගයන්න. *(ලකුණු 05 යි)*

4. (i) සංඝාදිසේසාපත්තියට පැමිණි භික්ෂුවක විසින් පාරිශුද්ධිය සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) කායසංසර්ග සංඝාදිසේසාපත්තිය ලියා එහි අර්ථය ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) කායසංසර්ග සංඝාදිසේසාපත්තියෙහි නිදානය දක්වා එම ශික්ෂාපදයෙහි ඇතුළත් 'ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන' යන්න විචාරයට ලක් කරන්න. *(ලකුණු 05 යි)*

## III කොටස

5. (i) "උදකංහි නයන්ති නෙත්තිකා" යන ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) සත් හැවිරිදි වයසේදීම රහත් වූ සුඛ සාමණේරයන් වහන්සේගේ කථා පුවත දක්වා අධ්‍යාත්ම ශික්ෂණයෙහිලා වර්තමාන භික්ෂු පරපුරට එයින් ලබාදෙන ආදර්ශ පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

6. (i) සිව්වැනි ධර්ම සංගීතිය පැවැත්වීමෙහිලා දායකත්වය දැරූ රජතුමා හා ප්‍රධානත්වය ඉසුලූ තෙරුන් වහන්සේගේ නම් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) සිව්වැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ත්‍රිපිටකයට අදාළව සම්පාදනය වූ අටුවා ග්‍රන්ථ තුන කෙටියෙන් දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) සිව්වැනි ධර්ම සංගීතිය පැවැත්වීමෙහිලා බලපෑ හේතු සාධක තුනක් දක්වා සංගීතියෙන් පසු වර්ධනය වූ මහායානවාදයේ මූලික සංකල්ප දෙකක් කෙටියෙන් පහදන්න. *(ලකුණු 05 යි)*

7. (i) "දුකෙහි කර්තෘ තමා හෝ අනුන් හෝ ලෙස (සයංකතං දුක්ඛං - පරංකතං දුක්ඛං) හඳුනාගැනීමේ අර්ථය දාර්ශනිකව අන්ත දෙකක් ඇති කරයි." එම අන්තවාද දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) අස්සජි මහරහතන් වහන්සේ උපතිස්ස පිරිවැජියාණට දේශනා කළ පටිච්චසමුප්පාද දේශනාව ලියා එහි අර්ථය ද පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

(iii) සත්ත්වයාගේ සාංසාරික දුක ඇතිවීම හා නැති කිරීම පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අනුව පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

* * *

# 2567- පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023(2024)

## (03) ත්‍රිපිටක ධර්මය

## ලකුණු ලබාදීම

## I පත්‍රය

- ❖ අංක 01 සිට 40 දක්වා (ලකුණු 01 x 40) - ලකුණු 40යි.

## II පත්‍රය

### I කොටස

01. පහත සඳහන් ප්‍රශ්නවල කෙටි පිළිතුරු සපයන්න.
ලකුණු 02 x 10 = 20 යි.

### II කොටස හා III කොටස

(02) ප්‍රශ්න අංකයේ සිට (07) ප්‍රශ්නය තෙක් සියලු ප්‍රශ්න සඳහා

I ප්‍රශ්නයට ලකුණු 02 යි.

II ප්‍රශ්නයට ලකුණු 03 යි.

III ප්‍රශ්නයට ලකුණු 05 යි. , 02 + 03+ 05 = 10 යි.

ලකුණු ලබා දිය යුතු වේ.

## I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 1 | 2 | 21 | 1 |
| 2 | 3 | 22 | 3 |
| 3 | 4 | 23 | 2 |
| 4 | 3 | 24 | 1 |
| 5 | 2 | 25 | 3 |
| 6 | 2 | 26 | 4 |
| 7 | 1 | 27 | 1 |
| 8 | 2 | 28 | 2 |
| 9 | 3 | 29 | 4 |
| 10 | 4 | 30 | 1 |
| 11 | 2 | 31 | 2 |
| 12 | 2 | 32 | 3 |
| 13 | 2 | 33 | 3 |
| 14 | 1 | 34 | 1 |
| 15 | 3 | 35 | 4 |
| 16 | 4 | 36 | 2 |
| 17 | 3 | 37 | 1 |
| 18 | 1 | 38 | 3 |
| 19 | 3 | 39 | 2 |
| 20 | 3 | 40 | 2 |

(ලකුණු 01 x 40) - ලකුණු 40යි.

# II පත්‍රය

## I කොටස

**01.**

I. නිර්වාණ අවබෝධය සඳහා පිළිපන් බැවින් ද, ආර්ය මාර්ගයට පිළිපන් බැවින් ද යනුයි.

II. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර ආදිය පිළිගැනීමේ දී ප්‍රමාණ දන්නේ යනුයි. මේ අතරින් කරුණු දෙකකි.

III. පාරිශුද්ධි ක්‍රමයක් නැති බැවින් ද, භික්ෂුත්වයෙහි අනන්‍යතාවට හානිකර බැවින් ද යනුය.

IV. කෙලෙස් තවන දැඩි වීර්යය (ආතාපී)
නුවණින් යුක්ත බව (සම්පජානො)
සිහි ඇත්තේ (සතිමා) මේ අතරින් දෙකකි.

V. පැවිදි වී බොහෝ කල්වත හික්ෂූන් බහුල වීම (රත්තඤ්ඤු මහත්තතා)
සංඝයා පිරිස වශයෙන් විශාල වීම (වෙපුල්ල මහත්තතා)
ලාභ ප්‍රයෝජන බහුලවීම (ලාභග්ග මහත්තතා)
බහුශ්‍රැතයන් වැඩිවීම (බාහුසච්ච මහත්තතා) මේ අතරින් දෙකකි.

VI. විද්‍යාලංකාර ශාස්ත්‍ර ශාලාව
ශ්‍රී ධර්මාලෝක බෞද්ධ පාඨශාලාව යනුයි.

VII. අදහස් (ආසය)
නැවත නැවත උපදින කෙලෙස් (අනුසය)
පුද්ගල චරිත ස්වභාවය (චරිත)
රුචිය (අධිමුක්ති) මේ අතරින් දෙකකි.

VIII. එකට එක කියා ගැනීම,
බැන්නොත් බැනීම,
ගැහුවොත් ගැහීම යනුයි. මෙයින් දෙකකි.

IX. ප්‍රතිසන්ධි විපාක
ප්‍රවෘත්ති විපාක යනු යි.

X. කාය විඥප්ති
වචී විඥප්ති යනු යි.

(ලකුණු 02 x 10 = 20 යි.)

## II කොටස

**02.**

I.

- විසිතුරු බව - චිත්තීකතං,
- ඉතා අගනා බව - මහග්ඝං,
- කිසිවකට සමාන නොවන බව - අතුලං
- කලාතුරකින් දකින්නට ලැබෙන බව - දුල්ලභ දස්සනං
- උසස් පුද්ගලයන් විසින් පරිභෝග කරනු ලැබීම - අනෝම සත්ත පරිභෝගං.

**මේ අතරින් දෙකකි.**

**(ලකුණු 02 යි.)**

II. සත්ත්ව ලෝකය, සංස්කාර ලෝකය හා අවකාශ ලෝකය

**මේ ගැන කෙටියෙන් දක්වා තිබිය යුතු ය.**

**(ලකුණු 03 යි.)**

III. බුදුරජාණන් වහන්සේ දෙව්මිනිසුන්ට මෙලොව දියුණුවට ද පරලොව දියුණුවට ද නිර්වාණය පිණිස ද අනුශාසනා කරන නිසා ශාස්තෘවරයා යැයි කියනු ලැබේ.

ඒක සාටක බමුණා, අංගුලිමාල, ආලවක, සච්චක, බකබ්‍රහ්ම, සුන්දරික භාරද්වාජ, සුනීත, සෝපාක, ආදීන්ට ද පිහිට වූ අවස්ථා දෙකක් විස්තර කර තිබිය යුතු වේ.

**(හැඳින්වීමට ලකුණු 03 ක් ද , අවස්ථා දෙකට ලකුණු 02 ක් ද 03 + 02 = ලකුණු 05 යි.)**

**03.**

I. වැලිවිට සරණංකර සංඝරාජ හිමි

රත්මලානේ ධර්මාරාම හිමි

හික්කඩුවේ සුමංගල හිමි

හේන්පිටගෙදර ඥාණසීහ හිමි

රත්මලානේ ධර්මාලෝක හිමි

වේරුකානේ චන්දවිමල හිමි

**මේ අතරින් කරුණු දෙකකි.**

**(ලකුණු 02 යි.)**

II. ශාසන පුනර්ජීවයෙහි නැවත උපසම්පදාව පිහිටුවීම.

සිල්වත් සමාගම ආරම්භ කොට ශාසනික වත පිළිවෙත සහවුරු කිරීම.

නියමතඹද පිරිවෙන, විද්‍යෝදය , විද්‍යාලංකාර පිරිවෙන් ආරම්භ කිරීම.

දැන උගත් ශිෂ්‍ය පරපුරක් ඇති කරලීම.

ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ රචනා කිරීම.

ධර්ම ශාස්ත්‍රීය පුනරුදයෙහිලා වාද-විවාද ඇති කිරීම ආදිය.

**මේ අතරින් තුනකි.**

**(ලකුණු 03 යි.)**

III. වැලිවිට සරණංකර සංඝරාජ හිමි, රත්මලානේ ධර්මාලෝක හිමි, හික්කඩුවේ සුමංගල හිමි, රත්මලානේ ධර්මාරාම හිමි, වේරුකානේ චන්දවිමල හිමි, හේන්පිටගෙදර ඤාණසීහ හිමි අතරින් දෙනමකගේ නම් හා ආරම්භ කළ ධර්ම- ශාස්ත්‍රීය ආයතන, ශිෂ්‍ය පරපුර, ලියන ලද ධර්ම-ශාස්ත්‍රීය ග්‍රන්ථ ආදිය ඇසුරින් සේවාව දක්වා තිබිය යුතුයි.

(ලකුණු 05 යි.)

04.

I. පිරිවෙස් සමාදන් වීම, මානත් පිරීම, අබ්භාන විනය කර්මයට භාජනය වීම මෙ අතරින් දෙකකි.

(ලකුණු 02 යි.)

II. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමෙන සද්ධිං කාය සංසග්ගං සමාපජ්ජෙය්‍ය හත්ථගාහං වා වෙණිගාහං වා අඤ්ඤතරස්සවා අඤ්ඤතරස්සවා අංගස්ස පරාමසනං සංඝාදිසෙසො.

**අර්ථය :** කිසියම් භික්ෂුවක් රාගයට බැස (රාගයෙන්) පෙළුණු සිතින් මාගමක් සමග අතගැනීම හෝ කෙස්වැටිය ගැනීම හෝ අනෙක් අනෙක් අවයවයක් හෝ ස්පර්ශ කිරීම යන ආකාරයකින් කයින් ස්පර්ශ කිරීමකට පත් වේ නම් සංඝාදිසේසාපත්තිය වෙයි.

❖ සංඝාදිසේසය දක්වීමට - ලකුණු 02 යි.
❖ අර්ථය දක්වීමට - ලකුණු 01 යි.

(02 + 01 = ලකුණු 03යි.)

III. බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සේක. ආයුෂ්මත් උදායි තෙරණුවෝ දර්ශනීය ආරණ්‍ය සේනාසනයක වැඩ වසති. සිත් ගන්නා සුළු අලංකාර විහාරයන්ගෙන් පිරි විහාරය නැරඹීමට බැමිණිය සමග බ්‍රාහ්මණයෙක් පැමිණියේ ය. එහිදී උදායි තෙරණුවෝ බැමිණියගේ ශරීරාංග ස්පර්ශ කළහ. ඒ බව දනගත් බ්‍රාහ්මණතෙමේ උදහසට පැමිණ උදායි තෙරුන් කෙරෙහි වෛර ඇතිකරගත්තේ ය. මේ කරුණ නිමිති කොට කාය සංසර්ග සංඝාදිසේසාපත්තිය බුදුරදහු පැනවූහ.

'ඔතිණ්ණො විපරිණතෙන චිත්තේන' යන්නෙන් කාය සංසර්ග රාගයට බැස එම රාගයෙන් මඩනාලද, රාගයෙන් පෙළුණ, උමතු වූ සිත් ඇතිව කටයුතු කිරීම අදහස් කරයි.

සිත රාගයෙන් රත් වූ විට ද්වේශයෙන් දූෂිත වූ විට මෝහයෙන් මුලා වූ විට විපරිණත හෙවත් වෙනස් වූ සිතක් ඇති වේ. මෙහි එසේ විපරිණාමයට පත්, සිතින් යුක්තව ක්‍රියා කිරීම අදහස් කරයි.

❖ නිදානයට - ලකුණු 03 යි.
❖ විචාරයට - ලකුණු 02 යි.

(03 + 02 = ලකුණු 05 යි.)

## III කොටස

05.

I. උදකංහි නයන්ති නෙත්තිකා   උසුකාරා **නමයන්ති තේජනං**
දාරුං **නමයන්ති** තච්ඡකා   - අත්තානං **දමයන්ති පණ්ඩිතා**

**(ලකුණු 02 යි.)**

II. දියඇළවෝ හෙවත් වාරි කම්කරුවෝ ජලය ගෙන යති. හී වඩුවෝ ඊ දඬු නමති. වඩුවෝ දව නමති. **පණ්ඩිතයෝ** තමා දමනය කරති.

**(ලකුණු 03 යි.)**

III. සැරියුත් තෙරුන් වහන්සේගේ අන්තේවාසික වූ සුඛ සාමණේරයන් වහන්සේ පිඬු සිඟා වැඩම කිරීමේ දී ජලවාහකයන් ඇලවේලිවලින් දිය ගෙන යන ආකාරයත්, ඊ වඩුවන් ඊතල ඇද අරින අයුරුත්, වඩුවන් ලී වකගසා රියසක සාදන ආකාරයත් දැක, ' ඔවුන්ට එසේ කළහැකි නම්, මට මගේ සිත පාලනය කරගත නොහැකි දැයි ' යන සිතිවිල්ල ඇති කරගත්හ. එසේ කර්මස්ථාන වඩා සිත දමනය කොට රහත් වූහ. එම කථා පුවත මෙහි දක්වා තිබිය යුතුයි.

**ආදර්ශය :** අප අවට පරිසරයේ දක්නට ලැබෙන විවිධ දර්ශනයන්, පුද්ගල ක්‍රියාකාරකම් කර්මස්ථාන ලෙස ගෙන භාවනා වැඩීමෙන් රහත් වීම වර්තමාන භික්ෂු පරපුරට සැපයෙන වැදගත් ආදර්ශයයි. සිත දමනය කරගැනීමට අධිෂ්ඨාන කිරීමත් වැදගත් ආදර්ශයකි.

- ❖ නිදානයට - ලකුණු 03 යි.
- ❖ ආදර්ශ පෙන්වීමට - ලකුණු 02 යි.

**(03 + 02 = ලකුණු 05 යි.)**

06.

I. කණිෂ්ක රජතුමා
පාර්ශ්ව තෙරුන් හෝ අශ්වඝෝෂ, වසුමිත්‍ර, පූර්ණයසස් යන නම් වලින් එකක් දක්වා තිබේ නම් ලකුණු දෙකකි.

**(ලකුණු 02 යි.)**

II. විනය විභාෂා
උපදේශ ශාස්ත්‍ර
මහා විභාෂා යනුයි. මේ ගැන කෙටියෙන් දක්වා තිබිය යුතු වේ.

**(ලකුණු 03 යි.)**

III. i. භික්ෂූන් වහන්සේ නිකායාන්තර වශයෙන් බෙදී වෙන් වී සිටීම.

ii. බුදුරදුන්ගේ ධර්මය ස්වකීය අදහස් අනුව ඒ ඒ භික්ෂු කණ්ඩායම් විසින් අර්ථකථනය කරනු ලැබීම.

iii. ධර්මයට හා විනයට ස්වකීය අදහස් එක්කොට ධර්මය හා විනය ලෙස සලකා ක්‍රියා කිරීම.

iv. අධර්මය, අවිනය නිර්මල ධර්ම විනයට එක්වී තිබීමෙන් බුද්ධ වචනය දූෂණය වී තිබීම.

v. අලජ්ජි පුද්ගල භික්ෂූන්ගේ දසවස්තුව පිළිගත් භික්ෂු පිරිස් ඒවා අනුගමනය කරමින් කැළැල් ඇති කිරීම.

**මේ ආදී කරුණු 03 ක් දක්වා තිබීම ප්‍රමාණවත් වේ.**

මූලික සංකල්ප :

දසභූමික සංකල්පය, පාරමිතා සංකල්පය, ත්‍රිකාය සංකල්පය, බෝධිසත්ව සංකල්පය, බෝධි චිත්ත සංකල්පය ආදියයි.

**මෙයින් සංකල්ප දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.**

- **හේතු දැක්වීමට - ලකුණු 03 යි.**
- **සංකල්ප දැක්වීමට - ලකුණු 02 යි.**

**(03 + 02 = ලකුණු 05 යි.)**

07.

I. ශාස්වතවාදය හා උච්ඡේදවාදය

**(ලකුණු 02 යි.)**

II. යෙ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතො ආහ

තෙසංච යො නිරෝධො - එවං වාදී මහාසමණො

තේරුම - යම් හේතුවකින් උපදින ධර්මයක් වෙත් ද, ඒ හේතුව තථාගතයන් වහන්සේ දේශනා කළහ. ඒවායේ යම් නිරෝධයක් වේද එය ද වදාළහ. මහා ශ්‍රමණ තෙමේ මෙබඳු වාද ඇත්තේය.

- **දේශනාවට - ලකුණු 02 යි.**
- **තේරුම දැක්වීමට - ලකුණු 01 යි.**

**(02 + 01 = ලකුණු 03 යි.)**

අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා මරණ යන එකිනෙක බැඳුණු හේතුප්‍රත්‍යාංග අනුව විවරණය කොට තිබිය යුතු වේ.

**(ලකුණු 05 යි.)**

**සමස්තයක් සේ සලකා ලකුණු දෙන්න.**